# පඩි පාලක සභා ආඥා පනත

කර්මාන්තවල සේවයේ නියුක්තව සිටින්නන්ගේ පඩි සහ වෙනත් පාරිශ්‍රමික විධිමත් කිරීම සඳහා ද පඩිපාලක සභා පිහිටුවීම හා සංස්ථාපනය කිරීම සඳහා ද ඉහත කී කරුණුවලට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ වෙනත් කාර්ය සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ ආඥාපනතකි.

ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලත් දිනය : 1941 ජූලි මස 31 දින.

ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනය: 1941 සැප්තැම්බර් මස 19 වන දින.

## පටුන

1. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වූ දිනය: 1941 අංක 27 දරන පඩි පාලක සභා ආඥාපනත.

(136 වැනි අධිකාරය -
1956 ප්‍රතිශෝධනය)

## I වන කොටස

## සියලුම කර්මාන්තවලට අදාළ විධිවිධාන

2. පඩි ගෙවීම.

3. පඩි වාර්තා.

3අ. පසළොස්වක පෝය දිනය නිවාඩු දීම.

3ආ. පසළොස්වක පෝය දිනයේ සේවයේ නියුක්ත කරවීම.

3ඇ. පඩි පිළිබඳ විස්තර කම්කරුවා වෙත හෝ ඔහුගේ වෘත්තීය සමිතිය වෙත හෝ සැපයිය යුතු බව.

3ඈ. ඇතැම් අවස්ථාවල හිඟ පඩි අය කර ගැනීම.

4. 1 වන කොටසේ යම් විධිවිධානයක් පිළිපැදීම පැහැර හැරීමට දඬුවම්.

5. 2 වන වගන්තියෙහි ආ ඡේදයෙහි සහ 3 වන වගන්තියේ විධිවිධාන වලංගු කාලය.

## II වන කොටස

## විශේෂ කර්මාන්ත පිළිබඳ විධිවිධාන

විශේෂ කර්මාන්ත සම්බන්ධයෙන් ආඥාපනතේ II වන කොටස
අදාළ කිරීම.

6. විශේෂ කර්මාන්තවලට II වන කොටස අදාළ කිරීම.

7. II වන කොටස අදාළ කිරීමේ අදහස දැක්වීම.

Labour Department of Sri Lanka

## පඩි පාලක සභා

8. පඩි පාලක සභා පිහිටුවීම.

9. පඩි පාලක සභාවක සංයුතිය.

10. පඩි පාලක සභාවක සභාපති සහ ලේකම්.

11. පඩි පාලක සභා රැස්වීම්වල කාර්ය පරිපාටිය.

12. පඩි පාලක සභාවෙහි සාමාජිකයෙකුගේ ධූර කාලය.

13. නියෝග.

14. උචිත පඩි පාලක සභාව කවරක් ද යන්න පිළිබඳ සැකයක් ඇති අවස්ථාවලදී ඒ ප්‍රශ්න විසඳීම.

15. අමාත්‍යවරයා විසින් හෝ කොමසාරිස්වරයා විසින් හෝ පඩි පාලක සභාවකට කරුණු යොමු කිරීම.

16. විභාග පැවැත්වීමට පඩි පාලක සභාවට ඇති බලය.

17. පඩි පාලක සභා ඉදිරියේ වූ නීති කෘත්‍යවලදී දෙන ලද තොරතුරු ඇතැම් අවස්ථාවලදී රහස්‍ය ලෙස සැලකිය යුතු බව.

## දිස්ත්‍රික් පඩි පාලක කාරක සභා

18. දිස්ත්‍රික් පඩි පාලක කාරක සභා.

19. පඩි පාලක සභාවක් විසින් දිස්ත්‍රික් පඩි පාලක කාරක සභාවකට කරුණු යොමු කිරීම.

## පඩි පාලක සභාවල තීරණ

20. අවම පඩි අනුප්‍රමාණය.

21. අවම පඩි ගෙවීමට සේවායෝජකයා බැඳී සිටින බව.

22. සාමාන්‍ය වැඩ කරන දවසකට අඩු කාලයක් වැඩ කරන නැතහොත් යම් දවසක කිසි වැඩක් නොකරන කම්කරුවකුගේ පඩිය.

23. පඩි ගෙවිය යුත්තේ කවර කාල සීමාවකට වරක් ද යන වග.

24. වැඩ කළ යුතු පැය ගණන සහ සතිපතා නිවාඩුව.

25. වාර්ෂික නිවාඩු.

26. නිවාඩු දිනවල කාර්ය සඳහා සේවය ගණන් බැලීම.

27. විශේෂ අවස්ථාවන්ට සුදුසු පරිදි වෙනස් පඩි ක්‍රම ආදිය නියම කිරීම.

28. අදහස් කරන තීරණ පඩි පාලක සභාව විසින් ප්‍රසිද්ධ කිරීම.

29. පඩි පාලක සභාවල තීරණ සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගන්නා පිළිවෙල.

Labour Department of Sri Lanka

30. පඩි පාලක සභාවක තීරණයන් අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම.

31. පඩි පාලක සභාවල තීරණ පිළිබඳ සාක්ෂි.

32. මෙම ආඥාපනත හැර වෙනත් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද පඩි පාලක සභාවක තීරණ බලපැවැත්විය යුතු බව.

## සාමාන්‍ය අවම කාලානුකූල ගෙවීම් ප්‍රමාණයක් කොමසාරිස්වරයා විසින් නිශ්චය කිරීම

33. ඇතැම් අවස්ථාවලදී, සාමාන්‍ය අවම කාලානුකූල ගෙවීම් ප්‍රමාණයක් කම්කරු කොමසාරිස්වරයා විසින් නිශ්චය කිරීම.

34. අහෝසි කරන ලද හෝ බලය අඩුකරන ලද පඩි පාලක සභාවල තීරණ.

## විශේෂ අවස්ථා පිළිබඳ විධිවිධාන

35. වැඩ දෙවර්ගයක් හෝ වැඩි ගණනක් කරන කම්කරුවා.

36. කෑලි වැඩෙහි යෙදෙන කම්කරුවා.

37. වැඩ ලබා ගැනීම සඳහා සේවායෝජකයන්ගේ ස්ථානයේ රැඳී සිටින කම්කරුවෝ.

38. කර්මාන්තයක් වශයෙන් ඇති කර ගන්නා ලද වැඩපිළිවෙලක් අනුව කරන වැඩ.

39. කාය ශක්තියෙන් පිරිහුණු කම්කරුවා.

40. ආධුනිකයන් හෝ පුහුණුවන්නන්.

## සේවායෝජකයින්ගේ කාර්ය

41. ලේඛන තැබීම සේවායෝජකයාගේ කාර්යය බව.

42. සේවායෝජකයන් විසින් දැන්වීම් ප්‍රදර්ශනය කිරීම.

43. පිටත වැඩ ලබා දෙන අය විසින් ලේඛන පොතක් තැබිය යුතු බව.

43අ. සේවායෝජකයන් විසින් වෙනත් වාර්තා තැබීම.

## වැරදි

44. පඩි ගෙවීම පැහැර හැරීම ආදිය සම්බන්ධයෙන් දණ්ඩනය.

45. ආසන්නම සේවායෝජකයා වෙනත් අයකු යටතේ සේවය කරන්නෙකු වීම.

Labour Department of Sri Lanka

45අ. උප කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලැබූ කම්කරුවකුට ලැබිය යුතු පඩි පිළිබඳව කොන්ත්‍රාත්කරුගේ වගකීම.

46. මෙම ආඥාපනත යටතේ කම්කරුවන්ට ලැබිය යුතු මුදල් අය කර ගැනීම.

47. ඔප්පු කිරීමේ භාරය.

48. සේවායෝජකයා විසින් කරන වැරදි.

49. කම්කරුවකු පඩි පාලක සභාවක සාමාජිකයකු වීම ආදී කරුණු නිසා කම්කරුවකු අස් කිරීම.

50. 40 වන වගන්තිය කඩකොට ගාස්තුව ලබා ගැනීම.

51. 47 වන වගන්තියේ (2) වන උප වගන්තිය කඩකොට තොරතුරු එළිදරව් කිරීම.

## III වන කොටස

### සාමාන්‍ය

### නිලධරයන් පත්කිරීම සහ ඔවුන්ගේ බලතල ආදිය

52. නිලධරයන් පත්කිරීම.

53. තමා වෙනුවට වැඩ කිරීම සඳහා වෙනත් නිලධාරියෙකුට කොමසාරිස්වරයා විසින් බලය පැවරීම.

54. වාර්තා ආදිය කැඳවීමට කොමසාරිස්වරයාට ඇති බලය.

55. නියමිත නිලධරයන්ගේ බලතල.

56. කම්කරුවකුට ලැබිය යුතු මුදලක් නඩුවක් මගින් අයකර ගැනීමට කම්කරු කොමසාරිස්වරයා හෝ ලියාපදිංචි කළ වෘත්තීය සමිතියක් සතු බලය.

57. පඩි මුදල් කර්මාන්තයක වත්කමෙහි ප්‍රථම වැය බරක් විය යුතු බව.

57අ. සේවය පිළිබඳ සහතිකය.

### වැරදි

58. වැරදි.

### විවිධ කරුණු

59. සේවායෝජකයාගේ නියෝජිතයාගේ වගකීම.

59අ. කර්මාන්තයක් සඳහා හෝ යම් වාණිජ්‍ය කාර්යයක් සඳහා ඇති කරගත් වැඩ පිළිවෙලක් යටතේ, වැඩ කිරීම සඳහා, තැනැත්තන් සේවයෙහි යොදවනු ලබන අවස්ථාවලට අදාළ විශේෂ විධිවිධාන.

Labour Department of Sri Lanka

60. කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව මිස සහ වරද සිදුකිරීමෙන් අවුරුදු හයක් ඇතුළත මිස, නඩු පැවරිය නොහැකි බව.

61. වරද විභාග කළ යුතු අධිකරණය.

62. මෙම ආඥාපනත යටතේ ඇතිවන අයිතිවාසිකම් හෝ වගකීම් ගිවිසුම්වලට යටත් නොවන බව.

## නියෝග

63. නියෝග.

## අර්ථ නිරූපණය

64. අර්ථ නිරූපණය.

## ආඥාපනතේ බලපෑම

65. වෙනත් ලිඛිත නීතියක් සමග ගැටෙන අවස්ථාවන්හි මෙම ආඥාපනත බලපැවැත්විය යුතු බව.

Labour Department of Sri Lanka

# 136 වන අධිකාරය

# පඩි පාලක සභා

කර්මාන්තවල සේවයේ නියුක්තව සිටින්නන්ගේ පඩි සහ වෙනත් වේතන විධිමත් කිරීම සඳහා ද, පඩි පාලක සභා පිහිටුවීම හා සංස්ථාපනය කිරීම සඳහා ද ඉහත කී කරුණුවලට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ වෙනත් කාර්ය සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ ආඥා පනතකි.

ආඥා පනත්
1941 අංක 27
1943 අංක 40
1945 අංක 19
1945 අංක 22

පනත්
1953 අංක 5
1957 අංක 27
1962 අංක 27
1966 අංක 23
1966 අංක 24
1978 අංක 10
1980 අංක 10
1982 අංක 36
2019 අංක 14

(1941 සැප්තැම්බර් 19 වන දින දීය)

1. මේ ආඥාපනත පඩි පාලක සභා ආඥාපනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

## 1 වන කොටස
## සියලුම කර්මාන්තවලට අදාල විධිවිධාන

2. යම් කර්මාන්තයක සේවයේ නියුක්ත කරනු ලැබූ කම්කරුවන් ගේ සෑම සේවායෝජකයෙකු විසින්, ඒ සෑම කම්කරුවකුට ම පඩි ගෙවීම සම්බන්ධයෙන් මේ වගන්තියේ පහත සඳහන් විධිවිධාන පිළිපැදිය යුතු ය. පඩි ගෙවීම් 8

එනම් :-

(අ) මෙහි මින් මතු දැක්වෙන විධිවිධානවලට යටත්ව සේවායෝජක විසින්, ඒ පඩිය, කම්කරුවාගේ කැමැත්ත ඇතිව කරන ලද, මෙහි පහත අර්ථකථනය කර ඇති පරිදි වූ, බලය දෙන ලද අඩු කිරීමක් හැර, වෙනත් කිසිම අඩු කිරීමක් නොමැතිව, නීත්‍යානුකූල මුදලින්, කම්කරුවාට කෙළින් ම ගෙවිය යුතුය:

එසේ වුව ද යම් එක් වතාවකදී එසේ අඩු කරනු ලබන මුදලේ එකතුව -

(i) මේ ඡේදයේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයක් මගින් නිශ්චය කරනු ලබන කර්මාන්තයක යෙදී සිටින කම්කරුවකු සම්බන්ධව



Labour Department of Sri Lanka

වන විට, ගෙවිය යුතු පඩියෙන් සියයට හැත්තෑ පහක් නොඉක්මවිය යුතු ය;

තවද

(ii) වෙනත් කර්මාන්තයක යෙදී සිටින කම්කරුවකු සම්බන්ධයෙන් වන විට, ගෙවිය යුතු පඩියෙන් සියයට පණහක් නොඉක්මවිය යුතු ය.

එසේත් වුවද මේ ඡේදයෙහි ඉහත සඳහන් විධිවිධාන කිසිවක් -

(i) පඩියෙන් අඩු කර ගැනීම සඳහා ආදායම් බදු ආඥා පනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් බලය දෙන ලද අඩු කිරීමකට ; හෝ

(ii) යම්කිසි අධිකරණයක් විසින් නිකුත් කරන ලද හෝ සාදන ලද ආඥාවක් අධිකරණ නියෝගයක් හෝ තීන්දු ප්‍රකාශයක් ප්‍රකාර හෝ ඒ යමක් පිළිපැදීම් වශයෙන් හෝ ඔහුගේ සම්පූර්ණ පඩිය හෝ කොටසක් හෝ තබා ගැනීමකට

බල නොපෑ යුතු අතර, එසේ බලපාන්නක් සේ නොසැලකිය යුතුය.

කම්කරුවකුට පඩිය ගෙවීමෙන් ඉක්බිතිව ම එකී පඩියෙන් සේවායෝජකයාහට හෝ ඔහුගේ නියෝජිතයකුට කම්කරුවා විසින් කරන ලද යම්කිසි ගෙවීමක්, පඩියෙන් කරන ලද අඩුකිරීමක් ලෙස සැලකිය යුතු ය.

1957 අංක 27
2 වන වගන්තිය

මේ ඡේදයේ “ බලය ලත් අඩු කිරීමක් ” යන්නෙන්, නියම කරනු ලැබිය හැකි ආකාරයට, සහ නියම කරනු ලැබිය හැකි කොන්දේසි කිසිවක් ඇතොත් ඒ කොන්දේසිවලට යටත් ව පහත දැක්වෙන කරුණු; එනම් :-

(i) සේවායෝජකයා විසින් කම්කරුවාට ගෙවන ලද අත්තිකාරම් මුදලක්;

(ii) සේවායෝජකයා විසින් කම්කරුවාට ගෙවනු ලබන පඩියෙන් සේවායෝජකයා හෝ ඔහුගේ නියෝජිතයෙකු හෝ නොවන වෙනත් තැනැත්තෙකුට කම්කරුවාගේ යම් බැඳීමක් ඉටු කිරීම පිණිස හෝ වෙනත් කාර්යයක් සඳහා හෝ කම්කරුවාගේ වුවමනාව පරිදි කරනු ලබන ගෙවීමක්; හෝ

(iii) වෙනත් නියමිත කරුණක්,

සම්බන්ධයෙන් කරන ලද අඩු කිරීමක් අදහස් වේ.



Labour Department of Sri Lanka

(ආ) තමා විසින් සේවයේ නියුක්ත කරන ලද එක් එක් කම්කරුවා සම්බන්ධයෙන් එක් මසකට වැඩි නොවන පඩි කාලසීමාවක් 5වන වගන්තියේ (i) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, ඔහු විසින් නියම කළ යුතුය. තවද ඒ කාල සීමාව සඳහා ඒ කම්කරුවාට

(i) ඒ කාල සීමාව එක් සතියක් නොඉක්මවන අවස්ථාවක, එකී කාල සීමාව ඉකුත් ව දින තුනක් ඇතුළත; හෝ

(ii) ඒ කාලසීමාව සතියක් ඉක්මවන එහෙත් සති දෙකක් නොඉක්මවන අවස්ථාවක එකී කාල සීමාව ඉකුත් ව දින පහක් ඇතුළත; හෝ

(iii) ඒ කාල සීමාව සති දෙකක් ඉක්මවන අවස්ථාවක එකී කාල සීමාව ඉකුත් ව දින දහයක් ඇතුළත පඩිය ගෙවිය යුතුය.

එසේ වුව ද, යම්කිසි කම්කරුවකුගේ නොපැමිණීම නිසා හෝ අන්කිසි නොවැළැක්විය හැකි හේතුවක් නිසා හෝ ඔහුගේ පඩිය මේ ඡේදයෙන් නියමිත කාල සීමා ඇතුළත ගෙවිය නොහැකි වන අවස්ථාවක, ඒ පඩිය සේවා යෝජකයා විසින් තමා ළඟ තබා ගත හැකි අතර ඉන් පසුව හැකිතාක් ඉක්මණින් එය ඒ කම්කරුවාට ගෙවිය යුතුය.

යම්කිසි ගිවිසුමක් අවසන් කිරීමට, මේ ආඥාපනත හැර වෙනත් ලිඛිත නීතියක විධිවිධාන යටතේ අවශ්‍ය කල් දීමේ හෝ අනතුරු හැඟවීමේ කාලසීමාව කෙරෙහි, මේ ඡේදයේ වූ කිසිවක් කවර ආකාරයකින් හෝ බල නොපාන්නේ ය.

(ඇ) යම්කිසි දිනක ඔහු කම්කරුවකුගේ සේවය අවසන් කළහොත් හෝ යම් කම්කරුවකු ඔහු යටතේ සේවය නීත්‍යානුකූලව අවසන් කළහොත් හෝ එකී කම්කරුවාට ලැබිය යුතු පඩිය එම දිනයෙන් පසු වැඩ කරන දෙවන දිනය ඉකුත්වීමට පෙර ඔහු විසින් ගෙවිය යුතුය. (1957 අංක 27 2(ආ) වගන්තිය)

3. (i) යම්කිසි කර්මාන්තයක කම්කරුවන් සේවයෙහි යොදන සේවායෝජකයකු විසින්, එම කර්මාන්තය පවත්වාගෙන යන පරිශ්‍රයෙහි එම කම්කරුවන්ගේ එක් එක් පඩි කාලය සම්බන්ධව මෙහි පහත පෙනෙන කරුණු නිශ්චය කොට දැක්වෙන (මෙහි මින් මතු ''පඩි වාර්තාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) පැහැදිලි නිවැරදි ලිඛිත වාර්තාවක්, 5 වැනි වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව තබාගෙන පවත්වා ගත යුතුය:- පඩි වාර්තා (1957 අංක 27 3 වන වගන්තිය)

Labour Department of Sri Lanka

(අ) පඩි කාලය,

(ආ) එම පඩි කාලය සම්බන්ධයෙන් පඩි ගෙවනු ලබන කම්කරුවන්ගේ නම්,

(ඇ) එම පඩි කාලය ඇතුළත ඒ එක් එක් කම්කරුවා විසින් වැඩ කරන ලද පැය හෝ දින ගණන, (1957 අංක 27 3 වන වගන්තිය)

(ඈ) එම පඩි කාලය සඳහා ඒ එක් එක් කම්කරුවාට ගෙවන ලද පඩි,

(ඉ) එම පඩි ගෙවන ලද දින, සහ

(ඊ) එකී පඩිවලින් කරන ලද අඩුකිරීම්, සහ

(උ) නියම කරනු ලැබිය හැකි වෙනත් කරුණු පිළිබඳ විස්තර.

(1962 අංක 27 2 වන වගන්තිය)

(1957 අංක 57 3 වන වගන්තිය)

(2) සේවායෝජකයකු වශයෙන් (i) වන උපවගන්තිය යටතේ යම් පඩි කාලයක් සම්බන්ධයෙන් පඩි වාර්තාවක් තබා ගන්නා හෝ තබාගෙන සිටින සෑම තැනැත්තකු ම ඒ පඩි කාලයේ අවසාන දිනයෙන් ආරම්භ වන අවුරුදු හතරක කාලයක් ඒ වාර්තාව සුරක්ෂිතව තබා ගත යුතුය. තව ද, කම්කරු කොමසාරිස්වරයා විසින් හෝ යම් නියමිත නිලධරයකු විසින් හෝ නියම කරනු ලැබූ විට, පරීක්ෂා කර බැලීම සඳහා ඒ වාර්තාව ඉදිරිපත් කොට, ඒ වාර්තාවේ හෝ ඒ වාර්තාවේ යම් කොටසක් හෝ සැබෑ පිටපතකින් සැපයිය යුතුය. නැතහොත් එබඳු පිටපතක් සකස් කිරීමට ඉඩ දිය යුතුය.

1971 අංක1 දරන නිවාඩු නියෝග පසළොස්වක පෝය දිනය නිවාඩු දීම.

3අ. කවර හෝ කර්මාන්තයක කම්කරුවන් සේවයේ නියුක්ත කරන සේවා යෝජකයකු විසින් ඒ කම්කරුවන්ට සෑම පසළොස්වක පෝය දිනකම නිවාඩු දිනයක් දිය යුතුය. එසේ වුවද සතියේ නිවාඩු දිනය පසළොස්වක පෝය දිනට යෙදුනු අවස්ථාවක, කම්කරුවන්ට සතියේ අතිරේක නිවාඩු දිනයක් ප්‍රදානය නොකළ යුතුය.

පසළොස්වක පෝය දිනයේ සේවයේ නියුක්ත කරවීම.

3ආ. 3අ වගන්තියේ කුමක් සඳහන්ව තිබුණද කවර හෝ කර්මාන්තයක කම්කරුවන් සේවයේ නියුක්ත කරන සේවායෝජකයකු විසින්, සාමාන්‍ය සේවා නියුක්ති කාලය තුළ, පසළොස්වක පෝය දිනයකදී කම්කරුවකු ඔහුගේ සාමාන්‍ය දෛනික පඩි ප්‍රමාණය මෙන් එකහමාරකට අඩු නොවන පඩියක් ගෙවිය යුතුය යන කොන්දේසියට යටත්ව, සේවයේ නියුක්ත කළ හැකිය.

පඩි පිළිබඳ විස්තර කම්කරුවා වෙත හෝ ඔහුගේ වෘත්තීය සමිතිය වෙත හෝ සැපයිය යුතු බව.

3ඇ. 3 වන වගන්තිය යටතේ පඩි වාර්තාවක් පවත්වාගෙන යන හෝ පවත්වා ගෙන ගොස් ඇති සෑම සේවායෝජකයකු විසින් ම, කම්කරුවකු විසින් හෝ ඔහු අයිති වෘත්තීය සමිතිය විසින් හෝ කරනු ලබන යම් ඉල්ලීමක් මත ඒ කම්කරුවාට ගෙවන ලද පඩි පිළිබඳ සියලු විස්තර නියමිත ආකෘතියේ සැපයීම හෝ සපයනු ලැබීමට සැලැස්වීම හෝ කළ යුතු ය.

ඇතැම් අවස්ථාවල හිඟ පඩි අය කර ගැනීම.

3ඈ. (1) යම් කර්මාන්තයක යම් කම්කරුවකුගේ සේවායෝජකයකු විසින් 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ තබා ගැනීමට නියමිත පඩි වාර්තාව

Labour Department of Sri Lanka

පවත්වා ගෙන යාම හා, එම කර්මාන්තය කරගෙන යන ස්ථානයේ එය තබා ගැනීම පැහැර හැර ඇති හෝ එම වාර්තාව පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස එම වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ නියම කරනු ලැබූ විට, එසේ ඉදිරිපත් කිරීම පැහැර හරින හෝ අවස්ථාවක, මේ ආඥාපනත යටතේ එම කම්කරුවාට අවස්ථාවෝචිත පරිදි, ගෙවිය යුතු පඩි හෝ අඩුවෙන් ගෙවන ලද පඩි තමාට ලැබී ඇති වාචික හා ලේඛනමය යන දෙවර්ගයේ ම සියලුම සාක්ෂි මත තක්සේරු කිරීමට කොමසාරිස්වරයාට මෙයින් බලය පවරනු ලබන අතර එවැනි යම් පඩි ගෙවීමෙහි ලා පැහැර හැරීමක් කර ඇති අවස්ථාවක (2) වන උපවගන්තියේ විධිවිධාන අදාළ වන්නේය.

(2) (1) වන උප වගන්තිය යටතේ සේවායෝජකයකු ගෙවීමට යටත් වන්නේ යම් මුදලක් ද ඒ මුදල ගෙවීම ඔහු විසින් පැහැර හරින හා මේ ආඥාපනතේ වෙනත් යම් විධිවිධාන යටතේ ඒ මුදල අය කර ගැනීම කළ නොහැකි බව සහ යෝග්‍ය නොවන බව කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින් එසේ ලැබිය යුතු මුදල පිළිබඳ විස්තර සහ ගෙවීම පැහැර හරින සේවායෝජකයාගේ නම හා ඔහු පදිංචි ස්ථානය ද දැක්වෙන සහතිකයක්, ඒ ස්ථානය පිහිටා තිබෙන කොට්ඨාශය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත නිකුත් කරනු ලැබිය හැකි ය. ලැබිය යුතු මුදල අයකර ගැනීම සඳහා වැඩිදුර නඩු කටයුතු ඔහුට විරුද්ධව පවත්වාගෙන යනු නොලැබිය යුත්තේ කුමක් නිසාදැයි හේතු දැක්වීම පිණිස එවිට මහෙස්ත්‍රාත්වරයා විසින් එම සේවායෝජකයා තමා ඉදිරියට කැඳවිය යුතු අතර සෑහෙන හේතු දැක්වීම පැහැර හරිනු ලැබූ විට, ඒ මුදල ඒ සේවායෝජකයාට ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දඩයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව එය අය කරනු ලැබිය යුතුය. එසේ අයකරගනු ලැබූ සෑම මුදලක් ම කොමසාරිස්වරයාට ගෙවිය යුතුය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයක වූ යම් ප්‍රකාශයක නිරවද්‍යතාවය මේ වගන්තිය යටතේ වූ යම් නඩු කටයුතුවල දී අධිකරණය විසින් ප්‍රශ්න කිරීම හෝ පරීක්ෂා කිරීම හෝ නොකළ යුතුය. තවද ඒ අනුව, ඒ සහතිකයේ වූ යම් ප්‍රකාශයක, නිරවද්‍යතාව සලකා බැලීම හෝ තීරණය කිරීම පිණිස මේ වගන්තියේ ඇති කිසිවකින් අධිකරණයට බලය දෙනු නොලැබිය යුතු අතර ගෙවීම පැහැර හැරි සේවායෝජකයාගෙන් (1) වන උපවගන්තිය යටතේ අය විය යුතු මුදල් ප්‍රමාණය විධිමත් ලෙස ගණන් බලන ලද බවට සහ ඒ මුදල් ප්‍රමාණය ගෙවීම පැහැර හැර ඇති බවට කොමසාරිස්වරයාගේ සහතිකය ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය.

1 වන කොටසේ යම් විධිවිධානයක් පිළිපැදීම පැහැර හැරීමට දඬුවම්

(2019 අංක 14, 2 (1) වන වගන්තිය)

4. (1) මේ කෙටසේ මෙම වගන්තියේ විධිවිධානවලට එකඟව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන යම් සේවා යෝජකයකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී ඒ තැනැත්තා රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දසදහසක් නොඉක්මවන දඩ මුදලකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් කම්කරුවකු සම්බන්ධයෙන් සේවායෝජකයකු වරදකට වරදකරු කරනු ලැබූ විටක, අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව -

(1982 අංක 36 3 වන වගන්තිය)

(අ) කම්කරුවකුට නිසි ලෙස ගෙවිය යුතුව තිබූ මුදල ඒ කම්කරුවාට නොගෙවන ලද අවස්ථාවක, අධිකරණය විසින් දැන ගනු ලබන ඒ මුදල හා ඇත්ත වශයෙන් ගෙවන ලද මුදල අතර ඇති වෙනසට සමාන මුදල සහ (2අ) උපවගන්තියේ සඳහන් අධිභාරය; හෝ

(ආ) ඒ කම්කරුවාට ලැබිය යුතු පඩිවලට සමාන මුදල සහ (2අ) උපවගන්තියෙහි සඳහන් අධිභාරය ගෙවීමට සේවා යෝජකයාට අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකිය. මේ උපවගන්තිය යටතේ ගෙවීමට ආඥා කරන ලද යම් මුදලක් දඩයක් අයකර ගනු ලබන ආකාරයෙන් ම අයකර ගනු ලැබිය හැකිය.

(2අ) (2) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි සඳහන් යම් මුදලක් මත ගෙවිය යුතු අධිභාරය පහත දැක්වෙන පරිදි ගණන් බැලිය යුතුය :-

(අ) ඒ මුදල මාස එකක් ඉක්මවන එහෙත් මාස තුනක් නොඉක්මවන කාලයකට හිඟව ඇති අවස්ථාවක, ඒ මුදලෙන් සියයට විස්සක අධිභාරයක්;

(ආ) ඒ මුදල මාස තුනක් ඉක්මවන එහෙත් මාස හයක් නොඉක්මවන කාලයකට හිඟව ඇති අවස්ථාවක, ඒ මුදලෙන් සියයට තිහක අධිභාරයක්;

(ඇ) ඒ මුදල මාස හයක් ඉක්මවන එහෙත් මාස දොළහක් නොඉක්මවන කාලයකට හිඟව ඇති අවස්ථාවක, ඒ මුදලෙන් සියයට හතළිහක අධිභාරයක්;

(ඈ) ඒ මුදල මාස දොළහක් ඉක්මවන කාලයකට හිඟව ඇති අවස්ථාවක, ඒ මුදලෙන් සියයට පනහක අධිභාරයක්; (2019 අංක 14, 2 (2) (අ) වන වගන්තිය)

(ඉ) ඒ මුදල මාස විසිහතරක් ඉක්මවන කාලයක් සඳහා හිඟව ඇති අවස්ථාවක, ඉන්පසු සෑම එක් එක් මාස දොළහක කාලයක් සඳහා ම ඒ මුදලෙන් සියයට දහයක අධිභාරයක්. (2019 අංක 14, 2 (2) (ආ) වන වගන්තිය)

(3) යම් මුදල් ප්‍රමාණයක් ගෙවීම සඳහා (2) වන උපවගන්තිය යටතේ ආඥාවක් කිරීමට අධිකරණයට ඇති බලය නිසා ඒ මුදල අන් කිසි නීති කෘත්‍යයක මාර්ගයෙන් අය කර ගැනීමට කම්කරුවා සතු යම් අයිතිවාසිකමක බලහීන නොවන්නේය.

2 වන වගන්තියේ ආ ඡේදයෙහි සහ 3 වන වගන්තියේ විධිවිධාන වලංගු කාලය.

5. (1) 23 වන වගන්තිය යටතේ පඩිපාලක සභාවක් විසින් කරනු ලැබූ තීරණයක් යම්කිසි කර්මාන්තයක් පිළිබඳව බලාත්මක වන දිනයෙහි පටන්, ඒ යම් තීරණයකට අනනුකාලවන හෝ පටහැනි වන තාක් දුරට, ඒ කර්මාන්තය



Labour Department of Sri Lanka

සම්බන්ධයෙන් 2වන වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන වල බලපෑම නතර වන්නේ ය.

(2) යම්කිසි කර්මාන්තයක් සඳහා 41 වන වගන්තිය යටතේ වූ ලේඛනය සඳහා ආකෘතියක් නියම කරනු ලැබූ දිනයේ පටන් ඒ කර්මාන්තය සම්බන්ධයෙන් 3 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීම නතර වන්නේ ය.

## II වන කොටස

## විශේෂ කර්මාන්ත පිළිබඳ විධිවිධාන

### විශේෂ කර්මාන්ත සම්බන්ධයෙන් ආඥා පනතේ II වන කොටස අදාළ කිරීම

විශේෂ කර්මාන්ත වලට II වන කොටස අදාළ කිරීම.

6. (1) 7 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ආමාත්‍යවරයා විසින් ලිඛිත නියමයක් මගින් ඒ නියමයේ නිශ්චිතව සඳහන් කවර හෝ කර්මාන්තයකට මේ ආඥා පනතේ මේ කොටසේ විධිවිධාන අදාළ කළ හැකිය.

මේ උප වගන්තියේ ඉහතින් වූ විධිවිධාන මගින් පවරන ලද බලයට, කලින් කරන ලද නියමයක නිශ්චය කොට දක්වන ලද යම්කිසි කර්මාන්තයක විස්තරයක් කවර හෝ ආකාරයකින් වෙනස් කිරීම සඳහා කලින් කල සංශෝධන නියමයක් කිරීමේ බලය ද ඇතුළත් වන්නාක් සේ සැලකිය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම නියමයක් ම ගැසට් පත්‍රයෙහි නිවේදනයක් පළ කිරීමෙන් ප්‍රසිද්ධ කළ යුතු ය. ඒ නියමය එය ප්‍රසිද්ධ කරනු ලැබූ දිනයෙහි සිට හෝ ඒ නිවේදනයෙහි නියම කරනු ලබන පසු දිනයක සිට හෝ බලාත්මක වන්නේය.

II වන කොටස අදාළ කිරීමේ අදහස දැක්වීම

7. (1) 6 වන වගන්තිය යටතේ නියමයක් කිරීමට අදහස් කර සිටින බව දන්වන නිවේදනයක්, එසේ අදහස් කර තිබෙන නියමයට විරුද්ධව අමාත්‍යවරයා විසින් විරුද්ධතා භාරගන්නා දිනය නැතහොත් කවර දිනයකට ප්‍රථම විරුද්ධතා භාරගනු ලැබේ ද යන වගට දැන්වීමක් ද සමග ගැසට් පත්‍රයේ ද, යටත් පිරිසෙයින් සිංහල ප්‍රවෘත්ති පත්‍රයක, දෙමළ ප්‍රවෘත්ති පත්‍රයක හා ඉංග්‍රීසි ප්‍රවෘත්ති පත්රයක ද ප්‍රසිද්ධ කරනු ලැබුවහොත්, මිස, 6 වන වගන්තිය යටතේ කිසිම නියමයක් අමාත්‍යවරයා විසින් කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් හේතු කොට ගෙන ඉදිරිපත් කරන සෑම විරුද්ධතාවක් ම ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතු ය; තවද එසේ අදහස් කර තිබෙන නියමයට විරුද්ධ වන්නේ කුමන කරුණු මත දැයි දැක්වෙන ප්‍රකාශයක් ද එහි ඇතුළත් විය යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද දැන්වීමක් හේතු කොට ගෙන ඉදිරිපත් කරනු ලබන සියලු ම විරුද්ධතා අමාත්‍යවරයා විසින් සැලකිල්ලට

Labour Department of Sri Lanka

භාජන කළ යුතුය. තව ද එවැනි විරුද්ධතාවක් විමර්ශනය කිරීම සඳහා තමාට අවශ්‍ය යයි හැඟෙන විභාගයක් අමාත්‍යවරයා විසින් පවත්වනු ලැබිය හැකිය.

## පඩි පාලක සභා

පඩි පාලක සභා පිහිටුවීම

8. (1) ගැසට් පත්‍රයෙහි නියමයක් පළකිරීමෙන් අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කටයුතු කළ හැකි ය :- එනම්

(අ) 6 වන වගන්තිය යටතේ මේ ආඥාපනතේ විධිවිධාන අදාළ කරන ලද යම් කර්මාන්තයක් හෝ එවැනි කර්මාන්තයක යම් ශාඛාවක් හෝ එවැනි කර්මාන්තයක යම් කර්තව්‍යයක් නැතහොත් ක්‍රියාවලියක් හෝ සඳහා පඩිපාලක සභාවක් පිහිටුවිය හැකිය.

(ආ) යම්කිසි කර්මාන්තයක් සඳහා එසේ පිහිටුවන ලද යම් පඩි පාලක සභාවක මේ ආඥාපනත යටතේ වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය එම විධිවිධාන එසේ අදාළ කරනු ලැබූ වෙනත් කර්මාන්තයකට ද ව්‍යාප්ත විය යුතු බව ප්‍රකාශ කළ හැකිය.

(2) එවැනි නියමයක් කිරීමට අදහස් කර සිටින බව දන්වන නිවේදනයක් හා එසේ යෝජිත නියමයට විරුද්ධව අමාත්‍යවරයා විසින් විරුද්ධතා භාර ගන්නා දිනය නැතහොත් කවර දිනයකට ප්‍රථම විරුද්ධතා භාරගනු ලැබේ ද යන වගත් ගැසට් පත්‍රයේ ද, යටත් පිරිසෙයින් සිංහල ප්‍රවෘත්ති පත්‍රයක, දෙමළ ප්‍රවෘත්ති පත්‍රයක හා ඉංග්‍රීසි ප්‍රවෘත්ති පත්‍රයක ද ප්‍රසිද්ධ කර ඇත්නම් මිස (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කිසිම නියමයක් අමාත්‍යවරයා විසින් කරනු නොලැබිය යුතුය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් හේතු කොට ගෙන ඉදිරිපත් කරන විරුද්ධතා, ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතුය. තවද යෝජනා කර තිබෙන නියමයන්ට විරුද්ධ වන්නේ කුමන කරුණු මතදැයි දැක්වෙන ප්‍රකාශයක් ද එහි ඇතුළත් විය යුතුය.

(4) (2) වන උපවගන්තිය යටතේ කරන ලද දැන්වීමක් හේතු කොට ගෙන ඉදිරිපත් කරනු ලබන සියලුම විරුද්ධතා අමාත්‍යවරයා විසින් සැලකිල්ලට භාජන කළ යුතුය; තවද එවැනි විරුද්ධතාවක් විමර්ශනය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි තමාට හැඟෙන විභාගයක් ද අමාත්‍යවරයා විසින් පවත්වනු ලැබිය හැකිය.

(5) යම් කර්මාන්තයක් සඳහා පඩි පාලක සභාවක් පිහිටුවීමෙන් පසු එකී කර්මාන්තය පිළිබඳ විස්තරය 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයකින් යම් දිනක සිට වෙනස් කරන ලද අවස්ථාවක, එකී සභාව එසේ වෙනස් කරන ලද විස්තරය ඇති කර්මාන්තය සඳහා එදින සිට යථා පරිදි පිහිටුවන ලද පඩි පාලක සභාවක් ලෙස, සැලකිය යුතු ය.

9. (1) (7) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, සෑම පඩිපාලක සභාවක් ම කොමසාරිස්වරයාගෙන් ද, එම සභාව පිහිටුවනු ලැබුවේ යම් කර්මාන්තයක් සඳහා ද ඒ කර්මාන්තයේ යෙදී සිටින සේවායෝජකයන් වෙනුවෙන් පෙනී සිටින සාමාජිකයන්ගෙන් ද ඒ කර්මාන්තයෙහි යෙදී සිටින

පඩි පාලක සභාවක සංයුතිය.

Labour Department of Sri Lanka

කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටින සාමාජිකයින්ගෙන් ද නම් කරන ලද සාමාජිකයන්ගෙන් ද සමන්විත විය යුතුය.

(2) පඩි පාලක සභාවක සිටිය යුතු නියෝජිත සාමාජිකයන්ගේ ගණන අමාත්‍යවරයා විසින් නියම කළ යුතුය. ඒ ගණනින් දෙකෙන් කොටසක් සේවායෝජකයන්ගේ නියෝජිතයන් ද දෙකෙන් කොටසක් කම්කරුවන්ගේ නියෝජිතයන් ද විය යුතු ය. පඩි පාලක සභාවක සියලු ම නියෝජිත සාමාජිකයින් අමාත්‍යවරයා විසින් පත් කළ යුතුය.

(3) යම්කිසි පඩි පාලක සභාවක බලතල, කාර්ය හා කර්තව්‍ය 8 වන වගන්තිය යටතේ ව්‍යාප්ත කරනු ලැබූ අවස්ථාවක සේවායෝජකයින් සහ කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටීම සඳහා අතිරේක නියෝජිත සාමාජිකයින් සමාන ගණනක් අමාත්‍යවරයා විසින් පත් කළ හැකිය.

(4) යම් කර්මාන්තයක් සඳහා පිහිටුවනු ලැබූ පඩි පාලක සභාවකට, ඒ කර්මාන්තයේ සේවායෝජකයෙකු හෝ කම්කරුවෙකු හෝ නොවූ කවර තැනැත්තෙකු වුව ද, එම සභාවේ නියෝජිත සාමාජිකයෙකු වශයෙන් පත් කළ හැකිය :

එසේ වුව ද,

(අ) නියෝජිත සාමාජිකයෙකු වශයෙන් පත් කිරීමට අදහස් කර ඇති තැනැත්තා, වෘත්තීය සමිතියක, සංගමයක හෝ වෙනත් සංවිධානයක සාමාජිකයන් වූ සේවායෝජකයන් හෝ කම්කරුවන් හෝ වෙනුවෙන් පෙනී සිටීමට නම්, එකී වෘත්තීය සමිතිය හෝ සංගමය හෝ සංවිධානය හෝ විසින් අනුමත කරනු ලැබූවෙකු විය යුතුය.

(ආ) එවැනි වෘත්තීය සමිතියක, සංගමයක හෝ සංවිධානයක අනුමැතිය පිට නියෝජිත සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබූ තැනැත්තා ඒ වෘත්තීය සමිතියෙහි හෝ සංගමයෙහි හෝ සංවිධානයෙහි හෝ තවදුරටත් සාමාජිකයෙකු නොවන බවට නැතහොත් එකී සමිතියේ, සංගමයේ හෝ සංවිධානයේ විශ්වාසය තවදුරටත් නොදරන බවට, අවශ්‍ය විභාගයක් පැවැත්වීමෙන් පසු අමාත්‍යවරයා සෑහීමකට පත් වුවහොත්, එකී සමිතියේ, සංගමයේ හෝ සංවිධානයේ ඉල්ලීම පිට අමාත්‍යවරයා විසින් ඔහු එකී ධූරයෙන් ඉවත් කළ හැකිය.

(5) පඩි පාලක සභාවල සාමාජිකයින් මෙන් පත් කරනු ලැබීමට පුරුෂයින් මෙන්ම ස්ත්‍රීහු ද සුදුසු වන්නාහ.

(6) යම් තැනැත්තෙකුට පඩි පාලක සභා එකකට වැඩි ගණනක් සාමාජිකයෙකු විය හැකිය.

(7) පඩි පාලක සභාවක නම් කළ සාමාජික ධූර සඳහා, තුන් දෙනෙකුට වැඩි නොවන, සුදුසු යයි තමා සලකන සංඛ්‍යාවක් අමාත්‍යවරයා විසින් පත් කළ හැකිය.

Labour Department of Sri Lanka

කර්මාන්තයක් සඳහා පිහිටුවනු ලැබූ පඩි පාලක සභාවකට, ඒ කර්මාන්තයෙහි සේවා යෝජකයෙකු හෝ කම්කරුවකු හෝ වූ තැනැත්තෙකු නම් කළ සාමාජිකයෙකු වශයෙන් පත් නොකළ යුතුය.

(8) අසනීපයක් නිසා හෝ අමාත්‍යවරයා විසින් සාධාරණ යැයි සලකා වෙනත් හේතුවක් නිසා හෝ පඩි පාලක සභාවෙහි සාමාජිකයෙකුට සභාවේ රැස්වීම්වලට පැමිණ සිටීමට නොහැකි වේ නම් ඒ සාමාජිකයා නොපැමිණ සිටින කාලය තුළ සාමාජිකයෙකු වශයෙන් ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තෙකු අමාත්‍යවරයා විසින් පත් කළ හැකිය.

පඩිපාලක සභාවක සභාපති සහ ලේකම්

10. (1) කම්කරු කොමසාරිස්වරයා, සෑම පඩිපාලක සභාවකට සභාපති වන්නේ ය. තවද, ඔහු විසින් සෑම පඩිපාලක සභා රැස්වීමක ම මූලාසනය ඉසිලිය යුතුය:

1948.02.05 දින අංක 9828 දරන ගැසට් පත්‍රය.

එසේ වුවද, පඩි පාලක සභාවක රැස්වීමක දී හෝ එහි රැස්වීමේ කටයුතු කිරීමේ දී යම්කිසි අවස්ථාවක හෝ කම්කරු කොමසාරිස්වරයා නොමැති නම්, නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයකුට හෝ සහකාර කම්කරු කොමසාරිස්වරයකුට හෝ ඔහු ඒ සභාවේ සාමාජිකයෙකු නුවූව ද, කම්කරු කොමසාරිස්වරයා වෙනුවෙන් ඒ රැස්වීමේ මූලාසනය ඉසිලිය හැකි ය.

(2) පඩි පාලක සභාවක යම් රැස්වීමක මූලාසනය දරන නිලධරයාට, එය ඉදිරියෙහි ඇති කිසිම ප්‍රශ්නයක් පිළිබඳව ඡන්දය දීමට හිමිකමක් නැත්තේ ය.

(3) සෑම පඩි පාලක සභාවක ම ලේකම්වරයෙකු හෝ සම ලේකම්වරු දෙදෙනෙකු හෝ සිටිය යුතු අතර උප ලේකම්වරයකු ද සිටිය හැකි ය.

පඩි පාලක සභා රැස්වීම් වල කාර්ය පරිපාටිය

11. (1) පඩි පාලක සභාවක ගණපූරණය සඳහා පහත දැක්වෙන තැනැත්තන් පැමිණ සිටිය යුතු ය :-

(අ) කම්කරු කොමසාරිස්වරයා හෝ නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයෙක් හෝ සහකාර කම්කරු කොමසාරිස්වරයෙක් ;

(ආ) නියෝජිත සාමාජිකයන් සිව්දෙනෙක්; ඔවුන් අතුරෙන් දෙදෙනෙකුට සේවායෝජක නියෝජිතයන් සහ දෙදෙනෙකු කම්කරු නියෝජිතයන් විය යුතුය; සහ (1980 අංක 10 2 වන වගන්තිය)

(ඇ) නම් කරනු ලැබූ එක් සාමාජිකයෙක්.

(2) පඩි පාලක සභාවක යම්කිසි රැස්වීමක් පැවැත්වීම සඳහා පැමිණ සිටින සාමාජික සංඛ්‍යාවෙන් සේවායෝජකයන් වෙනුවෙන් පෙනී සිටින සාමාජික සංඛ්‍යාව, කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටින සාමාජික සංඛ්‍යාවට වඩා වැඩි නම් නැතහොත් අඩු නම්, ඒ රැස්වීමේදී ඡන්දය දීමට හිමිකම් ඇති සේවායෝජක නියෝජිත සාමාජික සංඛ්‍යාව සහ කම්කරු නියෝජිත සාමාජික සංඛ්‍යාව එක සමාන වනු පිණිස, එකී රැස්වීමෙහි වැඩි සාමාජික සංඛ්‍යාවක් සිටින්නේ සේවායෝජකයන් නියෝජනය කිරීමට නම් නැතහොත් කම්කරුවන් නියෝජනය

Labour Department of Sri Lanka

කිරීමට නම්, එසේ බහුතරයක්ම සිටින සාමාජිකයන් විසින්, රැස්වීම ආරම්භ වීමට ප්‍රථම තමන් අතුරෙන් ඡන්දය දීමෙන් වැළකී සිටින සාමාජිකයා හෝ සාමාජිකයන් හෝ තෝරා ගත යුතුය.

එසේ වුවද බහුතර නියෝජිත සාමාජිකයන්ට ඔවුනතුරෙන් ඡන්දය දීමෙන් වැළකිය යුත්තේ කවර සාමාජිකයා ද යන්න ගැන එකඟවීමට නුපුළුවන් වූ අවස්ථාවක සභාපතිවරයා ඉදිරිපිට, ඔහුගේ විධානය පරිදි කුසපත් ඇද, එකී රැස්වීමෙහිදී ඡන්දය දීමෙන් වැළකී සිටිය යුතු සාමාජිකයා හෝ සාමාජිකයන්, තෝරා ගත යුතුය.

(3) පඩිපාලක සභාවක යම් කිසි රැස්වීමක දී ඡන්දය දීමෙන් වැළකී සිටීමට (2) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර තෝරාගනු ලැබූ පඩි පාලක සභාවක නියෝජිත සාමාජිකයෙකුට ඒ රැස්වීමේදී ඡන්දය දීමට හිමිකම නොමැති නමුත් එකී රැස්වීමෙහි සිටීමට සහ එහි සාකච්ඡාවලට සහභාගී වීමට හිමිකම ඇත්තේය.

එසේ වුව ද, එකී රැස්වීම පවත්වා ගෙන යන අතර යම්කිසි අවස්ථාවක දී සාමාජිකයන් වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් සේවායෝජකයන් වෙනුවෙන් පෙනී සිටින සාමාජික සංඛ්‍යාව කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටින සාමාජික සංඛ්‍යාවට සමාන වී නම්, ඉහත කී නියෝජිත සාමාජිකයාට ඡන්දය දීමට හිමිකම ඇත්තේය.

(4) මේ ආඥා පනත යටතේ පඩි පාලක සභාවක් විසින් කරනු ලැබීමට බලය ඇති හෝ නියමිත සෑම තීරණයක්ම, එකී සභාවක රැස්වීමකදී පැමිණ සිටින හා ඡන්දය දීමට හිමිකම් ඇති සාමාජිකයන්ගේ බහුතර කැමැත්ත පරිදි විය යුතු ය. හුදෙක් ක්‍රියා විධිවල විධි විරෝධතාවක් නිසා හෝ එහි වරදක් නිසා හෝ තීරණයක් කිරීමට පළමුව කළයුතු යයි මේ ආඥාපනතින් නියමිත යම් කිසිවක් හෝ නොකිරීම නිසා හෝ පමණක් පඩි පාලක සභාවක කිසිම තීරණයක් බලරහිත නොවන්නේය.

(5) පඩි පාලක සභාවක සාමාජික සංඛ්‍යාවෙහි පුරප්පාඩුවක් නිසා හෝ සාමාජිකයෙකු පත් කිරීමේ දෝෂයක් නිසා හෝ එම සභාව විසින් කරනු ලබන නීති කෘත්‍යයක් බල රහිත බවට පත් නොවන්නේය.

(6) මේ ආඥාපනතේ සහ යම් කිසි නියෝගයක විධිවිධානවලට ද යටත් ව, පඩි පාලක සභාවකට සිය කාර්යය පරිපාටිය විධිමත් කර ගත හැකිය.

පඩි පාලක සභාවෙහි සාමාජිකයෙකුගේ ධුර කාලය

12. (1) පඩි පාලක සභාවක සෑම සාමාජිකයෙක් ම ඔහුගේ පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලයක් තම ධූරය දරන්නේය:

එසේ වුව ද, කම්කරු කොමසාරිස්වරයා හැර වෙනත් යම් සාමාජිකයෙකුට, සභාවෙහි තමාගේ සාමාජිකත්වයෙන් කවර වේලාවක වුව ද ඉල්ලා අස්විය හැකිය. නැතහොත් අමාත්‍යවරයා විසින් කවර වේලාවක වුව ද ඉවත් කරනු ලැබිය හැකිය; එසේ වුවත්,

Labour Department of Sri Lanka

(අ) මියගිය හෝ එකී සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වූ හෝ එම ධූරයෙන් ඉවත් කරනු ලැබූ හෝ සාමාජිකයෙකු වෙනුවට පඩි පාලක සභාවක පත් කරනු ලැබූ සාමාජිකයෙක්, ඉහතින් කී සාමාජිකයාගේ ධූර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කොටස හා සමාන කාලසීමාවක් තුළ එකී ධූරය දරන්නේය.

(ආ) සාමාජිකයෙකු නොපැමිණීම නිසා ඒ කාලය තුළ වැඩ බැලීමට පත් කරනු ලැබූ තැනැත්තෙක් එකී සාමාජිකයා නොපැමිණ සිටින කාලසීමාව තුළ ධූරය දරන්නේය.

(ඇ) පඩි පාලක සභාවක අතිරේක සාමාජිකයෙකු වශයෙන් පත්කරනු ලැබූ තැනැත්තෙක් සභාවෙහි අනෙකුත් ස්ථිර සාමාජිකයන්ගේ ධූර කාලය ඉකුත් වන තෙක් ධූරය දරන්නේය.

(2) පඩි පාලක සභාවක අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණි, එකී පඩි පාලක සභාවෙහි (කම්කරු කොමසාරිස්වරයා හැර) සාමාජිකයකු තමාට ඒ එක් එක් රැස්වීමට පැමිණීමට නොහැකි වූයේ සාධාරණ හේතු නිසා බවට, ඉහත කී රැස්වීම්වලින් අවසාන රැස්වීමේ දින සිට පසළොස්වන දිනට පෙර අමාත්‍යවරයා සෑහීමට පත් කළහොත් මිස, ඔහු එකී පසළොස්වන දිනයේ දී ඒ සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වූ සේ සලකනු ලැබිය යුතුය.

මේ උපවගන්තියේ කාර්ය සඳහා "රැස්වීම" යන්නට ගණපූර්ණයක් නොමැතිවීම නිසා පවත්වනු නොලැබූ රැස්වීමක් ද ඇතුළත් වෙයි.

(3) පඩිපාලක සභාවක සාමාජිකයකුව සිටීම අවසාන වූ යම් තැනැත්තෙක් නැවත එම සභාවට පත් කර ගැනීමට සුදුසු වන්නේ ය.

නියෝග.

13. (1) මේ ආඥාපනතෙහි යම් විධිවිධානයකට අනුකූල නොවන නියෝග, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන්, එනම් :-

(අ) සේවායෝජකයන්ගේ හා කම්කරුවන්ගේ නියෝජිත සාමාජිකයන් තෝරා ගන්නා ආකාරය, (එනම් ඡන්දය විමසීමෙන් ද නැතහොත් අන් ක්‍රමයකින් ද යන්න ) නියම කිරීම;

(ආ) පඩි පාලක සභාවක රැස්වීම් කැඳවීමේ හා පැවැත්වීමේ ආකාරය හා ඒ රැස්වීමක දී ඡන්දය දීමේ පිළිවෙල ඇතුළත් ව අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටිය නියම කිරීම;

(ඇ) පඩි පාලක සභාවක සාමාජිකත්වයෙහි ඇති වන පුරප්පාඩු පිරවීමේ ක්‍රමය නියම කිරීම: හා

(ඈ) පොදුවේ පඩි පාලක සභාවක් සම්බන්ධ වූ කරුණක් සඳහා හෝ ඒ කරුණක් පිළිබඳ ව හෝ මේ ආඥාපනත යටතේ පඩිපාලක සභාවක යම්කිසි බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම:



Labour Department of Sri Lanka

යන කරුණු සම්බන්ධයෙන් සාදනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද නියෝගයක්, ඒ උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි, සියලු ම පඩි පාලක සභාවලට හෝ විශේෂ පංතියක පඩි පාලක සභාවලට හෝ නිශ්චිත පඩි පාලක සභා එකකට නැතහොත් ඊට වැඩි ගණනකට හෝ අදාළ වන්නේ ය.

උචිත පඩි පාලක සභාව කවරක් ද යන්න පිළිබඳ සැකයක් ඇති අවස්ථාවලදී ඒ ප්‍රශ්න විසඳීම.

14. යම් කාරණයක දී මේ ආඥාපනත යටතේ පඩිපාලක සභාවක බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටුකිරීමට හිමිකම ඇත්තේ හෝ නියමිතව ඇත්තේ පඩි පාලක සභා දෙකකින් හෝ වැඩි ගණනකින් කවර පඩි පාලක සභාවකට ද යන්න ගැන සැකයක් ඇති වුවහොත් හෝ ප්‍රශ්නයක් පැන නැගුනහොත් එම ප්‍රශ්නය කම්කරු කොමසාරිස්වරයා විසින් විසඳිය යුතු අතර ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය.

අමාත්‍යවරයා විසින් හෝ කොමසාරිස්වරයා විසින් හෝ පඩි පාලක සභාවකට කරුණු යොමු කිරීම.

15. යම්කිසි කර්මාන්තයක තත්ත්වය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් හෝ කම්කරු කොමසාරිස්වරයා විසින් හෝ යොමු කරන ලද, කරුණක්, ඒ කර්මාන්තය සඳහා පිහිටුවන ලද පඩි පාලක සභාව විසින් සලකා බලා වාර්තාවක් සැපයිය යුතුය.

විභාග පැවැත්වීමට පඩි පාලක සභාවට ඇති බලය.

16. (1) පඩි පාලක සභාවකට මේ ආඥාපනත යටතේ තීරණයක් දීමට බලය දෙන ලද නැතහොත් වාර්තාවක් සැපයීමට නියම කරන ලද යම්කිසි කරුණක් පිළිබඳව තීරණයක් දීමේ කාර්යය සඳහා හෝ වාර්තාවක් සැපයීමේ කාර්යය සඳහා හෝ අවශ්‍ය යයි සභාව සලකන විභාගයක් පැවැත්වීම පඩි පාලක සභාවක් විසින් කළ හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ විභාගයක් පැවැත්වීමේ කාර්යය සඳහා කවර හෝ තැනැත්තෙකුගේ පැමිණීම බල කරනු සඳහා ද, දිවුරුම් පිට ඒ තැනැත්තකුගේ සාක්ෂි විභාග කරනු සඳහා ද, අදාළ කවර හෝ ලේඛනයක් ඉදිරිපත් කිරීම බල කරවීම සඳහා ද දිසා අධිකරණයට ඇති බලතල හා සමාන බලතල පඩි පාලක සභාවක සභාපතිවරයෙකුට ඇත්තේය. තවද එකී කටයුතු සම්බන්ධයෙන් සිවිල් අධිකරණයකට ඇති බලතල පිළිබඳව සිවිල් නඩු විධාන සංග්‍රහයෙහි විධිවිධාන ඒ අනුව අදාළ වන්නේ ය.

(3) යම් තොරතුරක් හෝ ලේඛනයක් යම් තැනැත්තකු විසින් හෙළිදරව් කිරීම හෝ ඉදිරිපත් කිරීම මේ ආඥාපනත නොවන වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ හෝ තහනම් කර ඇති අවස්ථාවක, ඒ තොරතුර හෙළිදරව් කිරීමට හෝ ලේඛනය ඉදිරිපත් කිරීමට මේ වගන්තියේ මීට ඉහතින් ඇති විධිවිධානවල ඇතුළත් කිසිවකින් ඒ තැනැත්තාට නියම කෙරෙන්නාක් සේ හෝ අවසර ලැබෙන්නාක් සේ හෝ නොසැලකිය යුතුය.

පඩි පාලක සභා ඉදිරියේ වූ නීති කෘත්‍යවලදී දෙන ලද තොරතුරු ඇතැම් අවස්ථාවලදී රහස්‍ය ලෙස සැලකිය යුතු බව.

17. (1) 16 වන වගන්තිය යටතේ පඩි පාලක සභාවක් විසින් පැවැත් වූ විභාගයක දී හෝ මේ ආඥාපනත යටතේ පඩි පාලක සභාවක් ඉදිරියේ පැවැත්වූ වෙනත් නීති කෘත්‍යයක දී හෝ යම් තැනැත්තකු විසින් තොරතුරක් සපයනු ලබන

Labour Department of Sri Lanka

හෝ ලේඛනයක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, තොරතුර හෝ ලේඛනය හෝ ඒ ලේඛනයෙහි ඇතුළත් දේ හෝ රහස්‍ය වශයෙන් තබා ගත යුතු යයි ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ ඉල්ලීමක් කළහොත්, එම තොරතුර හෝ ලේඛනය රහස්‍ය ලෙස සැලකිය යුතුයයි පඩිපාලක සභාවේ සභාපතිවරයා විසින් නියම කළ යුතු ය.

(2) පඩි පාලක සභාවක සාමාජිකයකු විසින් හෝ පඩි පාලක සභාවක් ඉදිරියට පැමිණි නැතහොත් පඩි පාලක සභාවක නීති කෘත්‍යයකට සම්බන්ධ වූ වෙනත් තැනැත්තකු විසින් හෝ (1) වන උපවගන්තිය යටතේ නියමයකින් තහනම් කරන ලද තොරතුරක් හෝ ලේඛනයක් නැතහොත් ඒ ලේඛනයක ඇතුළත් දෙයක්, එකී නියමය කරන ලෙස ඉල්ලා සිටි පාර්ශ්වයේ කැමැත්ත ලියවිල්ලකින් ලබා නොගෙන කිසිම ආකාරයකින් එළිදරව් නොකළ යුතුය.

## දිස්ත්‍රික් පඩි පාලක කාරක සභා

දිස්ත්‍රික් පඩි පාලක කාරක සභා

18. (1) යම්කිසි කර්මාන්තයක් සඳහා පිහිටුවන ලද පඩි පාලක සභාවක් විසින් අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව සහ නියෝගවලට අනුකූලව ලංකාවේ කවර ප්‍රදේශයකට හෝ දිස්ත්‍රික්කයකට හෝ ඒ කර්මාන්තය සඳහා දිස්ත්‍රික් පඩි පාලක කාරක සභාවක් පිහිටුවිය හැකි ය.

(2) සෑම දිස්ත්‍රික් පඩි පාලක කාරක සභාවක් ම පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය. එනම් :-

(අ) එම පඩි පාලක සභාවේ සාමාජිකයන් අතුරෙන් එම පඩි පාලක සභාව විසින් තීරණය කරනු ලබන සංඛ්‍යාවක්; එහෙත් එම සංඛ්‍යාව නියම කළ යුත්තේ සේවායෝජකයින් වෙනුවෙන් හා කම්කරුවන් වෙනුවෙන් සිටින සාමාජික සංඛ්‍යාව සමාන වන පරිද්දෙනි;

(ආ) ඒ පඩි පාලක කාරක සභාව පිහිටුවන ප්‍රදේශයේ සේවායෝජකයින් වෙනුවෙන් පෙනී සිටීමට එකී පඩි පාලක සභාව විසින් නියම කළ හැකි සාමාජික සංඛ්‍යාවක් හා ඒ ප්‍රදේශයේ කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටීමට ඒ සමාන සාමාජික සංඛ්‍යාවක්; හා

(ඇ) කොමසාරිස්වරයා හෝ ඔහු නැති විටක නියෝජ්‍ය කොමසාරිස්වරයා හෝ ඒ දෙදෙනාම නැති විටක කොමසාරිස්වරයා විසින් පොදුවේ හෝ විශේෂයෙන් ලියවිල්ලකින් බලය දෙන ලද (එම පඩි පාලක සභාවේ සාමාජිකයෙකු නොවන) වෙනත් යම් තැනැත්තෙක්;

(3) දිස්ත්‍රික් පඩි පාලක කාරක සභාවක සියලු රැස්වීම් වලදී ම, කොමසාරිස්වරයා විසින් හෝ ඔහු නොපැමිණි විටක නියෝජ්‍ය කොමසාරිස්වරයා විසින් හෝ ඒ දෙදෙනාම නොපැමිණි විටක (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය



Labour Department of Sri Lanka

යටතේ කොමසාරිස්වරයා විසින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් හෝ මූලාසනය ඉසිලිය යුතුය.

(4) දිස්ත්‍රික් පඩි පාලක කාරක සභාවක සාමාජික සංඛ්‍යාවේ පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් හෝ යම්කිසි සාමාජිකයෙකු පත් කිරීමේ දෝෂයක් නිසා හෝ එම කාරක සභාව විසින් කරනු ලබන නීති කෘත්‍යයක් බලරහිත නොවන්නේ ය.

(5) දිස්ත්‍රික් පඩි පාලක කාරක සභාවල සාමාජිකයින්ගේ ධූර කාලය සම්බන්ධව ද, ඒ කාරක සභාවල සාමාජික ධූරවල පුරප්පාඩු පිරවීම සම්බන්ධව ද, ඒ කාරක සභාවල රැස්වීම්වලදී අනුගමනය කළ යුතු කාර්යය පරිපාටිය සම්බන්ධව ද, ඒ කාරක සභා විසින් සපයනු ලබන වාර්තා පිළියෙල කළ යුතු ආකාරය සහ ඒවා සැපයිය යුතු ආකාරය සම්බන්ධව ද, නියෝග සාදනු ලැබිය හැකිය. එහෙත්, මේ ආඥාපනතෙහි සහ ඒ නියෝගවල විධිවිධාන වලට ද, යටත්ව දිස්ත්‍රික් පඩි පාලක කාරක සභාවක් විසින් සිය කාර්ය විධානය විධිමත් කර ගත හැකිය.

19. තීරණයක් කිරීමට මේ ආඥාපනතින් පඩි පාලක සභාවකට බලය දෙන ලද හෝ නියම කරන ලද යම්කිසි කරුණක්, එම පඩි පාලක සභාව විසින් පිහිටුවන ලද දිස්ත්‍රික් පඩි පාලක කාරක සභාවකට යොමු කිරීම එම පඩිපාලක සභාව විසින් කළ හැකිය. එවිට එසේ යොමු කරන ලද කරුණු එම කාරක සභාව විසින් සැලකිල්ලට භාජන කොට ඒ කරුණ සම්බන්ධයෙන් සිය වාර්තාව පඩි පාලක සභාව වෙත සැපයිය යුතු ය.

පඩි පාලක සභාවක් විසින් දිස්ත්‍රික් පඩි පාලක කාරක සභාවකට කරුණු යොමු කිරීම.

## පඩි පාලක සභාවල තීරණ

20. (1) යම් කර්මාන්තයක් සඳහා පිහිටුවනු ලැබූ සෑම පඩි පාලක සභාවක් විසින් ම එකී කර්මාන්තය සඳහා (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව (මෙහි " අවම සාමාන්‍ය ගෙවීම් ප්‍රමාණය" යනුවෙන් සඳහන් කරනු ලබන) කාලය අනුව කරන වැඩ සඳහා අවම පඩි ප්‍රමාණයක් නිශ්චය කළ යුතුය. එසේම පහත සඳහන් පඩි ප්‍රමාණ සියල්ලම හෝ ඉන් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පඩි පාලක සභාව විසින් නිශ්චය කළ හැකි ය.

අවම පඩි ප්‍රමාණය

(අ) (මෙහි මින් මතු " සාමාන්‍ය අවම කෑලි ගණනට ගෙවීම් ප්‍රමාණය" යනුවෙන් සඳහන් කරනු ලබන) කරන වැඩ ප්‍රමාණය අනුව කරනු ලබන වැඩට අවම පඩි ප්‍රමාණයක්,

(ආ) කොටස් වැඩෙක යෙදී සිටින කම්කරුවන්ට කාල-වැඩ පදනම මත අවම පාරිශ්‍රමික ප්‍රමාණයක් ලැබීම සහතික කරනු සඳහා ඔවුන්ට අදාළ වනු පිණිස (මෙහි මින් මතු "සහතික කල කාලානුකූල ගෙවීම් ප්‍රමාණය" යනුවෙන් සඳහන් කරනු ලබන) අවම කාල ප්‍රමාණයක්,

(ඇ) කම්කරුවන් විසින් කරනු ලබන අතිකාල වැඩ සම්බන්ධයෙන් අදාල වන (මෙහි මින් මතු "අතිකාල ගෙවීම් ප්‍රමාණය" යනුවෙන් සඳහන් කරනු ලබන) අවම පඩි ප්‍රමාණය වෙනුවට ආදේශකයන්



Labour Department of Sri Lanka

වශයෙන් අදාළ විය යුතු (කාල ප්‍රමාණයක් වුවද කෑලි ගණනේ ගෙවීම් ප්‍රමාණය අනුව වුවද) අවම පඩි ප්‍රමාණය.

(2) (අ) යම්කිසි කර්මාන්තයක් සඳහා (1) වන උපවගන්තිය යටතේ පඩිපාලක සභාවක තීරණයකින් නියම කරනු ලැබූ අවම පඩි ප්‍රමාණයන් පහත දැක්වෙන කරුණු වලින් සමන්විත විය හැකිය:-

(i) මූලික පඩි ප්‍රමාණයක්, සහ

(ii) එකී කර්මාන්තයේ කම්කරුවන්ට අදාල වන ජීවන වියදම් අංකයේ වෙනස්වීම් වලට හැකි පමණ ගැලපෙන පරිදි පඩි පාලක සභාවෙහි එවැනි තීරණයකින් නියම කරනු ලැබිය හැකි, යම් කාලයකට වරක් සහ එසේ ම නියම කරනු ලැබිය හැකි ආකාරයකට සකස් කරනු ලබන ප්‍රමාණයක් අනුව වූ විශේෂ දීමනාවක්; එසේ වුව ද විශේෂ දීමනාව එසේ සකස් කිරීමක් ක්‍රියාත්මක විය යුත්තේ ජීවන වියදම් අංකයේ කිනම් අවම වෙනස්වීමක් මතදැයි, විශේෂ දීමනා ප්‍රමාණය නියම කරන පඩි පාලක සභා තීරණයෙහි ම පඩි පාලක සභාව විසින් නියම කළ හැකිය.

(ආ) පඩි පාලක සභාව විසින් සිය තීරණයෙන් දෙනු ලබන විධිවිධාන වලට අනුකූලව, කොමසාරිස්වරයා විසින් (අ) ඡේදයෙහි සඳහන් විශේෂ දීමනාව, නියමිත කාලයකට වරක් ගණන් බැලිය යුතු බව, අවම පඩි ප්‍රමාණය නියම කරන තීරණයකින් ම පඩි පාලක සභාව විසින් නියම කළ හැකි ය. සෑම අවස්ථාවකදී ම එකී විධාන අනුව කොමසාරිස්වරයා ඒ විශේෂ දීමනාව ගණන් බැලිය යුතු අතර ඒ විධානවල නියමිත කාලයකට වරක් බැගින් ඒ දීමනාව ගැසට් පත්‍රයේ නිවේදනයක් පළ කිරීමෙන් ප්‍රසිද්ධ කළ යුතුය.

(ඇ) යම්කිසි කර්මාන්තයකට යම් කාලයක අදාළ අවම පඩි ප්‍රමාණය (අ) ඡේදයේ (i) අනුඡේදයේ සඳහන් මූලික පඩි ප්‍රමාණය සහ එවකට බලපවත්නා (අ) ඡේදයේ (ii) අනුඡේදයේ සඳහන් විශේෂ දීමනාව යන දෙකෙහි එකතුව හෝ (ආ) ඡේදය යටතේ කොමසාරිස්වරයා විසින් එවැනි දීමනාවක් නිවේදනය කර ඇති අවස්ථාවක ඉහත කී මූලික පඩි ප්‍රමාණයෙහි සහ එවකට බලපවත්නා එසේ නිවේදනය කරනු ලැබූ විශේෂ දීමනාවෙහි එකතුව හෝ විය යුතුය.

(ඇ) මේ උපවගන්තියේ -

"නිසි බලධරයා" යන්නෙන්, ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නිවේදනයක නිශ්චිතව සඳහන් කර්මාන්තයෙහි සේවයේ නියුක්ත කම්කරුවන්ට අදාළ කළ යුතු ජීවන වියදම් අංකය කලින් කල නිශ්චය කිරීම පිණිස, ඉහත සඳහන්

Labour Department of Sri Lanka

නිවේදනයෙන් ම අමාත්‍යවරයා විසින් පත්කරන ලද බලධරයා අදහස් වේ.

යම්කිසි කර්මාන්තයක කම්කරුවන් සම්බන්ධයෙන් වූ විට "ජීවන වියදම් අංකය" යන්නෙන් එකී කර්මාන්තයට අදාළ කළ යුතු ජීවන වියදම් අංකය වශයෙන් බලධරයා විසින් විනිශ්වය කොට ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කිරීමෙන් ප්‍රකාශ කරනු ලැබූ අංකය අදහස් වේ.

(3) පඩි පාලක සභාවක් පිහිටුවන ලද දින සිට එක් අවුරුද්දක් වූ කාලසීමාවක් ඉකුත්වීමට පෙර (1) වන උපවගන්තියෙන් නියම කර ඇති පරිදි, සාමාන්‍ය අවම කාල අනුප්‍රමාණයක් නිශ්වය කිරීමට ඒ සභාවට නොහැකි වන කවර හෝ අවස්ථාවක, සභාව විසින් ඒ බව අමාත්‍යවරයා වෙත වාර්තා කළ යුතු ය. සාමාන්‍ය අවම කාල අනුප්‍රමාණයක් නිශ්වය කිරීමට නොහැකි වන්නේ යම් අවස්ථාවක් සම්බන්ධයෙන් ද ඒ අවස්ථාව සම්බන්ධයෙන් වන තාක් දුරට අමාත්‍යවරයා විසින් ඒ අනුප්‍රමාණය නිශ්වය කිරීමෙන් එම සභාව නිදහස් කරමින් 33 වන වගන්තිය යටතේ නියමයක් කළ හැකි ය." (1978 අංක 10, 4 වන වගන්තිය.)

අවම පඩි ගෙවීමට සේවායෝජකයා බැඳී සිටින බව.

21. යම්කිසි කර්මාන්තයකට අවම පඩි ප්‍රමාණයක් නියම කරන ලද පඩි පාලක සභා තීරණයක් බලාත්මක වූ කල්හි, සෑම සේවායෝජකයෙකු ම එම අවම පඩි ප්‍රමාණය අදාළ වන සෑම කම්කරුවකුට ම එම අවම පඩි ප්‍රමාණයට අඩු නොවන ගෙවීම් ප්‍රමාණයක් අනුව පඩි ගෙවිය යුතු ය.

එසේ වුව ද, එවැනි තීරණයක්, යම් සේවායෝජකයෙකු සම්බන්ධයෙන් බලාත්මක වන දිනය, එකී සේවායෝජකයා විසින් පඩි ගෙවිය යුතු පඩි කාලයක් ආරම්භ වන දිනයට අනුරූප නොවේ නම්, එම තීරණයෙන් නියම කරන ලද පඩි ප්‍රමාණය, එකී සේවායෝජකයා සම්බන්ධයෙන් ඉහත කී දිනයට පසුව පැමිණෙන ඊළඟ පඩි කාලය ආරම්භයේ සිට වලංගු වන්නේ ය.

සාමාන්‍ය වැඩ කරන දවසකට අඩු කාලයක් වැඩ කරන නැතහොත් යම් දවසක කිසි වැඩක් නොකරන කම්කරුවකුගේ පඩිය.

(1957 අංක 27, 5 වන වගන්තිය)

22. (1) පඩි පාලක සභාවක් පිහිටුවනු ලැබ ඇති යම් කර්මාන්තයක සේවයේ නියුක්ත, එකී සභාව විසින් නියම කර ඇති පරිදි පැය ගණන හෝ දින ගණන අනුව ගණන් බැලීමෙන් පඩි ගෙවනු ලබන, කම්කරුවකු වැඩ කළ යුතු (නිවාඩු දිනයන් ද ඇතුළු) යම් දිනයක, සාමාන්‍ය වැඩ කරන දිනයක් සම්පූර්ණ වීම සඳහා වැඩ කළ යුතු පැය ගණනට අඩු පැය ගණනක් වැඩ කළ අවස්ථාවක දී ඔහුට සාමාන්‍ය වැඩ කරන දිනයකට නියමිත ප්‍රමාණය වැඩ කිරීමට නොහැකි වූයේ ඔහුට කිරීමට වැඩක් සැපයීමට සේවායෝජකයාට නොහැකි වීම නිසා නොව වැඩ කිරීමට ඔහුගේ ඇති අකමැත්ත හෝ සභාව විසින් නිශ්වය කරනු ලබන වෙනත් අවස්ථාගත කරුණු හෝ නිසා නම් මිස, ඔහු සම්පූර්ණ සාමාන්‍ය වැඩ කරන දිනයක් වැඩ කළ ලෙස සැලකිය යුතු අතර ඔහුගේ පඩිය ද ඒ අනුව ගණන් බැලිය යුතුය.

ඉහත කී පරිදි සේවායෝජකයා විසින් වැඩ නොසැපයීම නිසා නොව, කම්කරුවාගේ අකමැත්ත නිසා හෝ එකී වෙනත් අවස්ථාගත කරුණු නිසා හෝ කම්කරුවකු, යම් දවසක ඒ දවසේ සාමාන්‍ය වැඩ කරන පැය ගණනට අඩු කාලයක් වැඩ කළහොත් ඔහුගේ සේවා යෝජකයා විසින්, ඒ කම්කරුවා වැඩ කළ



labour Department of Sri Lanka

කාලය දවසේ සාමාන්‍ය වැඩ කරන පැය ගණනට දරන්නේ යම් අනුපාතයක් ද, ඔහු ඒ දවසේ සාමාන්‍ය පැය ගණන වැඩ කළේ නම් ඒ සඳහා ඔහුට ගෙවනු ලැබිය හැකිව තිබුණු පාරිශ්‍රමිකයට ඒ අනුපාතයම දරන මුදලක්, එකී කාලය සඳහා පාරිශ්‍රමික වශයෙන් ඔහුට ගෙවිය යුතු ය.

(2) පඩි පාලක සභාවක් පිහිටුවනු ලැබ ඇති යම් කර්මාන්තයක සේවයේ නියුක්ත එකී සභාව විසින් නියම කරන ලද සුමාන පඩි හෝ මාස් පඩි ප්‍රමාණ අනුව පඩි ගෙවනු ලබන කම්කරුවකු (වැඩ කළ යුතු නිවාඩු දිනයන් ද ඇතුළුව) යම් දිනක කිසි වැඩක් නොකළ අවස්ථාවක හෝ එදින සාමාන්‍ය වැඩ කළ යුතු පැය ගණනට වඩා අඩුවෙන් වැඩ කළ අවස්ථාවක හෝ එකී දිනයෙහි කිසි වැඩක් හෝ සම්පූර්ණ සාමාන්‍ය වැඩකරන දිනයකට ප්‍රමාණවන තරම් වැඩ හෝ කිරීමට නොහැකි වූයේ ඔහුට කිරීමට වැඩ සැපයීමට ඔහුගේ සේවායෝජකයාට නොහැකි වීම නිසා නොව වැඩ කිරීමට ඔහුගේ අකමැත්ත නිසා නම් හෝ සභාව නිශ්චය කරන වෙනත් අවස්ථාගත කරුණක් නිසා නම් මිස ඔහු සම්පූර්ණ සාමාන්‍ය දිනයක් වැඩ කළ ලෙස සැලකිය යුතු අතර ඔහුගේ පඩිය ද ඒ අනුව ගණන් බැලිය යුතුය.

(1957 අංක 27, 5(ආ) වගන්තිය)

ඉහත කී පරිදි සේවා යෝජකයා විසින් වැඩ නොසැපයීම නිසා නොව කම්කරුවාගේ අකමැත්ත නිසා හෝ එකී වෙනත් අවස්ථාගත කරුණු නිසා හෝ ඔහු යම් දවසක ඒ දවසේ සාමාන්‍ය වැඩ කරන පැය ගණනට අඩු කාලයක් වැඩ කළහොත් ඔහුගේ සේවායෝජකයා විසින්-

(අ) සුමාන පඩි ප්‍රමාණයක් අනුව ඔහුට පඩි ගෙවනු ලැබේ නම්, ඒ කාලය, සතියක දී වැඩ කරන සාමාන්‍ය මුළු පැය ගණනට දරන්නේ යම් අනුපාතයක් ද සුමාන පඩි ප්‍රමාණයට ඒ අනුපාතය ම දරන මුදලක් ඒ කාලය සඳහා පාරිශ්‍රමික වශයෙන් ඔහුට ගෙවිය යුතු ය. නැතහොත්

(ආ) මාස් පඩි ප්‍රමාණයක් අනුව ඔහුට පඩි ගෙවනු ලැබේ නම්, ඒ කාලය කොටසක් වන මාසයේ වැඩ කරන සාමාන්‍ය මුළු පැය ගණනට ඒ කාලය යම් අනුපාතයක් දරන්නේ ද මාස් පඩි ප්‍රමාණයට ඒ අනුපාතය ම දරන මුදලක් ඒ කාලය සඳහා පාරිශ්‍රමික වශයෙන් ඔහුට ගෙවිය යුතුය.

පඩි ගෙවිය යුත්තේ කවර කාලසීමාවකට වරක් ද යන වග.

23. (1) යම් පඩිපාලක සභාවක් පිහිටුවා ඇත්තේ යම් කර්මාන්තයක් සඳහා ද ඒ කර්මාන්තයේ කම්කරුවන්ට පඩි ගෙවිය යුත්තේ කිනම් කාලසීමාවක් වෙනුවෙන් දැයි ඒ පඩි පාලක සභාව විසින් තීරණය කළ හැකිය. (එම කාල සීමාව කවර අවස්ථාවක දී එක් මාසයක් නොඉක්මවිය යුතුය.) තව ද එකී කාල සීමාව අවසන් වූ විට කවර දින ගණනක් ඇතුළත එසේ පඩි ගෙවිය යුතු ද යන්න ද ඒ පඩි පාලක සභාව විසින් නිශ්චය කළ හැකිය.

(2) ගිවිසුමක් අවසන් කිරීම සඳහා මේ ආඥාපනත හැර වෙනත් ලිඛිත නීතියක් යටතේ අවශ්‍ය කල්දීමේ හෝ අනතුරු හැඟවීමේ කාල සීමාව කෙරෙහි, (1) වන උපවගන්තියේ හෝ එය යටතේ කරන ලද තීරණයක හෝ ඇතුළත් කිසිවකින්, බලපෑමක් නොවන්නේ ය.



Labour Department of Sri Lanka

24. (1) යම්කිසි කර්මාන්තයක් සම්බන්ධයෙන් පිහිටුවනු ලැබූ පඩි පාලක සභාවක් විසින් පහත දක්වන කටයුතු කළ හැකි වේ. එනම් :- වැඩ කළ යුතු පැය ගණන සහ සතිපතා නිවාඩුව.

(අ) සාමාන්‍ය වැඩ කරන දිනයක් සම්බන්ධයෙන් වන විට ආහාර ගැනීම හෝ විවේකය හෝ සඳහා නියම කරන විවේක කාලය හෝ කාලයන් ද ඇතුළුව, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත් ව, සාමාන්‍ය වැඩ කරන දිනයක් හෝ සමාන්‍ය වැඩ කරන සතියක් හෝ සමන්විත වන පැය ගණන නියම කිරීම සහ වැඩ කරන මාසයක් සමන්විත වන සාමාන්‍ය වැඩ කරන දින ගණන නිශ්චය කිරීමෙන් හා ඒ එක් එක් දිනය සමන්විත වන පැය ගණන නිශ්චය කිරීමෙන් ඒ මාසය සමන්විත වන පැය ගණන නියම කිරීම;

(ආ) ප්‍රධාන භෝජන ගැනීම සඳහා ඉඩ දෙනු ලබන විවේක කාලය පැයකට අඩු නොවන පරිදි වැඩ කරන දිනක ආහාර ගැනීම හෝ විවේකය හෝ සඳහා ගත හැකි විවේක කාල ගණනත් විවේක කාල සීමාවක් නිශ්චය කිරීම,

(ඇ) සෑම සේවායෝජකයකු විසින් ම සියලුම කම්කරුවන්ට හෝ යම්කිසි නිශ්චිත පන්තියක කම්කරුවන්ට හෝ සෑම සතියක ම එක් දිනයක් නිවාඩු දිනයක් වශයෙන් ඉඩ හැරිය යුතු බව ද එවැනි නිවාඩු දිනයක් වෙනුවෙන් කම්කරුවන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකයක් වේ නම් ඒ පාරිශ්‍රමිකය ද එවැනි නිවාඩු දිනයක් ඉඩ හරිනු ලබන්නේ යම් කොන්දේසියකට යටත්ව නම් ඒ කුමන කොන්දේසියකට යටත්ව ද යන්න ප්‍රකාශ කිරීම.

(1971 අංක 1 දරන නිවාඩු දින පිළිබඳ නියෝග, 1971.11.15 දින අංක 14,984/44 දරන ගැසට් පත්‍රය )

(ඈ) එවැනි නිවාඩු දිනයක කම්කරුවන් සේවයෙහි යෙදවිය යුත්තේ කුමන කොන්දේසිවලට යටත්ව ද යන්න නියම කිරීම: එහෙත් ඒ කොන්දේසිවලට, එවැනි වැඩ සඳහා අතිකාල ප්‍රමාණයට අඩු නොවන ගෙවීම් ප්‍රමාණයක් යටතේ පාරිශ්‍රමික ගෙවීම හෝ එසේ අතිකාල ගෙවීම් ප්‍රමාණයක් නියම කොට නොමැති නම් එවැනි වැඩකට සාමාන්‍යයෙන් අදාළ ගෙවීම් ප්‍රමාණය මෙන් එකකුත් කාලක් වන ගෙවීම් ප්‍රමාණයක් අනුව පාරිශ්‍රමික ගෙවීම ද, එකී දිනයට පසුව පැමිණෙන නියමිත දින ගණනක් ඇතුළත දිනයක පාරිශ්‍රමික ඇතිව හෝ නැතිව හෝ නිවාඩු දීම ද නැතහොත් විශේෂ කම්කරු පන්තියක් සම්බන්ධයෙන් වන විට එකී දිනය වෙනුවට දිනයක් නිවාඩු නොදී, එකී වැඩ සඳහා සාමාන්‍යයෙන් අදාළ පාරිශ්‍රමික ප්‍රමාණය මෙන් එකහමාරකට අඩු නොවන ගෙවීම් ප්‍රමාණයක් අනුව ඒ වැඩ සඳහා පාරිශ්‍රමික ගෙවීම ද යන කොන්දේසි ඇතුළත් විය යුතුය.

(1අ) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ හෝ (ඈ) ඡේදය යටතේ හෝ නිවාඩු දිනයක් නියම කරනු ලබන අවස්ථාවක දී- ( 1957 අංක 27 , 6 වන වගන්තිය )

Labour Department of Sri Lanka

(1957 අංක 27, 6 වන වගන්තිය)

(අ) ඒ නියම කිරීම අදාළ වන සෑම කම්කරුවකුට ම එකී නියම කිරීමේ කොන්දේසිවලට අනුකූල ව ඒ නිවාඩු දිනය ලබාගැනීමට හිමිකම් ලැබිය යුතුවාක් මෙන් ම ඔහු විසින් ඒ නිවාඩුව එසේ ලබා ගත යුතු ද වන්නේය. තව ද,

(ආ) එබඳු සෑම කම්කරුවකුගේ ම සේවායෝජකයා විසින් ඒ නිවාඩු දිනය දිය යුතුය. තවද නියම කිරීමේ කොන්දේසිවලට අනුකූලව ඒ නිවාඩු දිනය සම්බන්ධයෙන් පාරිශ්‍රමික ගෙවීමට ඔහු බැඳී සිටින්නේ ය.

(2) යම් කර්මාන්තයක් සඳහා පිහිටුවනු ලැබූ පඩි පාලක සභාවක් විසින් එම කර්මාන්තය සඳහා නියම කරන ලද සාමාන්‍ය වැඩ කරන දිනයක් සමන්විත වන පැය ගණන පහත සඳහන් ආකාරයට විය යුතුය:-

(අ) එම දිනයෙහි ආහාර ගැනීම සඳහා හෝ විවේකය සඳහා හෝ එම සභාව විසින් නියමිත විවේක කාලයෙහි හෝ කාලවල ප්‍රමාණය පැයකට වඩා වැඩි නොවේ නම් ඉහත කී වැඩ කරන දිනයක පැය ගණන පැය නවයකට වඩා වැඩි නොවිය යුතුය; තවද

(ආ) කෑම සඳහා හෝ විවේකය සඳහා හෝ වන කාලය පැයක් ඉක්මවන්නේ නම්, පැය නවය ද එකී කෑම හෝ විවේකය හෝ සඳහා වූ කාලය පැයකට වඩා වැඩි වන ප්‍රමාණය එකතු කිරීමෙන් ලැබෙන පැය ගණනට වැඩි නොවිය යුතුය. නැතහොත් එකී එකතු කිරීමෙන් ලැබෙන පැය ගණන පැය දොළහක් ඉක්මවන්නේ නම් වැඩ කරන දිනයක පැය ගණන පැය දොළහකට වඩා වැඩි නොවිය යුතුය.

එසේ වුව ද පඩි පාලක සභාවක් විසින්, එකී සභාව පිහිටුවනු ලැබූ කර්මාන්තයෙහි සේවයෙහි යෙදී සිටින විශේෂ කම්කරු පන්තියක් විසින් කරන වැඩවල ස්වභාවය සලකා බැලීමෙන් පසුව එකී විශේෂ, කම්කරු පන්තිය සම්බන්ධයෙන්, සාමාන්‍ය වැඩ කරන දිනයක් සමන්විත වන පැය ගණන එකී සභාවට සුදුසු යයි හැඟෙන පරිදි පැය දොළහක් ඉක්මවන යම් පැය ගණනක් විය යුතු යයි එකී පඩි පාලක සභාව විසින් නියම කළ හැකි ය.

(3) සාමාන්‍ය වැඩ කරන සතියක් සමන්විත වන පැය ගණන පැය හතළිස් අටකට වඩා වැඩි නොවිය යුතු ය.

(4) යම්කිසි කර්මාන්තයක් සඳහා පිහිටුවනු ලැබූ පඩිපාලක සභාවක් විසින්, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව ඒ කර්මාන්තය සඳහා සතියේ එකිනෙකට වෙනස් දිනවලට වෙනස් පැය ගණනකින් යුත් සාමාන්‍ය වැඩ කරන දිනයක් නියම කිරීම ද ඒ කර්මාන්තයේ එකිනෙකට වෙනස් කම්කරු පන්තිවලට වෙනස් පැය ගණනකින් යුත් සාමාන්‍ය වැඩ කරන දිනයක් නියම කිරීම ද එම කර්මාන්තය පවත්වාගෙන යන එකිනෙකට වෙනස් ප්‍රදේශවලට වෙනස් පැය ගණනකින් යුත් සාමාන්‍ය වැඩ කරන දිනයක් නියම කිරීම ද කළ හැකි ය.

(1971 අංක 1 දරන නිවාඩු නියෝග 1971.11.15 දින අංක 14,984/44 දරන ගැසට් පත්‍රය)

Labour Department of Sri Lanka

(5) යම් කර්මාන්තයක් සඳහා පිහිටුවනු ලැබූ පඩි පාලක සභාවක් එකී කර්මාන්තය සඳහා සාමාන්‍ය වැඩ කරන දිනය සමන්විත වන කාල සීමාව වශයෙන් නියම කරන ලද කාල සීමාව, එකී සභාව විසින් අන් ආකාරයකට තීරණය කර ඇත්නම් මිස අඛණ්ඩ කාලසීමාවක් විය යුතු ය. එවැනි කාලසීමාවක් අඛණ්ඩ කාල සීමාවක් වීම අවශ්‍ය නොවේ යැයි පඩිපාලක සභාවක් විසින් තීරණය කරන ලද අවස්ථාවක, එකී කර්මාන්තයෙහි කම්කරුවන් සේවයේ නියුක්ත කරන සෑම සේවායෝජකයෙකු විසින් ම, එකී කාලය පැය දොළහකට වැඩි කාලයක් පැතිර නොයන ආකාරයට හෝ එකී සභාව විසින් යම් අඩු පැය ගණනක් නියම කර ඇත්නම් ඒ පැය ගණනට වැඩි කාලයක් පැතිර නොයන ආකාරයට ඒ කාල සීමාව පිළියෙල කළ යුතුය:

එසේ වුව ද (2) වන උපවගන්තියේ අතුරු විධානය යටතේ පඩි පාලක සභාවක් විසින් සාමාන්‍ය වැඩ කරන දිනයක් සමන්විත වන කාලසීමාව වශයෙන් නියම කරන ලද කාල සීමාවක් සම්බන්ධයෙන් මේ උපවගන්තියේ ඉහතින් ඇති විධිවිධාන අදාළ නොවන්නේය.

(6) ප්‍රධාන භෝජනය ගැන්ම සඳහා යම් කම්කරුවකුට ඉඩ හැර තිබෙන විවේක කාලය එකී විවේක කාලය ඇතුළත් වැඩ කරන දිනයට නියමිත පැය ගණනින් තුන්වෙනි පැයට පසුව හා අන්තිම දෙපැයට පෙර යම් වේලාවක දී පටන් ගත යුතුය.

25. (1) යම්කිසි කර්මාන්තයක් සඳහා පිහිටුවනු ලැබූ පඩි පාලක සභාවක් විසින් - වාර්ෂික නිවාඩු

(අ) මේ උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේද යටතේ ඒ සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි හෝ තීරණය කරනු ලැබිය හැකි කොන්දේසි සම්පූර්ණ කිරීමට හා පාරිශ්‍රමිකයන් ගෙවීමට ද යටත් ව නිවාඩු ආඥාපනත යටතේ ඒ සභාව විසින් නිශ්චය කළ හැකි, නවයකට වැඩි නොවන රජයේ නිවාඩු දින ඇතුළත්ව ඒ සභාව විසින් නියම කළ හැකි තිහකට වැඩි නොවන දින ගණනක්, 24 වන වගන්තිය යටතේ නිවාඩු දිනවලට අතිරේකව එක් එක් අවුරුද්දේ දී සෑම සේවායෝජකයෙකු විසින් ම නිවාඩු දින වශයෙන් සියලු ම කම්කරුවන්ට හෝ යම් නියමිත කම්කරු පන්තියකට දිය යුතු බව ප්‍රකාශයට පත් කළ හැකිය;

(ආ) එවැනි යම් අතිරේක නිවාඩු දෙනු ලබන්නේ කුමන කොන්දේසිවලට යටත්ව ද යන්න නියම කළ හැකිය;

(ඇ) තව ද එවැනි අතිරේක නිවාඩු දින සම්බන්ධයෙන් කම්කරුවන්ට පාරිශ්‍රමිකයක් ගෙවිය යුතු වේ නම් එසේ ගෙවිය යුතු පාරිශ්‍රමිකය සහ ඒ පාරිශ්‍රමිකය ගෙවිය යුත්තේ යම් කොන්දේසිවලට යටත් ව නම් ඒ කොන්දේසි නියම කිරීම ද මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඒ සභාව විසින් නිශ්චය කරනු ලැබූ යම් රජයේ නිවාඩු දිනයක කම්කරුවකු සේවයේ නියුක්ත කළ හැක්කේ යම්

Labour Department of Sri Lanka

කොන්දේසිවලට යටත්ව ද, ඒ කොන්දේසි නියම කිරීම ද කළ හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් තීරණයක් කළ කල්හි (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව -

(අ) ඒ තීරණය අදාළ වන සෑම කම්කරුවකුට ම ඒ තීරණයේ නියමයන් ප්‍රකාර දිනයක් හෝ දින කිහිපයක් හෝ නිවාඩු ගැනීමට හිමිකම් ඇත්තේ ය; තවද ඒ සෑම කම්කරුවෙක් ම ඒ නිවාඩු ගත යුත්තේ ය.

(ආ) එවැනි සෑම කම්කරුවෙකුගේ සේවායෝජකයෙක් ම එසේ දිනයක් හෝ දින කිහිපයක් හෝ නිවාඩු දිය යුතු අතර එම නිවාඩු දිනය හෝ දින සම්බන්ධයෙන් එම තීරණයේ නියමයන් ප්‍රකාර පාරිශ්‍රමික ගෙවීමට ද බැඳී සිටින්නේ ය.

(1957 අංක 27, 7(ඇ) වගන්තිය)

(3) (2) වන උපවගන්තිය යටතේ යම් අවුරුද්දක යම් නිවාඩු දිනයකට හෝ නිවාඩු දිනවලට හිමිකම් ලබා සිටින කම්කරුවකුගේ සේවා නියුක්තිය ඒ කම්කරුවාගේ සේවායෝජකයා විසින් අවසන් කරනු ලබන අවස්ථාවක දී හෝ ඒ කම්කරුවා විසින් නීත්‍යානුකූල ව අවසන් කරනු ලබන අවස්ථාවක දී, සේවායෝජකයා ඒ නිවාඩු දිනය හෝ නිවාඩු දින ඒ කම්කරුවාට දී නොමැති නම් කම්කරුවාට එම උපවගන්තිය යටතේ එකී නිවාඩු දිනය හෝ දින සම්බන්ධයෙන් ගෙවිය යුතු පාරිශ්‍රමිකය ගෙවීමට එකී සේවායෝජකයා යටත් වන්නේය. නැතහොත් ඒ පාරිශ්‍රමිකය ලැබීමට පෙර කම්කරුවා මිය ගියහොත් ඔහුගේ නීත්‍යානුකූල උරුමක්කාරයින්ට එකී පාරිශ්‍රමිකය ගෙවිය යුතුය.

(4) යම්කිසි කර්මාන්තයක සේවයෙහි නියුක්ත කර ඇති කම්කරුවකු (2) වන උපවගන්තිය යටතේ යම්කිසි අවුරුද්දක යම් නිවාඩු දිනයකට හෝ නිවාඩු දිනවලට හිමිකම් ලබා, එකී නිවාඩු දිනය හෝ නොලබා, එසේ සේවයේ නියුක්ත කරනු ලැබ සිටියදී ම මියගියේ නම් එම නිවාඩු දිනය හෝ දින සම්බන්ධයෙන් එකී කම්කරුවාට එම උපවගන්තිය යටතේ ගෙවිය යුතු පාරිශ්‍රමිකය එකී කම්කරුවාගේ නීත්‍යානුකූල උරුමක්කාරයන්ට ගෙවීමට සේවායෝජකයා යටත් වන්නේ ය.

(5) මේ වගන්තිය යටතේ පඩි පාලක සභාවක යම් තීරණයක් සම්බන්ධයෙන් "අවුරුද්ද" යන්නෙන් ඒ සභාව විසින් තීරණය කළ හැකි මාසයක පළමුවෙනි දින හෝ ඒ සභාව එලෙස තීරණය නොකළ අවස්ථාවක දී ජනවාරි මස පළමුවෙනි දින හෝ ආරම්භ වන මාස දොළහක කාලයක් ද අදහස් වේ. (1957 අංක 27, 7(ඇ) වගන්තිය )

(26) යම්කිසි කර්මාන්තයක සේවායෝජකයා වෙනස් වුණු අවස්ථාවක දී කම්කරුවකු විසින් එකී කර්මාන්තයෙහි පළමු සේවායෝජකයා යටතේ කරන ලද සේවය, සේවයේ දීර්ඝත්වය අනුව යම් නිවාඩු දිනයකට හිමිකම් ලබා ගැනීමේ කාර්යය සඳහා, අළුත් සේවා යෝජකයා යටතේ කරන ලද සේවයක් වශයෙන් සැලකිය යුතුය.

නිවාඩු දිනවල කාර්ය සඳහා සේවය ගණන් බැලීම.

(27) පඩි පාලක සභාවක් විසින් මේ ආඥා පනත යටතේ තීරණයක් කිරීමේදී කර්මාන්තයේ ඒ ඒ ශාඛාවල හෝ විශේෂ ප්‍රදේශවල හෝ විශේෂ කම්කරු

විශේෂ අවස්ථාවන්ට සුදුසු පරිදි වෙනත් පඩි ක්‍රම ආදිය නියම කිරීම.



Labour Department of Sri Lanka

පංතිවලට බලපාන්නා වූ හෝ අවස්ථාගත කරුණු සැලකිල්ලට ගත යුතුය. තවද එවැනි තීරණයක් කිරීමේ දී එකී අවස්ථාගත කරුණු අනුව යෝග්‍ය යයි සභාව සලකන වෙනස් පඩි ප්‍රමාණ හෝ වෙනස් වැඩ කළ යුතු පැය ගණන හෝ නැතහොත් වෙනත් විධිවිධාන හෝ නියම කළ යුතු ය.

අදහස් කරන තීරණ පඩි පාලක සභාව විසින් ප්‍රසිද්ධ කිරීම.

(28) (1) යම් පඩි පාලක සභාවක් විසින් තීරණයක් කිරීමට අදහස් කරන අවස්ථාවක, එකී සභාව විසින් එසේ අදහස් කළ තීරණය ගැසට් පත්‍රයෙහි ද එක් සිංහල ප්‍රවෘත්ති පත්‍රයක ද එක් දෙමළ ප්‍රවෘත්ති පත්‍රයක ද එක් ඉංග්‍රීසි ප්‍රවෘත්ති පත්‍රයක ද එම අදහස් කළ තීරණයට විරුද්ධව එකී සභාව වෙත කරුණු ඉදිරිපත් කළ යුත්තේ කිනම් දිනක දී නැතහොත් කිනම් දිනකට පෙර ද යන්න දන්වන දැන්වීමක් ද සමග ප්‍රසිද්ධ කරවිය යුතුම ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කළ දැන්වීමක් නිසා ඉදිරිපත් කරනු ලබන සියලුම විරුද්ධතා ලියවිල්ලකින් කළ යුතුය. තවද අදහස් කළ තීරණයට විරුද්ධව වන හේතු සඳහන් ප්‍රකාශයක් ද එහි ඇතුළත් කළ යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කළ දැන්වීමක් නිසා ඉදිරිපත් කරනු ලබන සියලුම විරුද්ධතා පඩි පාලක සභාව විසින් සලකා බැලිය යුතුය. යම්කිසි සංශෝධනයක් ඇතිව හෝ නැතිව එකී තීරණය ස්ථිර කිරීම පඩි පාලක සභාව විසින් කළ හැකිය.

පඩි පාලක සභාවල තීරණ සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා

(29) (1) පඩිපාලක සභාවක් විසින් එළඹි 28 වන වගන්තිය යටතේ ස්ථිර කරන ලද සෑම තීරණයක් ම -

(අ) සභාපතිවරයා විසින් අත්සන් කොට එහි දිනය යොදා තිබිය යුතුය;

(ආ) එම තීරණය සම්බන්ධ වූ යම්කිසි කරුණක් පිළිබඳ ව යම් වාර්තාවක් කිරීමට පඩි පාලක සභාව හෝ දිස්ත්‍රික් පඩි පාලක කාරක සභාව හෝ කොමසාරිස්වරයා හෝ කැමති නම් ඒ වාර්තාව ද සමග එය කොමසාරිස්වරයා මගින් අමාත්‍යවරයාට යැවිය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ යවන ලද තීරණයක් නැවත සලකා බැලීම පිණිස අමාත්‍යවරයා විසින් පඩි පාලක සභාවකට නැවත යොමු කරනු ලැබිය හැකිය. ඒ සෑම අවස්ථාවක දී ම පඩි පාලක සභාව විසින් එම තීරණය නැවත සලකා බලා යෝග්‍ය යයි සභාව සලකන සංශෝධන ඇත්නම් ඒ සංශෝධන කර අමාත්‍යවරයාට යැවිය යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත යවන ලද තීරණයක් හෝ (2) වන උපවගන්තිය යටතේ ඔහු වෙත ආපසු යවන ලද තීරණයක් හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවහොත් මිස බල නොපවත්වන්නේ ය. අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද සෑම තීරණයක් ම, එසේ අනුමත කළ බවට දැන්වීමකුත් සමග ගැසට් පත්‍රයෙහි ද, එක් සිංහල ප්‍රවෘත්ති පත්‍රයක ද, එක් දෙමළ ප්‍රවෘත්ති පත්‍රයක ද, එක් ඉංග්‍රීසි ප්‍රවෘත්ති පත්‍රයක ද ප්‍රසිද්ධ කළ යුතුය.

Labour Department of Sri Lanka

(4) අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද තීරණයක් එය අනුමත කිරීමේ නිවේදනය ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කළ දිනයෙහි සිට හෝ ඒ නිවේදනයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන පසු දිනයක සිට හෝ බලාත්මක වන්නේ ය.

පඩිපාලක සභාවක තීරණයන් අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම.

30. 29 වන වගන්තිය යටතේ බලාත්මක වූ පඩි පාලක සභා තීරණයක් එම සභාව විසින් පසුව කරන තීරණයකින් අනුව කවර අවස්ථාවක වුවද අවලංගු කිරීමද, වෙනස් කිරීම ද කළ හැකිය. එසේ පසුව කරනු ලබන සෑම තීරණයකට ම 28 වන සහ 29 වන වගන්තිවල විධිවිධාන අදාළ වන්නේය.

පඩිපාලක සභාවල තීරණ පිළිබඳ සාක්ෂි

31. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් මුද්‍රිත යයි කියනු ලබන පඩි පාලක සභාවේ තීරණය ද, එම තීරණය අමාත්‍යවරයා විසින් අනුමත කිරීමේ දැන්වීම ද ඇතුළත් ගැසට් පත්‍රයෙන් උපුටා ගත් කොටසක් නැතහොත් කම්කරු කොමසාරිස්වරයා හෝ ඔහුගේ නියෝජ්‍ය හෝ සහකාර කොමසාරිස්වරයකු හෝ විසින් සැබෑ පිටපතක් බවට සහතික කරනු ලැබූ ඒ තීරණයක හා දැන්වීමක පිටපතක්, ඒ තීරණය හෝ අනුමැතිය හෝ පිළිබඳ සාක්ෂි වශයෙන් කවර හෝ අධිකරණයකට ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

32. මේ ආඥාපනත හැර වෙනත් ලිඛිත නීතියක කුමක් සඳහන් ව ඇත ද එසේම ඒ ලිඛිත නීතියක් යටතේ යම් සභාවක් විසින් හෝ යම් තැනැත්තකු විසින් හෝ කවර ක්‍රියාවක් කළ ද නැතහොත් කවර තීරණයක් කරනු ලැබුව ද, මේ ආඥාපනත යටතේ පඩි පාලක සභාවක් විසින් කරන ලද සෑම තීරණයක් ම, ඒ තීරණය බලාත්මක වූ දින සිට බල පවත්වන්නේය.

මෙම ආඥා පනත හැර වෙනත් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇතද පඩි පාලක සභාවක තීරණ බලපැවැත්විය යුතු බව.

## සාමාන්‍ය අවම කාලානුකූල ගෙවීම් ප්‍රමාණයක් කොමසාරිස්වරයා විසින් නිශ්චය කිරීම

ඇතැම් අවස්ථාවලදී, සාමාන්‍ය අවම කාලානුකූල ගෙවීම් ප්‍රමාණයන් කම්කරු කොමසාරිස් වරයා විසින් නිශ්චය කිරීම.

33. (1) (අ) පඩි පාලක සභාවකට නියෝජිත හෝ පත් කළ හෝ සාමාජිකයකු වශයෙන් පත්වීම භාර ගැනීමට යම් තැනැත්තකු විසින් ප්‍රතික්ෂේප කිරීම නිසා හෝ යම් තැනැත්තකු එකී සභාවේ නියෝජිත සාමාජිකයෙකු වශයෙන් පත් කිරීම යම් වෘත්තීය සමිතියක් හෝ සංගමයක් හෝ සංවිධානයක් හෝ විසින් අනුමත කිරීම පැහැර හැරීම නිසා හෝ වෙනත් යම් කරුණක් නිසා හෝ යම් කර්මාන්තයක් සඳහා පඩිපාලක සභාවක් පිහිටුවා ගැනීමට නොහැකි බව; හෝ

(ආ) යම් කර්මාන්තයක් සඳහා පිහිටුවන ලද පඩි පාලක සභාවක් විසින්, යම් හේතුවක් නිසා, එම සභාව පිහිටුවන ලද දින සිට එක් අවුරුද්දක් වූ කාල සීමාවක් ඉකුත්වීමට පෙර, යම් අවස්ථාවක් සම්බන්ධයෙන්, (එම සභාව විසින් 20(3) වන වගන්තිය යටතේ අවස්ථාව සම්බන්ධයෙන් වාර්තා කර ඇත ද නැත ද) සාමාන්‍ය අවම කාල අනුප්‍රමාණයක් නිශ්චය කර නොමැති බව;

( 1978 අංක 19, 5 වන වගන්තිය)

Labour Department of Sri Lanka

අමාත්‍යවරයාට පෙනී ගිය අවස්ථාවක දී, ඒ කර්මාන්තයේ යෙදී සිටින කම්කරුවන් සඳහා සාමාන්‍ය අවම කාලානුකූල ගෙවීම් ප්‍රමාණයක් නිශ්චය කිරීමට, ගැසට් පත්‍රයේ නියමයක් පළ කිරීමෙන්, අමාත්‍යවරයා විසින් කොමසාරිස්වරයාට බලය දිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියමයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ විට, එම දැන්වීමෙහි සඳහන් කර්මාන්තයෙහි යෙදී සිටින කම්කරුවන් සඳහා සාමාන්‍ය අවම කාලානුකූල ගෙවීම් ප්‍රමාණයක් නිශ්චය කිරීමට කොමසාරිස්වරයා ක්‍රියා කළ යුතුය. එම කාර්යය සඳහා ඔහුට, එකී කර්මාන්තය සඳහා පිහිටුවනු ලැබූ පඩි පාලක සභාවකට ඇති බලතල ම ඇත්තේ ය.

(3) මේ වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් කරනු ලබන සෑම නිශ්චය කිරීමකට ම මේ ආඥාපනතේ 27 වන, 28 වන සහ 29 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ වන්නේ ය. එසේ අදාළ කරන ලද 29 වන වගන්තියේ විධිවිධාන යටතේ එබඳු නිශ්චයක් බලාත්මක වූ විට මේ ආඥාපනතේ සියලු කාර්යය සඳහා, එය පඩි පාලක සභාවක් විසින් යථා පරිදි කරන ලද නිශ්චයක් සේ සැලකිය යුතු ය.

අහෝසි කරන ලද හෝ බලය අඩු කරන ලද පඩි පාලක සභාවල තීරණ

34. (1) යම්කිසි කර්මාන්තයක් සඳහා පිහිටුවනු ලැබූ පඩි පාලක සභාවක් අහෝසි කරනු ලැබ, 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ කරන ලද නියමයකින් වෙනත් පඩිපාලක සභාවක බලතල, යුතුකම් සහ කාර්යය එකී කර්මාන්තය කෙරෙහි ද ව්‍යාප්ත කළ කල්හි, එකී නියමය කළ දිනයෙහි බලාත්මකව පවත්නා, එකී කර්මාන්තය සම්බන්ධයෙන් මුලින් කී සභාව විසින් කරන ලද තීරණ, එකී අනිත් සභාව විසින් කරනු ලැබුවාක් සේ, එකී සභාව විසින් අවලංගු කිරීමට හෝ වෙනස් කිරීමට හෝ යටත් ව, බලාත්මකව පවතින්නේය.

(2) පඩි පාලක සභාවක් විසින් පිහිටුවා ඇති යම් කර්මාන්තයක විස්තරය 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයකින් යම් කටයුතු අත්හැරීමෙන් වෙනස් කොට ඇත්තා වූ ද එකී වගන්තිය යටතේ, මේ ආඥාපනතේ II වන කොටසේ විධිවිධාන අදාළ වන වෙනත් කර්මාන්තයක විස්තරයකට එකී කටයුතු ඇතුළත් කරනු ලැබ ඇත්තාවූ ද නැතහොත් එකී කටයුතුවලින් එකී වෙනත් කර්මාන්තයේ විස්තරය සමන්විත වන්නා වූ ද, අවස්ථාවක එකී නියමය කළ දිනයෙහි බලාත්මකව පවත්නා, එම කටයුතු වලට අදාළ වූ ඉහත සඳහන් සභාවේ තීරණ, ඉහත කී වෙනත් කර්මාන්තය සඳහා පඩිපාලක සභාව පිහිටුවීමෙන් පසුව, අන්තිමට සඳහන් සභාව විසින් කරන ලද තීරණ සේම, එකී සභාව විසින් අවලංගු කිරීමට හෝ වෙනස් කිරීමට හෝ යටත්ව, බලාත්මකව පවත්නේ ය.

## විශේෂ අවස්ථා පිළිබඳ විධිවිධාන

වැඩ දෙවර්ගයක් හෝ වැඩි ගණනක් කරන කම්කරුවා

35. අවම පඩි ප්‍රමාණයක් අදාළ වන වර්ග දෙකක වැඩ හෝ වර්ග වැඩි ගණනක වැඩ හෝ කරන කම්කරුවකුට, එක් එක් වර්ගයේ වැඩෙහි යෙදුණු



Labour Department of Sri Lanka

කාලය සඳහා ඒ ඒ වර්ගය පිළිබඳව එවකට බලපවත්වන අවම පඩි ප්‍රමාණයට නොඅඩු වන ලෙස සේවායෝජකයා විසින් පඩි ගෙවිය යුතුය.

කෑලි වැඩෙහි යෙදෙන කම්කරුවා (1957 අංක 27, 8 වන වගන්තිය)

36. මේ ආඥාපනත යටතේ අවම සාමාන්‍ය කාලානුකූල ගෙවීම් ප්‍රමාණයක් මිස අවම සාමාන්‍ය කෑලි ගණනේ ගෙවීම් ප්‍රමාණයක් නියම කොට නැති අවස්ථාවක කෑලි ගණන අනුව වැඩක් කිරීමෙහි යොදවා සිටින කම්කරුවකුට කෑලි ගණන අනුව ඔහුගේ සේවායෝජකයා විසින් ගෙවන පඩියෙන්, ඒ අවස්ථාව අනුව යටත් පිරිසෙයින් සාමාන්‍ය අවම කාලානුකූල ගෙවීම් ප්‍රමාණයට සමාන වූ පාරිශ්‍රමිකයන් ලැබෙන බැව් සේවායෝජකයා විසින් පෙන්වා දුනහොත් මිස ඔහු විසින්, අවම ගෙවීම් ප්‍රමාණයට අඩු පඩියක් ගෙවනු ලබන ලෙස සලකනු ලැබිය යුතුය.

වැඩ ලබා ගැනීම සඳහා සේවායෝජකයාගේ ස්ථානයේ රැඳී සිටින කම්කරුවෝ.

37. අවම පඩි ප්‍රමාණයක් අදාළ වන යම් වැඩක නියුක්ත කර ඇති කම්කරුවකු සම්බන්ධයෙන් වන විට, ගෙවිය යුතු පඩි මුදල ගණන් බැලීමේ කාර්යය සඳහා, ඒ කම්කරුවා ඒ ස්ථානයේ යෙදී සිටියේ සේවා යෝජකයාගේ ප්‍රකාශිත හෝ ව්‍යංජිත කැමැත්ත නොමැතිව බව හෝ ඔහු එසේ සිටියේ ඔහුගේ වැඩ හා සම්බන්ධ නොවන යම් කාර්යයක් සඳහා බව සහ ඔහු එහි රැඳී සිටියේ ඔහුට කිරීමට වැඩ ලබාදෙන තුරු නොවන බව සේවායෝජක විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ කම්කරුවා සේවායෝජකයාගේ ස්ථානයේ පැමිණ සිටි සම්පූර්ණ කාලය තුළ සේවායෝජකයා විසින් ඒ කම්කරුවා සේවයේ යොදවනු ලැබූ ලෙස සැලකිය යුතුය; තවද කෑලි වැඩ සඳහා සේවයේ යොදවනු ලැබූ කම්කරුවකු සම්බන්ධයෙන් වන විට, ඔහු එසේ පැමිණ සිටියා වූ ද කෑලි වැඩවල යෙදී නොසිටියා වූ ද, යම් කාලයක් තුළ, ඔහු අයත් වන පන්තියේ කම්කරුවන්ට අදාළ වන පොදු අවම කාලානුකූල ගෙවීම් ප්‍රමාණය මත සේවයේ යොදවනු ලැබ සිටි ලෙස හෝ එවැනි අවම කාලානුකූල ගෙවීම් ප්‍රමාණයක් නිශ්චය කොට නොමැති නම්, සහතික කළ කාලානුකූල ගෙවීම් ප්‍රමාණය මත සේවයේ නියුක්ත කර සිටි ලෙස සලකනු ලැබිය යුතුය.

එසේ වුව ද -

(අ) කම්කරුවා, සේවායෝජකගේ ස්ථානයෙහි වාසය කරන අවස්ථාවක, ඔහු එහි එසේ වාසය කිරීමේ හේතුවෙන් පමණක් ම, ඔහු ස්ථානයේ රැඳී සිටින යම් කාලයක් තුළ, ඔහු සේවයේ නියුක්ත කර සිටි ලෙස නොසැලකිය යුතු ය; තවද

(ආ) ආහාර ගන්නා සාමාන්‍ය වේලාවක දී, යම් වැඩක් කරනු නොලබන කාමරයක හෝ වෙනත් තැනක හෝ සිටින කම්කරුවකු, ඔහුගේ වැඩ හා සම්බන්ධ නැති කාර්යයක් සඳහා එහි රැඳී සිටින සේ සලකනු ලැබිය යුතුය.

කර්මාන්තයක් වශයෙන් ඇති කර ගන්නා ලද වැඩ පිළිවෙලක් අනුව කරන වැඩ.

38. (1) යම් කිසිවෙකු කර්මාන්තයක් වශයෙන් හෝ වාණිජමය කාර්යයක් සඳහා හෝ වෙනත් තැනැත්තෙකු සමග ප්‍රකාශිත හෝ ව්‍යංජිත වැඩ පිළිවෙළක් යොදා ගෙන, අවම පඩි ප්‍රමාණයක් අදාළ වන යම්කිසි වැඩක්, ඒ වැඩ පිළිවෙල ප්‍රකාර දෙවනු කී තැනැත්තා විසින් කරන අවස්ථාවක දී මේ ආඥාපනතේ කාර්ය සඳහා පළමු කී තැනැත්තා ඒ වැඩ සම්බන්ධයෙන් දෙවනු කී තැනැත්තාගේ



Labour Department of Sri Lanka

සේවා යෝජකයා ලෙස සලකනු ලැබිය යුතු අතර, එම වැඩ සඳහා වන අවශ්‍ය වියදම් අත් හැරීමෙන් පසු ඒ වැඩ සම්බන්ධයෙන් ඒ දෙවනු කී තැනැත්තා විසින් ලබා ගත හැකි ශුද්ධ පාරිශ්‍රමිකය, ඔහුගේ පඩිය ලෙස සැලකිය යුතු ය.

(2) මේ වගන්තියේ ''කර්මාන්තය'' යන්නෙන් යම් වාණිජ්‍ය කටයුත්තක් හෝ ව්‍යවසායක් අදහස් වේ.

කාය ශක්තියෙන් පිරිහුණු කම්කරුවා.

39. (1) අවම පඩි ප්‍රමාණයක් අදාළ කර්මාන්තයක සේවය කරන නැතහොත් සේවයට බැඳීමට කැමැත්තෙන් සිටින කම්කරුවකු එම අවම පඩි ප්‍රමාණය උපයා ගැනීමට නොහැකි වන තරම් අබලතාවකින් හෝ ශාරීරික පීඩාවකින් හෝ පෙළෙන බවට කොමසාරිස්වරයා හෝ මේ වගන්තියේ කාර්යය සඳහා කොමසාරිස් විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ සෑහීමට පත් වූ අවස්ථාවක, සුදුසු යයි ඔහු අදහස් කරතහොත්, අවම පඩි ප්‍රමාණයට අඩුවෙන් පඩි ගෙවීම සම්බන්ධයෙන් මේ ආඥාපනතේ ඇති විධිවිධානවලින් ඒ කම්කරුවා සේවයෙහි යෙදවීම නිදහස් කරන බලපත්‍රයක්, නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව, කොමසාරිස්වරයා විසින් හෝ ඒ නිලධරයා විසින් හෝ එම කම්කරුවාට ප්‍රදානය කළ හැකි ය.

(2) යම්කිසි කම්කරුවකු සේවයෙහි යෙදවීම සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ දෙන ලද බලපත්‍රයක් බලාත්මකව පවත්නා කල්හි, ඒ බලපත්‍රය බලාත්මකව පවත්නා තාක් කල් සහ ඒ බලපත්‍රය යටත් වන කොන්දේසි අනුව ක්‍රියා කර ඇති තාක් කල්, ඒ කම්කරුවාට අවම පඩි ප්‍රමාණයට අඩුවෙන් පඩි ගෙවීම සම්බන්ධයෙන් කිසිම නීති කෘත්‍යයකට සේවායෝජකයා යටත් නොවන්නේය.

(3) (1) වන උපවගන්තිය යටතේ කම්කරුවකුට දෙන ලද බලපත්‍රයක්, කොමසාරිස්වරයා විසින් හෝ කලින් කී පරිදි බලය පවරන ලද නිලධරයකු විසින් හෝ එම කම්කරුවාගේ සේවායෝජකයාට නියමිත ප්‍රකාර දැන්වීමක් කිරීමෙන් පසු කවර අවස්ථාවක දී වුව ද අවලංගු කළ හැකිය.

ආධුනිකයන් හෝ පුහුණුවන්නන්.

(1957 අංක 27, 9 වන වගන්තිය )

40. (1) යම් කර්මාන්තයක් සඳහා පිහිටවනු ලැබූ පඩි පාලක සභාවක් විසින්, ආධුනිකයන් වශයෙන් පුහුණුවන්නන් වශයෙන් යම්කිසි කම්කරුවන් ඒ කර්මාන්තයේ සේවයෙහි යොදවනු ලැබිය හැක්කේ කිනම් කොන්දේසිවලට යටත්ව දැයි නිශ්චය කළ හැකිය.

(2) යම් කර්මාන්තයක් සඳහා පිහිටුවනු ලැබූ පඩි පාලක සභාවක් විසින් (1) වන උපවගන්තිය යටතේ යම් කොන්දේසි නිශ්චය කරනු ලැබ ඇති කල්හි, ආධුනිකයෙකු වශයෙන් හෝ පුහුණුවන්නකු වශයෙන් ඒ කර්මාන්තයේ සේවයෙහි යම් කම්කරුවකු යෙදවීමේ දී ඒ කර්මාන්තයේ සෑම සේවායෝජකයකු විසින් ම එකී කොන්දේසි සම්පූර්ණ කළ යුතුය.

(3) පඩි පාලක සභාවක් පිහිටුවා තිබෙන යම් කර්මාන්තයක කිසිම සේවායෝජකයකු විසින්, කම්කරු කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරය නොමැතිව, ආධුනිකයකු වශයෙන් හෝ පුහුණුවන්නකු වශයෙන් ඒ කර්මාන්තයේ සේවයෙහි කම්කරුවකු නොයෙදවිය යුතුය. ආධුනිකයන් වශයෙන් හෝ

පුහුණුවන්නන් වශයෙන් කම්කරුවන් සේවයෙහි යෙදවීම සම්බන්ධයෙන් පොදුවේ හෝ යම් විශේෂ පන්තියක ආධුනිකයන් වශයෙන් හෝ පුහුණුවන්නන් වශයෙන් කම්කරුවන් සේවයෙහි යෙදවීම සම්බන්ධයෙන් විශේෂ වශයෙන් හෝ ඒ අවසරය දෙනු ලැබිය හැකි ය.

(4) පඩි පාලක සභාවක් පිහිටුවා තිබෙන යම් කර්මාන්තයක සේවායෝජකයකු ආධුනිකයන් හෝ පුහුණුවන්නන් පුහුණු කිරීම සඳහා පහසුකම් නොසලස්වන බවට හෝ (1) වන උපවගන්තිය යටතේ ඒ සභාව විසින් නිශ්චය කරනු ලබන කොන්දේසි සම්පූර්ණ නොකරන බවට, හෝ (5) උපවගන්තියේ විධිවිධාන නොපිළිපදින බවට හෝ කම්කරු කොමසාරිස්වරයා සෑහීමට පත්වන අවස්ථාවකදී, (3) වන උපවගන්තිය යටතේ තමා විසින් ඒ සේවායෝජකයාට නිකුත් කරන ලද යම් අවසරයක් කම්කරු කොමසාරිස් විසින් ඉවත් කර ගත හැකිය.

(5) අවම පඩි ප්‍රමාණයක් අදාළ වන තැනැත්තකු වන යම් කර්මාන්තයක කම්කරුවකු, ආධුනිකයකු වශයෙන් හෝ පුහුණුවන්නකු වශයෙන් හෝ සේවයෙහි යොදනු ලබන අවස්ථාවක දී, ඔහුගේ සේවා යෝජකයා විසින්, ඔහුගෙන් කෙලින් ම හෝ අන්‍යාකාරයකින් හෝ ඔහු වෙනුවෙන් හෝ, ඔහු ගණනේ හෝ කිසිම ගෙවීමක් ඔහුගෙන් ගාස්තුවක් වශයෙන් භාර නොගත යුතුය.

එසේ වුව ද, ඒ සේවයක් ආරම්භ වූ කාලයේ දී හෝ ඒ කාලය ආසන්නයේ දී බැඳුණු ලිඛිත ගිවිසුමක් අනුව සේවය ආරම්භ වීමෙන් පසු සති හතරකට වඩා ප්‍රමාද නොවී යථා පරිදි කරන ලද එවැනි යම් ගෙවීමකට, මේ උපවගන්තියේ ඉහත දැක්වෙන විධිවිධාන අදාල නොවන්නේය.

## සේවායෝජකයින්ගේ කාර්ය

ලේඛන තැබීම සේවායෝජකයා ගේ කාර්යය බව

41. (1) පඩි පාලක සභාවක් පිහිටුවා ඇති යම් කර්මාන්තයක සේවය කරන කම්කරුවන්ගේ සේවායෝජකයකු විසින්, එකී කර්මාන්තය ගෙන යන ස්ථානයෙහි, එක් එක් පඩි කාලය සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු පෙන්වන ලේඛනයක් හෝ ලේඛන තබාගෙන පවත්වාගෙන යා යුතුය.

(1957 අංක 27 14 වන වගන්තිය)

(අ) ඔහු විසින් සේවයේ නියුක්ත කරන සෑම කම්කරුවකුගේ ම නම සහ ස්ත්‍රී පුරුෂ භාවය, ස්ත්‍රියක නම් නැතහොත් වයස අවුරුදු දහඅටට අඩු කම්කරුවකු නම් එවැන්නකුගේ වයස;

(ආ) සේවයේ නියුක්ත කරන ලද කම්කරුවා විසින් කරනු ලබන වැඩෙහි වර්ගය;

(ඇ) ඒ එක් එක් කම්කරුවාට ගෙවන පඩිය;

(ඈ) ඒ එක් එක් කම්කරුවා වැඩ කරන පැය ගණන;

(ඉ) ඒ එක් එක් කම්කරුවා අතිකාල වැඩ කරන පැය ගණන;

(ඊ) ඒ එක් එක් කම්කරුවාට පඩි ගෙවන දිනයන්;

Labour Department of Sri Lanka

(ඩ) ඒ එක් එක් කම්කරුවාට ඉඩ හැර තිබෙන නිවාඩු දින;

(ඪ) ඒ එක් එක් කම්කරු ස්ත්‍රියකට සූතිකාධාර වශයෙන් ගෙවන ආධාර මුදල් ප්‍රමාණය; හා

(ණ) නියෝග වලින් නියම කරන ලද හෝ පඩිපාලක සභාවක තීරණයක් අනුව අවශ්‍ය වෙනත් විස්තර.

(1957 අංක 27 10(ආ) වන වගන්තිය)

(1අ) (1) වන උපවගන්තිය යටතේ තබනු ලබන ලේඛනයක් පඩි කාලයක් සම්බන්ධයෙන් ඇතුළත් කරනු ලැබීමට ඒ උපවගන්තිය මගින් නියම කරනු ලබන විස්තර ඒ පඩි කාලය ඉකුත් වූ වහාම ඇතුළත් කරනු ලැබිය යුතු ය. තවද ඒ උපවගන්තියේ (ඇ) හා (ඉ) ඡේද යටතේ ඒ ලේඛනයෙහි ඇතුළත් කරනු ලබන විස්තර ඒ විස්තර අදාළ වන පඩි කාලයේ එක් එක් දිනය සම්බන්ධයෙන් විය යුතුය.

(2019 අංක 14, 3 වන වගන්තිය)

(2) සේවායෝජකයකු වශයෙන් (1) වන උපවගන්තිය යටතේ යම් පඩි කාලයක් සම්බන්ධයෙන් යම් ලේඛනයක් තබන හෝ තබා ගෙන ඇති සෑම තැනැත්තකු ම ඒ පඩි කාලයේ අවසන් දින සිට ආරම්භ වන වසර හයක කාලයක් ඒ ලේඛනය සුරක්ෂිතව තබා ගත යුතුය. තවද කම්කරු කොමසාරිස්වරයා විසින් හෝ යම් නියමිත නිලධරයකු විසින් හෝ නියම කරනු ලැබූ විට, පරීක්ෂා කර බැලීම සඳහා ඒ ලේඛනය ඉදිරිපත් කොට, ඒ ලේඛනයේ හෝ ඒ ලේඛනයේ යම් කොටසක හෝ සැබෑ පිටපතක් ඉදිරිපත් කළ යුතුය. නැතහොත් එවැනි පිටපතක් සකස් කිරීමට ඉඩ දිය යුතුය.

සේවායෝජක යන් විසින් දැන්වීම් ප්‍රදර්ශනය කිරීම.

(1957 අංක 27 11 වන වගන්තිය)

42. පඩි පාලක සභාවක් පිහිටුවා ඇති යම්කිසි කර්මාන්තයක සේවය කරන කම්කරුවන්ගේ සේවායෝජකයා විසින්, එකී සභාවෙහි බලාත්මක තීරණ ඇතුළත් දැන්වීමක්, නියම කරනු ලැබිය හැකි වෙනත් කරුණු පිළිබඳව විස්තර ද සහිතව, නියමිත ස්ථානයක නියමිත ආකාරයට ප්‍රදර්ශනය කොට තැබිය යුතු ය.

පිටත වැඩ ලබා දෙන අය විසින් ලේඛන පොතක් තැබිය යුතු බව.

43. පඩි පාලක සභාවක් පිහිටුවා ඇති යම් කර්මාන්තයක පිට අයට වැඩ ලබා දෙන සෑම තැනැත්තකු ම එබඳු වැඩ ලබාදීමට පාවිච්චි කරන ස්ථානයෙහි, නියමිත ආකෘතියකට අනුව, ඒ වැඩ සම්බන්ධව ද, කම්කරුවන් සම්බන්ධව ද ඒ වැඩ සඳහා ගෙවන ලද මුදල පිළිබඳව ද නියමිත විස්තර ඇතුළත් ලේඛනයක් තබා පවත්වාගෙන යා යුතුය.

සේවායෝජක යන් විසින් වෙනත් වාර්තා තැබීම.

(1957 අංක 27, 12 වන වගන්තිය)

43අ. පඩි පාලක සභාවක් පිහිටුවා ඇති යම් කර්මාන්තයක සේවායෝජකයන් විසින්, මේ ආඥාපනතේ අන් කිසි විධිවිධාන මගින් ඔවුන් විසින් තබනු ලැබීමට නියමිත ලේඛනවලට හෝ වාර්තාවලට අතිරේකව, නියෝගවල සඳහන් කරනු ලැබිය හැකි අන්දමේ වෙනත් වාර්තා එසේ සඳහන් කරනු ලැබිය හැකි ආකෘතියක් අනුව හා එබඳු කරුණු පිළිබඳ එසේ සඳහන් කරනු ලැබිය හැකි විස්තර ඇතුළත්ව තබන සේ නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකිය.

Labour Department of Sri Lanka

## වැරදි

44. (1) 21 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව යම් සේවකයකුට පඩි ගෙවීම පැහැර හරින ලද සෑම සේවායෝජකයකු ම වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් පන්දහසකට අඩු නොවන සහ රුපියල් දසදහසක් නොඉක්මවන දඩ මුදලකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම සහ ඊට අමතරව එසේ වරදකරු කිරීමෙන් පසුව එම වරද දිගට ම කරගෙන යෑමේ දී එම සෑම එක් එක් දිනයක් සඳහා ම රුපියල් පන්සියයක් නොඉක්මවන දඩ මුදලකට ඔහු යටත් විය යුතු ය.

පඩි ගෙවීම පැහැර හැරීම ආදිය සම්බන්ධයෙන් දණ්ඩනය

(2019 අංක 14, 4 (1) වන වගන්තිය

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් සේවායෝජකයෙකු නොවන මේ අඥාපනතේ මේ කොටසේ විධිවිධාන ප්‍රකාරව හෝ පඩි පාලක සභාවේ යම් තීරණයක් ප්‍රකාරව යම් සේවකයකුට ගෙවීම් කිරීම පැහැර හරිනු ලබන යම් සේවායෝජකයකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් පන්දහසකට අඩු නොවන සහ රුපියල් දසදහසක් නොඉක්මවන දඩ මුදලකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම සහ ඊට අමතරව එසේ වරදකරු කිරීමෙන් පසුව එම වරද දිගට ම කරගෙන යෑමේ දී එම සෑම එක් එක් දිනයක් සඳහා ම රුපියල් පන්සියයක් නොඉක්මවන දඩ මුදලකට ඔහු යටත් විය යුතුය

(2019 අංක 14, 4 (2) වන වගන්තිය

(1982 අංක 36 4 වන වගන්තිය)

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ සේවායෝජකයකු වරදකරු කරනු ලැබූ විටක අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව -

(1966 අංක 23 3(2) වන වගන්තිය)

(අ) කම්කරුවකුට නිසි ලෙස ගෙවිය යුතුව තිබූ මුදල ඒ කම්කරුවාට නොගෙවන ලද අවස්ථාවක, අධිකරණය විසින් දැනගනු ලබන ඒ මුදල හා ඇත්ත වශයෙන් ගෙවන ලද මුදල අතර ඇති වෙනසකට සමාන මුදල සහ 4 වන වගන්තියේ (2අ) උපවගන්තියෙහි දක්වා ඇති ආකාරයට ගණන් බලනු ලැබූ අධිභාරය; හෝ

(ආ) ඒ කම්කරුවාට ලැබිය යුතු පඩියෙන් කිසිම පංගුවක්, නොගෙවන ලද අවස්ථාවක, අධිකරණය විසින් දැන ගනු ලබන ඒ පඩිවලට සමාන මුදල සහ 4 වන වගන්තියේ (2අ) උපවගන්තියෙහි දක්වා ඇති ආකාරයට ගණන් බලනු ලැබූ අධිභාරය

ගෙවීමට සේවායෝජකයාට අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකිය.”

Labour Department of Sri Lanka

(4) යම් මුදල් ප්‍රමාණයක් ගෙවන ලෙස (3) වන උපවගන්තිය යටතේ ආඥාවක් කිරීමට අධිකරණයට ඇති බලය වෙනත් යම් නඩු කටයුත්තක් මගින් ඒ මුදල අය කර ගැනීමට කම්කරුවා සතු යම් අයිතිවාසිකමක බලහීන කිරීමක් නොවන්නේ ය.

ආසන්නම සේවායෝජකයා වෙනත් අයකු යටතේ සේවය කරන්නෙකු වීම.

45. කම්කරුවෙකුගේ ආසන්නම සේවායෝජකයා ද වෙනත් තැනැත්තකු යටතේ සේවා නියුක්තියෙහි යෙදී සිටින හා ඒ කම්කරුවා එකී වෙනත් තැනැත්තාගේ කර්මාන්තයෙහි හා ඒ කර්මාන්තයේ කාර්ය සඳහා වැඩක යොදවනු ලැබ සිටී නම්, මේ ආඥාපනතෙහි කාර්යය සඳහා එකී වෙනත් තැනැත්තා, ආසන්නම සේවායෝජකයා සමග හවුලේ ඒ කම්කරුවාගේ සේවායෝජකයා ලෙස සලකනු ලැබිය යුතු ය.

උප කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලැබූ කම්කරුවකුට ලැබිය යුතු පඩි පිළිබඳව කොන්ත්‍රාත්කරුගේ වගකීම. (1957 අංක 27, 14 වන වගන්තිය)

45අ. යම් වැඩක් කිරීමට භාර ගෙන සිටින (මේ වගන්තියේ මින්පසු කොන්ත්‍රාත්කරු යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකු (මේ වගන්තියේ මින්පසු උපකොන්ත්‍රාත්කරු යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් යම් තැනැත්තකු සමග, ඒ වැඩය සම්පූර්ණයෙන් හෝ එහි යම් කොටසක් හෝ කිරීම සඳහා, ගිවිසුමකට බැඳෙන අවස්ථාවක දී, ඒ ගිවිසුම ක්‍රියාවේ යෙදීමෙහි ලා තමා විසින් සේවයෙහි යොදවනු ලැබූ යම් කම්කරුවකුට 21 වන වගන්තිය අනුව පඩි ගෙවීම උප කොන්ත්‍රාත්කරු පැහැර හැරියොත්, ඒ වගන්තිය අනුව ඒ කම්කරුවාට ලැබිය යුතු පඩි මුදල් ගෙවීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටින්නේ ය.

මෙම ආඥාපනත යටතේ කම්කරුවන්ට ලැබිය යුතු මුදල් අය කර ගැනීම.

46. (1) මෙම ආඥාපනතේ විධිවිධාන අනුව යම් කම්කරුවකුට පඩි මුදලක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් සේවායෝජකයකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 148 වන වගන්තිය යටතේ සේවා යෝජකයා එසේ වරදකරු කරනු ලැබූ වරද පිළිබඳව අධිකරණයට පැමිණිලි, කරන ලද දිනයට ඉහතින් අවුරුදු හයක කාලසීමාව අතරතුර කවර අවස්ථාවක දී වුව ද, ඒ කම්කරුවාට හෝ වෙනත් යම් කම්කරුවෙකුට හෝ වෙනත් යම් කම්කරුවන්ට හෝ මෙම ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව යම් ගෙවීමක් කිරීම ඒ සේවායෝජකයා විසින් පැහැර හැරීම සම්බන්ධයෙන් සාක්ෂි දීමට අදහස් කරන බවට, නියමිත ආකෘතියෙහි වූ දැන්වීමක් ඒ නඩු විභාගය ආරම්භ වන දිනයට පෙර යම් අවස්ථාවක, ඒ සේවායෝජකයා වෙත භාර දෙනු ලැබ ඇත්නම්, එසේ සාක්ෂි දෙනු ලැබිය හැකි අතර, එකී පැහැර හැරීම ඔප්පු කළ විට, සේවායෝජකයාගෙන් එකී කම්කරුවාට හෝ කම්කරුවන්ට හෝ අය විය යුතු යයි අධිකරණය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් මුදලක් ගෙවන ලෙස අධිකරණය විසින් ඒ සේවායෝජකයාට ආඥා කරනු ලැබිය හැකි ය. ගෙවන ලෙස මේ උපවගන්තිය යටතේ ආඥා කරනු ලැබූ යම් මුදලක් දඩ මුදලක් අය කර ගන්නා ආකාරයට ම අය කරගත හැකි ය. (2019 අංක 14 5 වන වගන්තිය) (1957 අංක 27, 15 වන වගන්තිය)

(2) (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කිරීමට අධිකරණයට ඇති බලය නිසා, තමාට අය විය යුතු යම් මුදලක් වෙනත් යම් නඩු කටයුත්තක් මාර්ගයෙන් අය කර ගැනීමට කම්කරුවකුට ඇති අයිතිවාසිකමක බලහීන නොවන්නේ ය. (1957 අංක 27, 15 වන වගන්තිය)

Labour Department of Sri Lanka

(3) යම් කම්කරුවකුට තම සේවායෝජකයා විසින් ගෙවිය යුතු බවට මේ පනතින් හෝ පඩිපාලක සභාවක තීරණයකින් හෝ නියමිත පරිදි පඩි මුදලක් හෝ ගෙවීම් කිසිවක්, සම්පූර්ණයෙන් නැතහොත් ඉන් කොටසක් නොගෙවන ලද අවස්ථාවක එම මුදල් හෝ ඉතිරි මුදල් හෝ ඉහත සඳහන් කම්කරුවාට ගෙවීම පිණිස, දැන්වීමෙහි සඳහන් කාලයක් ඇතුළත දී එකී සේවායෝජකයා විසින් කම්කරු කොමසාරිස්වරයාට ගෙවිය යුතු යයි ලිඛිත දැන්වීමකින් එකී සේවායෝජකයාට නියම කිරීම යෝග්‍ය යයි කම්කරු කොමසාරිස්වරයා අදහස් කරන්නේ නම්, එම මුදල හෝ ඉතිරි මුදල් හෝ එසේ ගෙවන ලෙස කම්කරු කොමසාරිස්වරයා විසින් ඒ සේවායෝජකයාට එසේ නියම කළ හැකි ය. එවැනි දැන්වීමක් භාර කරවනු ලැබූ විට එකී සේවායෝජකයා විසින් එම මුදල හෝ ඉතිරි මුදල ඉහත සඳහන් දැන්වීමෙන් නියමිත පරිදි කම්කරු කොමසාරිස්වරයා වෙත යැවීම වෙනුවට ඉහත සඳහන් කම්කරුවාට කෙළින් ම ගෙවන ලද නම් එකී කම්කරුවාට එම මුදල හෝ ඉතිරි මුදල හෝ ඔහු විසින් ගෙවනු නොලැබුවාක් සේ සැලකිය යුතුය.

ඔප්පු කිරීමේ භාරය

47. (අ) මෙම ආඥාපනතෙහි විධිවිධාන අනුව යම් කම්කරුවකුට යම් මුදලක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් යම් සේවායෝජකයෙකුට විරුද්ධ ව නඩු පවරනු ලබන අවස්ථාවක දී හෝ

(ආ) මෙම ආඥාපනතේ විධිවිධාන අනුව යම් කම්කරුවකුට යම් මුදලක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් යම් සේවායෝජකයකු වරදකරු කරනු ලැබ සිටින යම් නඩුවක දී, මෙම ආඥාපනතේ විධිවිධාන අනුව යම් මුදලක් ඒ කම්කරුවාට හෝ අන් කිසි කම්කරුවකුට හෝ කම්කරුවන්ට හෝ ගෙවීම පිළිබඳ ව ඒ සේවායෝජකයාගේ අන් කිසි පැහැර හැරීමක් ගැන 46 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාක්ෂි දෙනු ලබන අවස්ථාවක දී, (1957 අංක 27, 16 වන වගන්තිය)

ඒ මුදල ගෙවන ලදැයි ඔප්පු කිරීමේ භාරය, ඒ සේවායෝජකයා වෙත, පැවරෙන්නේ ය.

සේවායෝජකයා විසින් කරන වැරදි.

48. (1) (අ) මේ ආඥාපනත යටතේ පඩි පාලක සභාවක තීරණයක් අනුව දිය යුතු වූ නිවාඩු දවසක්, කම්කරුවකුට නිවාඩු දීම පැහැර හරින්නා වූ නැතහොත් දීම ප්‍රතික්ෂේප කරන්නා වූ හෝ

(ආ) 39 වන වගන්තිය යටතේ කම්කරුවකු සම්බන්ධයෙන් නිකුත් කරන ලද අවසර පත්‍රයක නියමයන් කඩ කරන්නා වූ හෝ

(ඇ) පඩි පාලක සභාවක තීරණයකට යම් කිසි විධිවිධානයක් පිළිපැදීම පැහැර හරින්නා වූ, හෝ

සෑම සේවායෝජකයෙක් ම වරදක් කරන අතර, රුපියල් පන්දහසක් නොඉක්මවන (2019 අංක 14, 6 වන වගන්තිය)

Labour Department of Sri Lanka

දඩ මුදලකට හෝ හය මාසයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

(2) කම්කරුවකු සම්බන්ධයෙන් 39 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක ඇතුළත්, එහි නිශ්චිතව සඳහන් කරන ලද පඩි ප්‍රමාණයට අඩු නොවන ගෙවීම් ප්‍රමාණයක් අනුව එකී කම්කරුවාට ගෙවීම් කළ යුතු ය යන කොන්දේසිය කඩ කිරීම සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ සේවායෝජකයකු වරදකරු කරනු ලැබූ විට එකී කම්කරුවාට ගෙවිය යුතු පඩියෙන් කිසි කොටසක් නොගෙවනු ලැබ ඇත්නම් වෙනත් දණ්ඩන නියමයකට අතිරේකව, ඒ පඩි ගෙවන ලෙස හෝ පඩියෙන් කොටසක් පමණක් ගෙවා ඇත්නම් ඉතිරි මුදල ගෙවන ලෙස අධිකරණය විසින් සේවායෝජකයාට ආඥා කරනු ලැබිය හැකි ය. ගෙවිය යුතු යයි මෙම උපවගන්තිය යටතේ ආඥා කරනු ලැබූ යම් මුදලක්, දඩ මුදලක් අය කර ගන්නා ආකාරයට ම අයකර ගත හැකි ය.

(1957 අංක 27, 17 වන වගන්තිය)

(3) පඩි පාලක සභාවක යම් තීරණයක් යටතේ කම්කරුවකුට දෙනු ලැබීමට නියමිත යම් නිවාඩු දිනයක් ඒ කම්කරුවාට දීම පැහැර හැරීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ වරදට (1) වන උපවගන්තිය යටතේ සේවායෝජකයකු වරදකරු කරනු ලැබූ විට, ඒ නිවාඩු දිනය සම්බන්ධයෙන් ඒ කම්කරුවාට ලැබිය යුතු පාරිශ්‍රමිකයෙන් කිසිම කොටසක් නොගෙවා ඇති අවස්ථාවක දී, ඒ පාරිශ්‍රමිකය ගෙවන ලෙස හෝ ඒ පාරිශ්‍රමිකයේ කොටසක් පමණක් ගෙවා ඇති අවස්ථාවක දී ඉතිරි කොටස ගෙවන ලෙස හෝ අන් කිසි දණ්ඩන නියමයකට අතිරේක ව අධිකරණය විසින් ආඥා කළ හැකි ය. ගෙවිය යුතු යයි මෙම උපවගන්තිය යටතේ ආඥා කරනු ලබන යම් මුදලක්, දඩ මුදලක් අයකර ගන්නා ආකාරයට ම අය කර ගත හැකි ය.

Labour Department of Sri Lanka

කම්කරුවකු පඩි පාලක සභාවක සාමාජිකයකු වීම ආදී කරුණු නිසා කම්කරුවකු අස් කිරීම.

49. (1) කම්කරුවකු -

(අ) පඩි පාලක සභාවක සාමාජිකයකු ව සිටීම හෝ සාමාජිකත්වය ලැබීම; හෝ

(ආ) මෙම ආඥාපනත යටතේ වූ කරුණු සම්බන්ධයෙන් වෙනත් අධිකාරියකට තොරතුරු සැපයීම; හෝ

(ඇ) පඩි පාලක සභාවක සාමාජිකයෙකු වශයෙන් තම කාර්යය ඉටු කිරීමෙහි යෙදී සිටීම හේතු කොට ගෙන, තමන්ගේ සේවායෝජකයාට සාධාරණ කාලයක් කලින් දැනුම් දීමෙන් පසු වැඩට නොගොස් සිටීම; හෝ

(ඈ) පඩි පාලක සභාවක තීරණයක් යටතේ යම්කිසි ප්‍රතිලාභයකට හිමිව සිටීම;

නිසාම පමණක් සේවයෙන් අස්කරන සෑම සේවායෝජකයෙක් ම වරදක් කරන අතර රුපියල් දහසකට නොවැඩි දඩයකට හෝ හය මාසයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයකින් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් වන්නේය.

(2) (1) වන උපවගන්තිය යටතේ සේවායෝජකයෙකුට විරුද්ධව පවරන ලද සෑම නඩුවක දී ම, කම්කරුවා අස්කරන ලද්දේ එම උපවගන්තියෙහි සඳහන් කරුණක් නිසා නොව වෙනත් යම් කරුණක් නිසා බව ඔප්පු කිරීමේ භාරය ඒ සේවායෝජකයා වෙත පැවරෙන්නේ ය.

40 වන වගන්තිය කඩ කොට ගාස්තුව ලබා ගැනීම.

(2019 අංක 14, 7 වන වගන්තිය)

50. (1) 40 වන වගන්තියේ යම් විධිවිධානයක් උල්ලංඝනය කරමින් ගාස්තුවක් ලබා ගන්නා සෑම සේවායෝජකයෙක් ම වරදක් කරන අතර රුපියල් පන්දහසකට අඩු නොවන දඩයකට හෝ මාස දොළහක් නොඉක්මවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියම් කරනු ලබන දණ්ඩන නියමයකට අතිරේකව, 40 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කර ලබාගෙන ඇතැයි සලකන මුදල ගෙවන ලෙස අධිකරණය විසින් සේවායෝජකයාට ආඥා කළ හැකිය. මේ උපවගන්තිය යටතේ ගෙවනු ලැබීමට නියම කරනු ලබන යම් මුදලක් දඩ මුදලක් අයකර ගන්නා ආකාරයටම අයකර ගනු ලැබිය හැකිය.

17 වන වගන්තියේ (2) වන උපවගන්තිය කඩ කොට තොරතුරු එළිදරව් කිරීම.

(2019 අංක 14, 8 වන වගන්තිය)

51. 17 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය වන පරිදි තොරතුරක් එළිදරව් කරන හෝ වෙනත් යම් ක්‍රියාවක් කරන සෑම තැනැත්තෙකු ම වරදක් කරන අතර රුපියල් පන්දහසකට අඩු නොවන දඩයකට හෝ මාස දොළහක් නොඉක්මවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේය.

## III වන කොටස

### සාමාන්‍ය

### නිලධරයන් පත් කිරීම සහ ඔවුන්ගේ බලතල ආදිය

නිලධරයන් පත් කිරීම.

52. (1) මේ ආඥාපනතේ විධිවිධාන ක්‍රියාවෙහි යෙදවීම හෝ බලාත්මක කිරීම සඳහා කලින් කල අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයින් සංඛ්‍යාවක් පත් කරගත හැකිය.

(1967.03.08 දින අංක 14739 දරන ගැසට් පත්‍රය.)

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන සෑම තැනැත්තෙක් ම නමින් හෝ ධූර නාමයෙන් හෝ පත් කළ හැකිය.

තමා වෙනුවට වැඩ කිරීම සඳහා වෙනත් නිලධාරියෙකුට කොමසාරිස්වරයා විසින් බලය පැවරීම.

53. මේ ආඥාපනත යටතේ කොමසාරිස්වරයාට අයත් බලයක් හෝ කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාවේ යෙදීමට හෝ කිරීමට, හෝ ඉටු කිරීමට,



Labour Department of Sri Lanka

නියෝජ්‍ය කොමසාරිස්වරයෙකුට හෝ 52 වන වගන්තිය යටතේ පත් කරන ලද වෙනත් තැනැත්තෙකුට හෝ කොමසාරිස්වරයා විසින් පොදුවේ හෝ විශේෂයෙන් බලය පැවරිය හැකිය.

වාර්තා ආදිය කැඳවීමට කොමසාරිස්වරයාට ඇති බලය.

54. (1) යම් කර්මාන්තයක හෝ යම් පන්තියක කර්මාන්තවල කම්කරුවන් සේවයේ යොදවන සේවායෝජකයකු විසින් හෝ පිටතින් එන කම්කරුවන්ට යම් කර්මාන්තයක වැඩ සපයන යම් තැනැත්තකු විසින් හෝ පිටතින් එන කම්කරුවන්ට යම් පන්තියක කර්මාන්තවල වැඩ සපයන සෑම තැනැත්තකු ම විසින් හෝ -

(අ) කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් විස්තර අඩංගු වාර්තාවක්;

(ආ) එසේ සපයන ලද වාර්තාවක සඳහන් යම් විස්තර සම්බන්ධයෙන් කොමසාරිස්වරයාට අවශ්‍ය විය හැකි යම් තොරතුරක් පැහැදිලි කිරීමක් ; හෝ

(ඇ) මේ ආඥාපනතින් හෝ මේ ආඥාපනත යටතේ හෝ සේවායෝජකයකු විසින් නැතහොත් තැනැත්තකු විසින් තබාගත යුතු යයි නියමිත යම් ලේඛනයක හෝ පඩි වාර්තාවක නැතහොත් එවැනි ලේඛනයකින් හෝ වාර්තාවකින් කොටසක සත්‍ය පිටපතක්

යම් නිශ්චිත දිනයකට පෙර සැපයිය යුතු යයි කොමසාරිස්වරයා විසින් කවර අවස්ථාවක වුව ද විධාන කළ හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන විධානයක්, ගැසට් පත්‍රයෙහි සහ ලංකාවේ බෙදා හරිනු ලබන ප්‍රවෘත්ති පත්‍ර දෙකක හෝ වැඩි ගණනක දැන්වීමක් පළ කරවීමෙන්, කළ හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වාර්තාවක් හෝ තොරතුරක් සපයන සේවායෝජකයකු හෝ වෙනත් තැනැත්තකු හෝ විසින් එම වාර්තාව හෝ තොරතුර සමගම එය රහස්‍ය වාර්තාවක් හෝ තොරතුරක් වශයෙන් සලකන ලෙස ලියවිල්ලකින් ඉල්ලා සිටිය හැකි ය. එවැනි ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක සේවායෝජකයාගේ හෝ ඉල්ලීම කළ තැනැත්තාගේ හෝ කැමැත්ත කලින් ලබා නොගෙන ඒ ඉල්ලීමට සම්බන්ධ වූ වාර්තාව හෝ තොරතුරක් එළිදරව් නොකළ යුතු ය.

(4) වාර්තාවක ඇතුළත් වුව ද, නුවුව ද, (1) වන උපවගන්තිය යටතේ සැපයුනු කිසිම තොරතුරක්, කොමසාරිස්වරයා විසින් හෝ ඔහුගේ අවසරය ඇතිව හෝ සාදන ලද වාර්තාවක නැතහොත් නිකුත් කරන ලද ප්‍රකාශනයක, ඒ තොරතුර යම්කිසි සේවායෝජකයෙකු හෝ වෙනයම් තැනැත්තෙකු හෝ සම්බන්ධ වූ තොරතුරක් යයි හැඳින ගැනීම පහසු ආකාරයට පිළියෙල කොට නොතිබිය යුතු ය.

Labour Department of Sri Lanka

(5) මේ ආඥාපනත නොවන වෙනත් ලිඛිත නීතියක විධිවිධාන මගින් හෝ යටතේ හෝ යම් තැනැත්තෙකු විසින් එළිදරව් නොකළ යුතු යයි තහනම් කරන ලද තොරතුරක් එළිදරව් කිරීමට හෝ, ඉදිරිපත් නොකළ යුතු යයි තහනම් කරන ලද ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට හෝ මේ වගන්තියේ මීට ඉහතින් ඇති විධිවිධාන කිසිවක් ඒ තැනැත්තාට නියම කැරෙන්නාක් සේ හෝ අවසර ලැබෙන්නාක් සේ හෝ නොසැලකිය යුතුය.

නියමිත නිලධරයන්ගේ බලතල

55. (1) නියම කළ හැකි කොන්දේසිවලට සහ සීමා කිරීම් වලට යටත්ව සෑම නියමිත නිලධරයකුට ම පහත දැක්වෙන කටයුතු කිරීමට බලය ඇත්තේ ය. එනම් :-

(1966 අංක 24, 2 වන වගන්තිය)

(අ) මේ ආඥාපනතින් හෝ මේ ආඥාපනත යටතේ තැබිය යුතු හෝ ප්‍රදර්ශනය කළ යුතු ලේඛන පොතක් හෝ පඩි වාර්තා පොතක් හෝ දැන්වීමක් හෝ පරීක්ෂා කිරීම සඳහා හෝ මේ පනතේ විධිවිධාන පිළිපදිනු ලැබේදැයි දැනගැනීම සඳහා හෝ යම්කිසි කර්මාන්තයක කම්කරුවන් සේවයෙහි යොදවා සිටින පරිශ්‍රයකට හෝ ස්ථානයකට, නැතහොත් කර්මාන්තයක පිටතින් එන්නන්ට වැඩ සපයන ස්ථානයකට, දවල් කාලයේ හෝ රාත්‍රී කාලයේ, සෑම යුක්ති සහගත වේලාවකම ඇතුල් ව පරීක්ෂා කිරීම;

(ආ) එවැනි පරිශ්‍රයක් හෝ ස්ථානයක් පරීක්ෂා කිරීමේ දී එකී ලේඛන පොත හෝ වාර්තාව පරීක්ෂා කිරීම සඳහා ලබා ගැනීමට නොමැති අවස්ථාවක දී, එම පරිශ්‍රයේ දී හෝ ස්ථානයෙහි දී නැතහොත් තමාගේ කාර්යාලයෙහි දී හෝ එකී ලේඛන පොත හෝ වාර්තාව, පරීක්ෂා කර බැලීම සඳහා, නිශ්චිත දිනක ඉදිරිපත් කරන ලෙස නියම කිරීම;

(1957 අංක 27, 18(2) වන වගන්තිය)

(ඇ) මේ ආඥාපනතේ විධිවිධාන පිළිපදිනු ලැබේ දැයි දැන ගැනීමේ කාර්යය සඳහා, පඩි පාලක සභාවක් පිහිටුවා තිබෙන කර්මාන්තයක සේවායෝජකයෙකු විසින් සේවයෙහි යොදනු ලබන යම් කම්කරුවන් සඳහා වාසස්ථානයක් වශයෙන් ඒ සේවායෝජකයා විසින් පිළියෙල කොට තිබේය යයි විශ්වාස කිරීමට තමාට කරුණු ඇති යම් ස්ථානයකට, දවල් කාලයේ හෝ රාත්‍රී කාලයේ සෑම යුක්තිසහගත වේලාවක ම ඇතුළු වී පරීක්ෂා කිරීම ;

(ඈ) එවැනි පරිශ්‍රයකදී හෝ ස්ථානයක දී හමුවන්නා වූ ද, එකී පරිශ්‍රයේ හෝ ස්ථානයෙහි කර්මාන්තයක් කර ගෙන යන සේවායෝජකයකු යයි හෝ එහි සේවයේ යෙදී සිටින නැතහොත් සේවයේ නියුක්ත කර සිටින කම්කරුවකු යයි හෝ එම පරිශ්‍රයෙහි හෝ ස්ථානයෙහි වැඩ සපයනු ලබන යම් කම්කරුවකු යයි හෝ විශ්වාස කිරීමට සෑහෙන කරුණු ඇත්තා වූ ද තැනැත්තකු විභාග කිරීම; හා

Labour Department of Sri Lanka

(ඉ) එවැනි ලේඛන පොතක හෝ ඉන් කොටසක හෝ පඩි වාර්තා පොතක හෝ ඉන් කොටසක හෝ දැන්වීමක හෝ ඉන් කොටසක හෝ පිටපත් ගැනීම;

(ඊ) යම් තැනැත්තකු විසින් යම් කර්මාන්තයක කම්කරුවන් යම් පරිශ්‍රයක හෝ ස්ථානයක සේවයෙහි යෙදවීම නවතා ඇති අවස්ථාවක, ඒ පරිශ්‍රයෙහි හෝ ස්ථානයෙහි සේවයෙහි යොදවනු ලැබූ කම්කරුවන් සම්බන්ධයෙන් මේ ආඥාපනත යටතේ තබා ගැනීමට නියමිත යම් ලේඛනයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීම; (1966 අංක 24, 2 වන වගන්තිය)

(උ) යම් කර්මාන්තයක් පිළිබඳ ව වූ හෝ යම් පන්තියක කර්මාන්ත නැතහොත් පිටත කම්කරුවන් පිළිබඳ ව වූ යම් ගිවිසුමක්, එකී නිලධරයා විසින් නිශ්චය කරනු ලබන යම් ස්ථානයක දී කැඳවීම, පරීක්ෂා කිරීම සහ ඒවායේ පිටපත් පිළියෙල කිරීම;

(ඌ) යම් පරිශ්‍රයක හෝ ස්ථානයක යම් කර්මාන්තයක් සඳහා කම්කරුවන් සේවයේ නියුක්ත කරවීමෙහි ලා, මේ ආඥාපනතේ විධිවිධාන පිළිපැද තිබේදැයි දැන ගැනීම සඳහා, යම් තැනැත්තෙකුට ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය හැකි දිනයක, එසේ නියම කරනු ලබන වේලාවක දී යම් ස්ථානයකට පැමිණ සිටින ලෙස ද, එම නිලධරයාට අවශ්‍ය විය හැකි යම් තොරතුරු හෝ පැහැදිලි කිරීම් හෝ සපයන ලෙස ද, ඒ නිලධරයා විසින් විමසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දෙන ලෙස ද එකී නිලධරයා විසින් නියම කිරීම.

(2) ඉන්දියානු වතු කම්කරු ආඥාපනතෙහි 3 වන වගන්තියෙන් අර්ථකථනය කරන ලද යම්කිසි කම්කරුවකු සේවයෙහි නියුක්ත කර ඇති කර්මාන්තයක් සඳහා පඩි පාලක සභාවක් පිහිටුවනු ලැබූ කල්හි, ඉන්දියානු ආගාමික කම්කරු ආඥාපනතෙහි 8 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ නියෝජිතයෙක් ද, ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ නිලධරයෙක් ද එම කර්මාන්ත සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ නියමිත නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය. තවද ඒ ඒ අනුව එම උපවගන්තිය යටතේ නියමිත නිලධරයකුට අයත් සියලුම බලතල ඉහත කී නිලධරයන්ට ඇති අතර ඔවුන් විසින් ඒ බලතල ක්‍රියාවේ යෙදීම ද කළ හැකිය.

56. අන්කිසි ලිඛිත නීතියක පටහැනි ව කුමක් සඳහන් ව ඇත ද -

(අ) මෙම ආඥාපනත යටතේ යම් සේවායෝජකයකුගෙන් යම් කම්කරුවකුට ලැබිය යුතු යම් මුදලක් අය කර ගැනීම සඳහා වූ නඩුවක් කම්කරු කොමසාරිස්වරයාගේ නමින් හෝ වෘත්තීය සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද්දා වූ ද ඒ කම්කරුවා සාමාජිකයකු වූ ද වෘත්තීය සමිතියක නමින් හෝ නිසි අධිකරණ බලය ඇති අධිකරණයක පැවරිය හැකි ය;

කම්කරුවකුට ලැබිය යුතු මුදලක් නඩුවක් මගින් අයකර ගැනීමට කම්කරු කොමසාරිස්වරයා හෝ ලියාපදිංචි කළ වෘත්තීය සමිතියක් සතු බලය. (1957 අංක 27, 19 වන වගන්තිය)

Labour Department of Sri Lanka

(ආ) මෙම ආඥාපනත යටතේ සේවායෝජකයෙකුගෙන් කම්කරුවන් දෙදෙනෙකුට හෝ ඊට වැඩි ගණනකට ලැබිය යුතු යම් මුදල් සඳහා කම්කරු කොමසාරිස්වරයාගේ නමින් හෝ වෘත්තීය සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද්දා වූ ද ඒ කම්කරුවන් සාමාජිකයන් වූ ද වෘත්තීය සමිතියක නමින් හෝ තනි නඩුවක් පැවරිය හැකි ය;

(ඇ) මේ ආඥාපනත යටතේ යම් සේවායෝජකයෙකුගෙන් යම් කම්කරුවකුට ලැබිය යුතු යම් මුදලක් අයකර ගැනීම සඳහා වූ නඩුවක්, ඒ මුදල ලැබිය යුතු වූ තැන් පටන් අවුරුදු හයක් ඇතුළත දී පවරනු ලැබුවහොත්, ඒ නඩුව පවත්වා ගෙන යා හැකි විය යුතු ය; (2019 අංක 14, 9 වන වගන්තිය)

(ඈ) කම්කරු කොමසාරිස්වරයාගේ නමින් පවරනු ලැබූ එවැනි යම් නඩුවක දී යම් නියෝජ්‍ය කම්කරු කොමසාරිවරයෙකුට හෝ සහකාර කම්කරු කොමසාරිවරයෙකුට හෝ යම් කම්කරු පරීක්ෂකයකුට හෝ ඔහු නියෝජනය කළ හැකි ය;

(ඉ) වෘත්තීය සමිතියක නමින් පවරනු ලැබූ එවැනි යම් නඩුවකදී ඒ සමිතියේ නිලධරයා අතුරෙන් කවරකු හෝ විසින් ඒ සමිතිය නියෝජනය කළ හැකිය.

පඩි මුදල්, කර්මාන්තයක වත්කමෙහි ප්‍රථම වැය බරක් විය යුතු බව.

57. කර්මාන්තයක සේවයෙහි නියුක්ත කම්කරුවකුට මේ ආඥාපනත යටතේ පඩි වශයෙන් ගෙවිය යුතු මුදල ගෙවීම පිළිබඳව එම කර්මාන්තයෙහි කම්කරුවන් සේවයෙහි යොදනු ලබන සේවායෝජකයාගේ ඇති බැඳීම, වෙනත් නීතියක කුමක් සඳහන්ව තිබුන ද ඒ කර්මාන්තයේ වත්කමෙහි ප්‍රථම වැය බරක් වන්නේ ය.

සේවය පිළිබඳ සහතිකය. (1957 අංක 27, 20 වන වගන්තිය)

57අ. පඩි පාලක සභාවක් පිහිටුවා ඇති යම් කර්මාන්තයක සේවයෙහි යොදනු ලැබූ යම් කම්කරුවකුගේ, පුහුණුවන්නකුගේ හෝ ආධුනිකයකුගේ හෝ සේවය අවසන් කරනු ලබන අවස්ථාවක දී, නියම කරනු ලැබිය හැකි විස්තර ඇතුළත් සහතිකයක් ඔහුගේ සේවායෝජකයා විසින් ඔහුට නිකුත් කළ යුතු ය.

## වැරදි

වැරදි

58. (අ) ඇතුල්වීමක දී හෝ පරීක්ෂණයක දී හෝ 55 වන වගන්තිය යටතේ බලතල ක්‍රියාවේ යෙදීමක දී නිලධරයකුට අවශ්‍ය වන පහසුකම් සලසා දීම පැහැර හරින්නා වූ ; හෝ

(ආ) යම් නිලධරයකු විසින් එම වගන්තිය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාවේ යෙදවීමේ දී බාධා කරන්නා වූ නැතහොත් ඒ බලතල ක්‍රියාවේ යෙදවීමේ දී හිරිහැර කරන්නා වූ ; හෝ

Labour Department of Sri Lanka

(ඇ) එම වගන්තියෙන් පැවරී ඇති බලතල යටතේ යම් නිලධරයකු විසින් තමා වෙත ඉදිරිපත් කරන ලෙස හෝ තමාට දෙන ලෙස හෝ නියම කරන ලද ලේඛන පොතක් හෝ පඩි වාර්තා පොතක් හෝ දැන්වීමක් හෝ තොරතුරක් ඉදිරිපත් කිරීම හෝ දීම ප්‍රමාණවත් හේතු නොමැතිව ප්‍රතික්ෂේප කරන්නා වූ නැතහොත් පැහැර හරින්නා වූ ; හෝ

(ඈ) 55 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අන් කිසි තැනැත්තෙකුගෙන් ප්‍රශ්න කිරීමේ දී නියමිත නිලධරයකු විසින් ඒ තැනැත්තාගෙන් අසනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම වළක්වන්නා වූ හෝ වැළැක්වීමට තැත් කරන්නා වූ ; හෝ

(ඉ) යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් සත්‍ය නොවන ලේඛන පොතක් හෝ පඩි වාර්තා පොතක් හෝ දැන්වීමක් හෝ සාදන්නා වූ නැතහොත් සෑදීමට සලස්වන්නා වූ නැතහොත් එම වගන්තියෙන් පැවරී ඇති බලතල යටතේ ක්‍රියා කරන නිලධරයකුට, අසත්‍ය බැව් දැන දැනම එබඳු ලේඛන පොතක් හෝ පඩි වාර්තා පොතක් හෝ දැන්වීමක් හෝ ඉදිරිපත් කරන්නා වූ නැතහොත් ඉදිරිපත් කිරීමට සලස්වන්නා වූ, එසේත් නැතහොත් දැනුවත්ව ඉදිරිපත් කිරීමට ඉඩ හරින්නා වූ ; හෝ

(ඊ) 54 වන වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් දෙන ලද විධානයක් පිළිපැදීමෙහි ලා පැහැර හැරීමක් කරන්නා වූ නැතහොත් එම වගන්තිය යටතේ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස නියම කළ කල්හි, දැනුවත්ව ම, අසත්‍ය වාර්තාවක් හෝ අසත්‍ය ප්‍රකාශයක් ඇතුළත් වාර්තාවක් සාදන්නා වූ හෝ ඉදිරිපත් කරන්නා වූ නැතහොත් සෑදීමට හෝ ඉදිරිපත් කිරීමට සලස්වන්නා වූ ; හෝ

(උ) දණ්ඩනයක්, විශේෂ කොට දක්වා නැති යම් කාරණයක් සම්බන්ධයෙන් මේ ආඥාපනතේ විධිවිධානයක් හෝ යම් නියෝගයක් හෝ කඩකරන්නා වූ,

සෑම තැනැත්තෙක් ම වරදක් කරන අතර, රුපියල් විසි දහසකට අඩු නොවන දඩයකට හෝ මාස දොළහක් නොඉක්මවන, කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේය. (2019 අංක 14, 10 වන වගන්තිය)

## විවිධ කරුණු

59. (1) මෙම ආඥාපනත යටතේ සේවායෝජකයා විසින් වගකිව යුතු වූ වරදක් ඇත්ත වශයෙන් ම සේවායෝජකයාගේ නියෝජිතයකු හෝ අන් තැනැත්තකු හෝ විසින් කරන ලද අවස්ථාවක එම නියෝජිතයා හෝ වෙනත් (සේවායෝජකයාගේ නියෝජිතයාගේ වගකීම.)



Labour Department of Sri Lanka

තැනැත්තා සේවායෝජකයා වූවාක් සේ සලකා එම වරද ගැන ඔහුට විරුද්ධ ව, සේවා යෝජකයා සමගම හෝ සේවායෝජකයා වරදකරු කිරීමට පෙර හෝ පසුව හෝ නඩු පවරනු ලැබීමට යටත් වන්නේ ය. වරදකරු කරනු ලැබූ පසු ඔහු ද සේවායෝජකයා යටත් වන දඬුවමට ම යටත් වන්නේ ය.

(2) මෙම ආඥාපනත යටතේ වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබූ සේවායෝජකයෙකු, මෙම ආඥාපනත ක්‍රියාවෙහි යෙදවීමට තමා නිසි අනලස්භාවයෙන් ක්‍රියා කළ බව ද, ඇත්ත වශයෙන් ම වරද කරන ලද්දේ තමාගේ නියෝජිතයා හෝ වෙන තැනැත්තකු හෝ විසින් තමා නොදැනුවත් ව නැතහොත් තමාගේ කැමැත්ත හෝ අපසහායකත්වය නොමැති ව බව ද අධිකරණය සෑහීමට පත් වන පරිදි ඔප්පු කළහොත් එම වරද සම්බන්ධයෙන් වන යම් දණ්ඩනයකින් ඔහු නිදහස් වන්නේ ය. එසේ වුව ද 44 වන වගන්තියේ (3) වන උපවගන්තිය හෝ 46 වන වගන්තියේ (1) වන උපවගන්තිය හෝ යටතේ පඩි වශයෙන් කම්කරුවාට ගෙවිය යුතු මුදලක් ගෙවන ලෙස ආඥා කිරීමට අධිකරණයට ඇති බලයට එයින් හානියක් නොවන්නේ ය.

යම් වෙළෙඳ හෝ වාණිජ අරමුණු ආකාරයෙන් කරනු ලබන වැඩපිළිවෙලක් යටතේ වැඩ කිරීම සඳහා තැනැත්තන් සේවයේ නියුක්ත කරවනු ලබන අවස්ථාවක දී අදාළවන විශේෂ විධිවිධාන

(2019 අංක 14, 11 වන වගන්තිය)

59අ. (1) යම් තැනැත්තකු විසින් එම තැනැත්තාගේ ව්‍යාපාරික කටයුතුවල යම් මූලික කොටසක් සඳහා වෙනත් තැනැත්තකු සමග යම් වෙළඳ හෝ වාණිජ කාර්යය සඳහා ප්‍රකාශිත හෝ ව්‍යංගික කොන්ත්‍රාත්තුවකට හෝ වැඩ පිළිවෙළකට ඇතුළත්වන අවස්ථාවක දී සහ එම කොන්ත්‍රාත්තුව හෝ වැඩ පිළිවෙලට අනුව එම තැනැත්තා විසින් සේවා නියුක්තිකයන් යොදවනු ලබන අවස්ථාවක දී, එම සේවා නියුක්ත කොන්ත්‍රාත්තුව හෝ වැඩපිළිවෙළ වසන් වූ සේවා නියුක්ත සම්බන්ධතාවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) නිසි පරීක්ෂණයකින් පසුව, එම කොන්ත්‍රාත්තුව හෝ සේවා වැඩපිළිවෙල ඇත්ත වශයෙන්ම වසන් වූ සේවා නියුක්ත සම්බන්ධතාවක් බවට කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක දී, ඔහු විසින් (1) වන උපවගන්තියේ සඳහන් පළමුව සඳහන් කළ තැනැත්තා වෙත එකී සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන් වූ එම කොන්ත්‍රාත්තුව හෝ වැඩපිළිවෙල යටතේ වැඩ ක්‍රියාත්මක කරවා ගැනීමෙන් වළකින ලෙස ලිඛිතව විධාන කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උප වගන්තිය යටතේ තමා සම්බන්ධයෙන් කරන ලද යම් විධානයක් මගින් අතෘප්තියට පත්වන යම් තැනැත්තෙකුට එම විධානය කිරීමේ දින සිට දින තිහක් ඇතුළත මෙම පණතේ 59ආ වගන්තිය යටතේ පිහිටුවන ලද සේවා නියුක්ත සම්බන්ධතා පිළිබඳ විශේෂ විනිශ්වයසභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අයිතියක් ඇත්තේ ය. සේවා නියුක්ත සම්බන්ධතා පිළිබඳ විශේෂ විනිශ්වය සභාව විසින් ඉන්පසු අදාළ සියලු පාර්ශ්වයන් කැඳවනු ලැබ කොමසාරිස්වරයාගේ විධානය තහවුරු කිරීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ තීරණයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

සේවා නියුක්ත සම්බන්ධතා පිළිබඳ විශේෂ විනිශ්වය සභාවක් පිහිටුවීම

59ආ. (1) 59අ වගන්තියේ (3) වන උප වගන්තිය ප්‍රකාරව යම් අතෘප්තියට පත් තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචන විභාග කිරීම සඳහා (මෙහි මින් මතු "විනිශ්වය සභාව" යනුවෙන් හඳුන්වනු ලබන) සේවා නියුක්ත සම්බන්ධතා පිළිබඳ විශේෂ විනිශ්වය සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය. (2019 අංක 14, 12 වන වගන්තිය)

Labour Department of Sri Lanka

(2) විනිශ්චය සභාව අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත විය යුතුය. එම සාමාජිකයන් තිදෙනා කම්කරු නීතිය පිළිබඳ පුළුල් දැනුමක් සහ පළපුරුද්දක් ඇති තිදෙනකු විය යුතු අතර, ඔවුන් අතරින් විනිශ්චය සභාවේ සභාපති විය යුතු තැනැත්තා ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවරයකු විය යුතු ය.

(3) විනිශ්චය සභාවේ සාමාජිකයකු වසර තුනක කාලයක් සඳහා ධූරය දැරිය යුතු අතර නැවත පත් කිරීම සඳහා සුදුසු විය යුතු ය.

(4) යම් සාමාජිකයකු විසින් තත්කාර්යය සඳහා අමාත්‍යවරයා අමතන ලද ලිපියක් මගින් ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබීමේදී එම ඉල්ලා අස්වීම බලාත්මක වන්නේ ය.

(5) ඉල්ලා අස්වීම, සේවයෙන් පහ කිරීම, මිය යෑම හෝ රෝගාතුර වීම නිසා ස්වකීය ධූරයේ කටයුතු කිරීමට නොහැකි වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරවීම හෝ වෙනත් යම් හේතුවක් නිසා යම් තැනැත්තකු විසින් ස්වකීය ධූරය හිස් කරනු ලබන අවස්ථාවකදී අමාත්‍යවරයා විසින් (2) වන උප වගන්තිය ප්‍රකාරව ඒ වෙනුවට වෙනත් තැනැත්තකු නම් කරනු ලැබිය හැකි අතර එම තැනැත්තා තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ඉතිරි ධූර කාලය සඳහා ධූරය දැරිය යුතු ය.

(6) තත්කාර්යය සඳහා හේතු දක්වා අමාත්‍යවරයා විසින් විනිශ්චය සභාවේ යම් සාමාජිකයකු ඉවත් කරනු ලැබිය හැකිය.

(7) විනිශ්චය සභාවේ වාර්තා පවත්වාගෙන යා යුතු සහ විනිශ්චය සභාවේ කාර්යය සම්බන්ධයෙන් විනිශ්චය සභාව සහ කොමසාරිස්වරයා විසින් පවරනු ලබන වෙනත් යම් කාර්යය සිදු කරනු ලැබිය යුතු කොමසාරිස්වරයා විසින් පත් කරනු ලබන විනිශ්චය සභා ලේකම්වරයකු සිටිය යුත්තේ ය.

(8) විනිශ්චය සභාවේ කාර්ය පහසු කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් කොමසාරිස්වරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(9) මුදල් විෂයභාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික විනිශ්චය සභාවේ සාමාජිකයන් වෙත ගෙවනු ලැබිය හැකි ය.

විනිශ්චය සභාවේ බලතල හා කර්තව්‍ය

59ඇ. (1) ස්වභාවික යුක්ති මූලධර්ම ප්‍රකාරව 59අ වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ විනිශ්චය සභාව වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචන පිළිබඳ විනිශ්චය සභාව විසින් විභාගකර නිශ්චය කරනු ලැබිය යුතු ය. තීරණයක් කරනු ලැබීමේ දී, සභාපතිවරයා විසින් වහාම එම තීරණය කොමසාරිස්වරයා සහ පාර්ශ්වයන් වෙත දැනුම්දිය යුතු ය. (2019 අංක 14, 12 වන වගන්තිය)

(2) විනිශ්චය සභාවේ තීරණයක් ලැබීමෙන් පසුව, කොමසාරිස්වරයා විසින් එම තීරණය ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

Labour Department of Sri Lanka

(3) එම තීරණය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට හෝ එහි සඳහන් යම් දිනයක සිට පාර්ශ්වයන් අතර බලාත්මක විය යුතුය.

නඩු පැවරීම සඳහා කොමසාරිස්වරයාට ඇති බලය

59ඇ. 59අ වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් කරනු ලබන යම් විධානයකට එකඟව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන හෝ 59ඇ වගන්තිය යටතේ විනිශ්චය සභාවේ යම් තීරණයක් උල්ලංඝනය කරමින් ක්‍රියා කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, කොමසාරිස්වරයා හෝ ඔහු විසින් යථා පරිදි ලිඛිතව බලය දෙන ලද යම් තැනැත්තකු විසින් එකී තැනැත්තාට එරෙහිව උචිත මහේස්ත්‍රාත් අධිකරණයක නඩු පවරනු ලැබිය හැකි ය. (2019 අංක 14, 12 වන වගන්තිය)

.

කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව මිස සහ වරද සිදු කිරීමෙන් අවුරුදු හයක් ඇතුළත මිස, නඩු පැවරිය නොහැකි බව.

60. මේ ආඥාපනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් -

(අ) කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව මිස, සහ

(ආ) වරද සිදු කිරීමෙන් අවුරුදු හයක් ඇතුළත මිස

කිසිම නඩුවක් යම් අධිකරණයක පවරනු නොලැබිය යුතුය.

වරද විභාග කළ යුතු අධිකරණය

61. මේ ආඥාපනත යටතේ වූ සියලු ම වැරදි මහේස්ත්‍රාත්වරයකු විසින් ලඝු කාර්ය පරිපාටිය අනුව විභාග කරනු ලැබිය යුතු ය.

මෙම ආඥාපනත යටතේ ඇතිවන අයිතිවාසිකම් හෝ වගකීම් ගිවිසුම්වලට යටත් නොවන බව.

62. මේ ආඥාපනතින් හෝ මේ ආඥාපනත යටතේ හෝ යම්කිසි කම්කරුවකුට ඇති අයිතිවාසිකමක් කෙරෙහි යම් ආකාරයකින් බලපාන හෝ නැතහොත් ඒ අයිතිවාසිකම ඔහුගේ අවාසියට යම් ආකාරයකින් වෙනස් කරන හෝ යම්කිසි සේවායෝජකයකු වෙත පැවරී තිබෙන වගකීමක් ඉවත් කරන නැතහොත් අඩු කරන හෝ මෙම ආඥාපනත ක්‍රියාත්මක වූ දිනයට පෙරාතුව වුව ද පසුව වුව ද ඇති කර ගන්නා ලද යම් ගිවිසුමක් හෝ එකඟ වීමක්, එවැනි අයිතිවාසිකමක් කෙරෙහි බලපාන නැතහොත් එවැනි අයිතිවාසිකමක් වෙනස් කරන තාක් දුරට හෝ එවැනි යම් වගකීමක් ඉවත් කරන නැතහොත් අඩු කරන තාක් දුරට ශුන්‍ය හා බලරහිත වන්නේ ය.

## නියෝග

නියෝග

63. (1) මේ ආඥාපනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාවෙහි යෙදවීමේ හා බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය.

(2) විශේෂයෙන් හා (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතල වල ව්‍යාප්තියට හානියක් නොමැතිව, අමාත්‍යවරයා විසින්, පහත සඳහන් කරුණු සියල්ලම හෝ ඉන් යමක් සඳහා හෝ සම්බන්ධයෙන් නියෝග සෑදිය හැකිය -

(අ) නියම කරනු ලැබිය යුතු යයි මේ ආඥාපනතෙහි සඳහන් හෝ නියමිත සියලු කරුණු;

(ආ) මේ ආඥාපනතේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි සියලු ආකෘති පත්‍ර;

Labour Department of Sri Lanka

(ඇ) මේ ආඥාපනත යටතේ වූ යම් කරුණක් හැකිතාක් දුරට, එය බලපාන තැනැත්තන්ට දැන ගැනීමට සැලැස්වීම පිණිස ඒ කරුණ සම්බන්ධයෙන් කළ යුතු දැන්වීම;

(ඈ) පඩිපාලක සහා සාමාජිකයන්ට පාරිශ්‍රමික හෝ දීමනා ගෙවීම සහ ඒ පාරිශ්‍රමික හෝ දීමනා ගණන් බැලිය යුතු ආකාරය;

(ඉ) මේ ආඥාපනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහි යොදවනු ලැබ සිටින නිලධරයන්ට දීමනා ගෙවීම සහ ඒ දීමනා ගණන් බැලිය යුතු ආකාරය; සහ

(ඊ) යම් කර්මාන්තයක ජීවන තත්ත්වය සහ සේවා තත්ත්වය පිලිබඳව කොමසාරිස්වරයා විසින් හෝ ඔහුගේ විධානය යටතේ හෝ විමර්ශනය කිරීම.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, අනුමත කරන ලෙස ඉල්ලන යෝජනාවක් මගින් උත්තර මන්ත්‍රී මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. අමාත්‍යවරයා විසින් සාදන ලද කිසි නියෝගයක් උත්තර මන්ත්‍රී මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරන තෙක්, බල නොපවත්වන්නේ ය. එසේ අනුමත කරනු ලැබූ බවට නිවේදනයක් ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කළ යුතුය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගයක් උත්තර මන්ත්‍රී මණ්ඩලය විසින් සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ, එසේ අනුමත කරනු ලැබූ බවට නිවේදනයක් ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ කල්හි, එය මෙහි ලා පනවන ලද්දක් මෙන් වලංගු හා බලසහිත වන්නේ ය.

## අර්ථ නිරූපණය

අර්ථ නිරූපණය

64. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ආඥාපනතෙහි -

" සහකාර කම්කරු කොමසාරිස් " යන්නෙන් තත්කාලයෙහි සහකාර කම්කරු කොමසාරිස් වරයකු වශයෙන් ධූරය දරන තැනැත්තෙක් අදහස් වේ.

(1957 අංක 27, 22 වන වගන්තිය)

" කොමසාරිස් " යන්නෙන් තත්කාලයෙහි කම්කරු කොමසාරිස් ධූරය දරන තැනැත්තා අදහස් වන අතර මේ ආඥාපනත යටතේ කොමසාරිස්වරයාගේ යම් විශේෂ බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් සම්බන්ධයෙන් 53 වන වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් බලය පවරනු ලැබූ තැනැත්තෙක් ද ඊට ඇතුළත් වේ.

" නියෝජ්‍ය කොමසාරිස් " යන්නෙන් තත්කාලයෙහි නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයකු වශයෙන් ධූරය දරන තැනැත්තෙක් අදහස් වේ.

"සේවායෝජකයා" යන්නෙන්, තමන් සඳහා යම් කර්මාන්තයක යම් කම්කරුවකු යොදවන තැනැත්තෙක් ද යම් තැනැත්තකු සඳහා වෙනත්

Labour Department of Sri Lanka

තැනැත්තකු විසින් යම් කම්කරුවකු යම් කර්මාන්තයක යොදවනු ලැබේ ද ඒ පළමු කී තැනැත්තා ද අදහස් වන අතර, යම් කර්මාන්තයක, යම් කම්කරුවකු වෙනත් තැනැත්තකු සඳහා යොදවන තැනැත්තෙක් ද ඊට ඇතුළත් වේ.

''අතිකාල'' යන්නෙන් වැඩ කරන සාමාන්‍ය දවසක් හෝ වැඩ කරන සාමාන්‍ය සතියක් සමන්විත වන පැය ගණන හෝ ඉක්මවා වැඩ කරන කාලය අදහස් වේ.

''නියමිත'' යන්නෙන් නියෝග මගින් නියමිත බව අදහස් වේ.

''නියෝග'' යන්නෙන් මේ ආඥාපනත යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගයක් අදහස් වේ.

''නියෝජිත සාමාජික'' යන්නෙන් අදාළ වන පරිදි යම් කර්මාන්තයක සේවායෝජකයන් හෝ කම්කරුවන් හෝ නියෝජනය කිරීම පිණිස පඩි පාලක සභාවකට පත්කරන සාමාජිකයින් අදහස් වේ.

''කර්මාන්තය'' යන්නට යම් සේවායෝජකයකු විසින් හෝ කම්කරුවකු විසින් හෝ කරගෙන යන, ඉටු කරන හෝ යම් සේවායෝජකයෙකු හෝ කම්කරුවකු යෙදී සිටින යම් කර්මාන්තයක්, ව්‍යාපාරයක්, කාර්යභාරයක්, රක්ෂාවක්, වෘත්තියක් හෝ නියුක්තියක් ද කර්මාන්තයක යම් ශාඛාවක්, කාර්යයක් හෝ යම් ක්‍රියාවලියක් ද ඇතුළත් වන නමුත් ප්‍රධාන වශයෙන් බාලාපරාධකරුවන්ට හෝ අනාථයන්ට හෝ අසරණ, ගොළු, බිහිරි හෝ අන්ධ තැනැත්තන්ට කාර්මික පුහුණුවක් දීම සඳහා පැවැත්වෙන යම් කර්මාන්තයක්, ව්‍යාපාරයක් හෝ කාර්යභාරයක් ඇතුළත් නොවේ.

''පඩි'' යන්නට අතිකාල වැඩ සඳහා හෝ නිවාඩු දිනයක් සඳහා හෝ ගෙවිය යුතු යම් පාරිශ්‍රමිකයක් ඇතුළත් වේ.

''පඩි කාලය'' යන්නෙන් කම්කරුවකුට මේ ආඥාපනත යටතේ පඩි ගෙවිය යුත්තේ යම් කාල සීමාවක් සඳහා ද ඒ කාල සීමාව අදහස් වේ. (1957 අංක 27, 22 වන වගන්තිය)

''කම්කරුවා'' යන්නෙන් යම්කිසි කර්මාන්තයක යම් වැඩක් කිරීම සඳහා යොදවනු ලබන තැනැත්තෙක් අදහස් වේ.

## ආඥාපනතේ බලපෑම්

වෙනත් ලිඛිත නීතියක් සමග ගැටෙන අවස්ථාවන්හි මෙම ආඥාපනත බලපැවැත්විය යුතු බව.

65. මේ ආඥාපනතෙහි අන්‍යාකාර ප්‍රකාශිත විධිවිධාන සලසා ඇති අවස්ථාවන්හි හැර, මේ ආඥාපනත හැර වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් ව තිබුණ ද මේ ආඥාපනතේ විධිවිධාන බල පවත්වන්නේ ය; තවද මේ ආඥාපනතේ සහ ඒ වෙනස් වෙනත් නීතියේ විධිවිධාන අතර යම් ගැටුමක් හෝ අනුකූලතාවක් ඇති වුවහොත් මේ ආඥාපනතේ විධිවිධාන බලපවත්වන්නේ ය.

Labour Department of Sri Lanka

# පඩි පාලක සහා ආඥාපනත

කම්කරු ඇමතිවරයා විසින් (136 වැනි අධිකාරය වන) පඩි පාලක සභා ආඥාපනතේ 63 වන වගන්තිය යටතේ සම්පාදනය කරනු ලැබ, එම වගන්තිය යටතේ උත්තර මන්ත්‍රී මණ්ඩලය සහ මහජන මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ නියෝග.

ඇම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන
කම්කරු ඇමති

1971 මැයි මස 28 දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මෙම නියෝග 1971 පඩි පාලක සභා නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) ආඥාපනතේ 2 වන වගන්තියට අනුකූලව කම්කරුවකුගේ පඩියෙන් පහත සඳහන් කරුණු අරභයා සේවායෝජකයා විසින් මුදල් අඩුකර ගත යුතු ය :-

(අ) සේවායෝජකයා විසින් කම්කරුවාට සපයනු ලැබූ කිසියම් ආහාර ද්‍රව්‍යයක මිළ; මේ මිළ, කිසියම් නීතියක් යටතේ මේ ද්‍රව්‍යය සඳහා නියමිත වූද, තත්කාලයට බලපවත්වන්නා වූද උපරිම මිළක් වෙතොත්, ඊට වැඩි නොවිය යුතු ය.

(ආ) (i) කොමසාරිස්වරයා විසින් ලිඛිතව අනුමත කරනු ලැබූ කිසියම් විශ්‍රාම වැටුප් අරමුදලක්, අර්ථසාධක අරමුදලක්, රක්ෂණ ක්‍රමයක්, ඉතිරි කිරීමේ ක්‍රමයක් හෝ වෛද්‍ය හෝ සෞඛ්‍යාධාර සඳහා ක්‍රමයක්, නැතහොත් එවැනි අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් වෙත කම්කරුවා තම සේවායෝජකයා මගින් ගෙවීමට අදහස් කරන කිසියම් දායක මුදලක් වෙතොත් එය;

(ii) කොමසාරිස්වරයා විසින් ලිඛිතව අනුමත කරනු ලැබූ කිසියම් සුභසාධක ක්‍රමයක්, වෘත්තීය සමිතියක් හෝ පූජනීය ස්ථාන අරමුදලක් වෙත කම්කරුවා තම සේවායෝජකයා මගින් ගෙවීමට අදහස් කරන කිසියම් දායක මුදලක් හෝ සම්මාදම් මුදලක් වෙතොත් එය;

Labour Department of Sri Lanka

(ඇ) සේවා යෝජකයා විසින් කම්කරුවාට සලසනු ලැබූ යම්කිසි නිවාස පහසුකමක් වෙතොත් එහි කුලිය; එම කුලිය -

(i) ඒ නිවාසය පිහිටි ප්‍රදේශයේ පළාත් පාලන ආයතනය විසින් එහි බදු වටිනාකම තක්සේරු කොට තිබේ නම් එසේ තක්සේරු කළ බදු වටිනාකමට වැඩි නොවිය යුතු ය. තවද;

(ii) එසේ තක්සේරුකොට නොමැති නම්, එවැනි නිවාසයක් වෙනුවෙන් දරනු ලැබූ මූලධන වියදමෙන් වර්ෂයකට සියයකට හයකට වැඩි නොවිය යුතු ය.

(ඈ) කම්කරුවා විසින් ඇප මුදලක් වශයෙන් තැබිය යුතු මුදල් ප්‍රමාණය; මේ සඳහා අඩුකරන මුදල් ප්‍රමාණය; පඩියෙන් කොමසාරිස්වරයා විසින් නිශ්චය කරන යම් ප්‍රතිශතයකට වැඩි නොවිය යුතුවාක් මෙන්ම එසේ ම නියම කරන වෙනත් යම් කොන්දේසිවලට ද යටත් විය යුතු ය;

(ඉ) මෙහි උපලේඛනයේ (අ) ලැයිස්තුවේ දැක්වෙන්නා වූ ද කම්කරුවා සඳහා සේවායෝජක විසින් සපයනු ලබන්නා වූ ද යම් සේවාවක් වෙනුවෙන් වූ ගාස්තුවක් වශයෙන් කොමසාරිස්වරයා විසින්, ලිඛිතව අනුමත කරන ලද මුදල් ප්‍රමාණයක්;

(ඊ) කම්කරුවාගේ සේවා ස්ථානයේ විකිණීමට තබා ඇති භාණ්ඩ අතුරෙන් සේවායෝජක විසින් කම්කරුවාට විකුණන ලද යම් භාණ්ඩවල මිල; ඒ ස්ථානය කොමසාරිස්වරයා විසින් ලිඛිත අනුමැතිය දෙන ලද සාප්පුවක් හෝ වෙනත් ආයතනයක් විය යුතු අතර, ඒ මිල, තත්කාලයේ යම් නීතියක් යටතේ ඒ භාණ්ඩය සඳහා නියම කර ඇති උපරිම මිලක් වෙතොත් ඒ මිලට වැඩි නොවිය යුතුය;

(උ) කම්කරුවා මෙම ඡේදයේ (ආ) අනුච්ඡේදයේ සඳහන් කිසියම් අරමුදලකින් හෝ ක්‍රමයකින් ගත් ණය මුදලක් හෝ සේවා යෝජකයා විසින් කම්කරුවාගේ පඩි කාලසීමාව වෙනුවෙන් ගෙවිය යුතු පඩියෙන් කම්කරුවා හට ගෙවන ලද අත්තිකාරමක් නොවන වෙනත් මුදල් අත්තිකාරමක් ;

(ඌ) මෙම ඡේදයේ (උ) අනුඡේදයෙහි සඳහන් වූ කිසියම් ණය මුදලක් හෝ අත්තිකාරමක් වෙනුවෙන් අය කරගත යුතු කිසියම් පොලියක්, එසේ වුවද,

(i) මෙම ඡේදයේ (උ) අනුඡේදයේ සඳහන් ණය මුදලක් සම්බන්ධයෙන්, අයකරන පොලිය කොමසාරිස්වරයා විසින් ලිඛිතව අනුමත කරන ලද පරිදි වූ වාර්ෂික පොලී මුදල් ප්‍රමාණයක් නොඉක්මවිය යුතුය.

Labour Department of Sri Lanka

(ii) සේවායෝජක විසින් කම්කරුවාට දෙන ලද, අත්තිකාරම් මුදලක් සම්බන්ධයෙන් වන විට, පොලියක් අය කළ යුත්තේ, අත්තිකාරම් වශයෙන් දෙන ලද මුදල් ප්‍රමාණය, පවත්නා පඩි කාලසීමාව සඳහා පඩි වශයෙන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණයට අඩු නොවන්නේ නම් සහ එසේ අය කරන පොලී ප්‍රමාණය, එසේ අත්තිකාරම් වශයෙන් දෙන ලද මුදල් ප්‍රමාණයෙන් සියයට හයක් නොඉක්මවන්නේ නම් පමණකි.

(එ) මෙහි උපලේඛනයේ "ආ" ලැයිස්තුවෙහි දැක්වෙන කිසියම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් වෙනුවෙන් සේවායෝජකයා විසින් කම්කරුවාට පැන වූ කිසියම් දඩයක්, එසේ වුවද එක් වතාවක දී දඩ මුදල් සම්බන්ධයෙන් කරන ලද අඩු කිරීම් වල මුළු මුදල ඒ දඩ මුදල නියම කරනු ලැබූ කාලය ඇතුළත කම්කරුවා විසින් උපයනු ලැබූ පඩියෙන් සියයට පහකට වැඩි නොවිය යුතු ය. එසේ ද වුවත් දඩය සියයට පහක් ඉක්මවන අවස්ථාවක සේවායෝජකයා විසින් කම්කරු කොමසාරිස්වරයාගේ අවසරය ලබාගත යුතු ය.

(2) මේ නියෝගයේ (1) වන ඡේදයේ (එ) අනුඡේදය යටතේ අඩුකර ගැනීමට අවසර දෙන ලද සෑම මුදලක් ම, එසේ අඩුකර ගන්නා මුදල් ප්‍රමාණය, කොමසාරිස්වරයා විසින් ලිඛිතව අනුමත කරනු ලබන්නා වූ ද කම්කරුවාගේ යහපත පිණිස වන්නා වූ ද කාර්ය සඳහා සේවායෝජක විසින් යොදවනු ලැබිය යුතු ය, යන කොන්දේසියට යටත් වන්නේ ය.

3. ඒ වන විට සපයා නොමැති පඩි අත්තිකාරමක් සමන්විත වන යම් මුදලක් කම්කරුවකුගේ පඩියෙන් අයකර ගැනීම, හය මාසයකට අඩු නොවන කාලසීමාවක් මුළුල්ලේ විහිදී ඇති සමාන වාරික මගින් සිදුකළ යුතු ය.

4. කම්කරුවකුට, ඔහුගේ සේවායෝජක විසින් ගෙවන ලද, අදාළ පඩි කාලසීමාව සඳහා ඒ කම්කරුවාට ගෙවිය යුතු පඩියෙන් ගෙවන අත්තිකාරම් මුදලක් වන, මුදල් අත්තිකාරමක් වෙනුවෙන් අඩු කර ගැනීමක් කිරීමෙන් පසු, වෙනත් යම් අඩු කිරීම් වේ නම්, ඒවා මේ නියෝගවල 2 වන නියෝගයේ (1) වන ඡේදයේ දැක්වෙන ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව අඩුකර ගත යුතු ය.

5. ආඥාපනතේ 52 වන වගන්තිය යටතේ පත්කරන ලද පහත සඳහන් නිලධාරීන් එහි 3(2) වගන්තියේ කාර්යය සඳහා නියමිත බලධරයන් විය යුතු ය :-

නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයා,
ජ්‍යෙෂ්ඨ සහකාර කම්කරු කොමසාරිස්වරයා,
සහකාර කම්කරු කොමසාරිස්වරයා,
කම්කරු වෛද්‍ය නිලධාරී,
කම්කරු සංඛ්‍යාලේඛනඥ,
පඩිපාලක සභා ලේකම් (හෝ එක් එක් සමලේකම්),
පඩිපාලක සභා උප ලේකම්,

Labour Department of Sri Lanka

කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු සංඛ්‍යාලේඛන නිලධාරීහු,
කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරීහු,
කොළඹ වරාය කොමිෂන් සභාවේ සභාපති,
කම්කරු කළමණාකරු, කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ වරාය කොමිෂන් සභාවේ 1 වෙනි ශ්‍රේණිගත කම්කරු නිලධාරීහු.

6. (1) සේවායෝජකයන්ගේ හෝ කම්කරුවන්ගේ යම් වෘත්තීය සමිතියක්, සංගමයක් හෝ වෙනත් සංවිධානයක් වෙනුවෙන් පඩි පාලක සභාවකට නියෝජිත සාමාජිකයන් පත් කිරීමට ඇති විට, ඒ වෘත්තීය සමිතිය, සංගමය හෝ වෙනත් සංවිධානය ඒ සාමාජිකයන් ලෙස පත් කිරීමට අපේක්ෂා කරන තැනැත්තන්ගේ නම් ලැයිස්තුවක් අදාළ ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් දිනයේ දී හෝ ඊට පෙර සපයන ලෙස ඒ සාමාජිකයන් පත් කිරීමට ඇති දිනයට ප්‍රථමයෙන් යම් යුක්ති සහගත කාලයකට කලින් ඒ වෘත්තීය සමිතියෙන්, සංගමයෙන් හෝ සංවිධානයෙන් කොමසාරිස්වරයා විසින් ලිඛිත ඉල්ලීමක් කළ හැකිය.

(2) පඩි පාලක සභාවේ නියෝජිත සාමාජිකයන් වශයෙන් පත් කරන තැනැත්තන්, මේ නියෝගයේ (1) වන ඡේදය යටතේ කොමසාරිස්වරයා වෙත සපයනු ලැබ තිබිය හැකි ලැයිස්තුවක් හෝ ලැයිස්තු ඇත්නම්, ඒ සාමාජිකයන් වශයෙන් පත් කරනු ලැබීම සඳහා ඒ ලැයිස්තුවක හෝ ලැයිස්තුවල යෝජනා කර ඇති තැනැත්තන් අතුරෙන්, අමාත්‍යවරයා විසින් තෝරා ගනු ලැබිය යුතුය. එවැනි සාමාජිකයන්ගෙන් නියෝජනය විය යුතු සේවායෝජකයන්ගේ හෝ කම්කරුවන්ගේ හෝ වෘත්තීය සමිතියක් හෝ සංගමයක් හෝ වෙනත් සංවිධානයක් හෝ නොමැති අවස්ථාවක නැතහොත් එසේ සපයනු ලැබූ එවැනි ලැයිස්තුවක් නොමැති අවස්ථාවක, එවැනි සාමාජිකයන් වශයෙන් පත් කරනු ලැබීමට යෝග්‍ය අය ලෙස අමාත්‍යවරයා සලකන තැනැත්තන් අතුරෙන් අමාත්‍යවරයා විසින් ඒ තැනැත්තන් තෝරා ගත යුතු ය.

7. (1) පඩි පාලක සභාවේ සෑම රැස්වීමක් ම, කොමසාරිස්වරයාගේ යම් සාමාන්‍ය හෝ විශේෂ නියමයන්ට යටත් ව, එම පඩි පාලක සභාවේ ලේකම්වරයා විසින් පඩි පාලක සභාවේ එක් එක් සාමාජිකයාට තැපැල් මගින් යවන ලිඛිත දැන්වීමක් මගින් කැඳවිය යුතු ය.

(2) පඩි පාලක සභාවේ එක් එක් සාමාජිකයාට පඩි පාලක සභාවේ සෑම සාමාන්‍ය රැස්වීමක් ගැනම දින දහහතරකට නොඅඩු කාලයකට පළමු දැනුම් දිය යුතු ය.

(3) පඩි පාලක සභාවේ සාමාන්‍ය රැස්වීමකදී ඉදිරිපත් කරන සෑම යෝජනාවක් ගැනම එම රැස්වීම පවත්වන දිනයට දින හතකට නොඅඩු කාලයක් කලින් එම යෝජනාව ඉදිරිපත් කරන සාමාජිකයා විසින් පඩි පාලක සභාවේ

Labour Department of Sri Lanka

ලේකම්වරයා වෙත ලියවිල්ලකින් දැනුම්දිය යුතු ය; ලේකම්වරයා විසින් එම යෝජනාව එම රැස්වීමේ න්‍යාය පත්‍රයේ ඇතුළත් කොට, එම රැස්වීමේ දිනයට ප්‍රථමයෙන් පඩි පාලක සභාවේ සෑම සාමාජිකයෙකුට ම එම යෝජනාවේ පිටපතක් යැවිය යුතු ය.

(4) කොමසාරිස්වරයා සුදුසු යයි සලකන ඕනෑම විටෙක දී හෝ විශේෂ සභා රැස්වීමක් කැඳවිය යුත්තේ කුමන කාර්යයක් සඳහා ද යන්න නිශ්චිතව සඳහන් කරමින් පඩි පාලක සභාවේ සාමාජිකයන් දෙදෙනෙකුට නොඅඩු සාමාජිකයන් සංඛ්‍යාවක් විසින් ලේකම්වරයා වෙත ලිඛිත ඉල්ලීම් ඉදිරිපත් කළ විටෙක දී හෝ ලේකම්වරයා විසින් එසේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය.

(5) පඩි පාලක සභාවේ එක් එක් සාමාජිකයාට පඩි පාලක සභාවේ සෑම විශේෂ රැස්වීමක් ගැනම දින හතකට නොඅඩු කාලයකට කලින් දැනුම් දිය යුතුය.

(6) සෑම පඩිපාලක සභා රැස්වීමක ම සියළුම කටයුතු සභාවේ ලේකම්වරයා විසින් පොතක වාර්තාගත කළ යුතු ය.

(7) පඩි පාලක සභාවේ යෝජනා සම්මතයෙන් හෝ එහි සභාපතිවරයා විසින් හෝ පඩිපාලක සභාවේ කවර හෝ රැස්වීමක් අඩාලව කල් දැමිය හැකි ය.

8. (1) කිසියම් සාමාජිකයකු මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම යන කරුණු නිසා පඩි පාලක සභාවේ සාමාජිකත්වයෙහි ඇතිවන සෑම පුරප්පාඩුවක් ම එම සාමාජිකයා පත්කළ ආකාරයෙන් ම පිරවිය යුතු ය.

(2) පඩි පාලක සභාවේ සාමාජිකයකු වන තැනැත්තකු අමාත්‍යවරයාට හෝ කොමසාරිස්වරයාට දැනුම් නොදී, දිවයිනෙන් බැහැරව ගිය විට, එසේ ඒ සාමාජිකයා දිවයිනෙන් බැහැරව සිටින කාලයේ දීර්ඝත්වය අමාත්‍යවරයාගේ මතය අනුව එම පඩි පාලක සභාවේ කාර්යයන්ට හානිකර වේ නම්, එසේ දිවයිනෙන් බැහැරව ගිය සාමාජිකයකු වෙනුවට වෙනත් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් පත් කළ හැකිය. එවිට මුලින් කී තැනැත්තා පඩි පාලක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස් වූ සේ සැලකිය යුතු ය.

9. සෑම පඩි පාලක සභාවක් ම, එම පඩි පාලක සභාව පිහිටුවා ඇත්තේ යම් කර්මාන්තයක් වෙනුවෙන් ද, එම කර්මාන්තයේ සේවා යෝජකයන්ගේ හෝ කම්කරුවන්ගේ කිසියම් වෘත්තීය සමිතියක්, සංගමයක් හෝ සංවිධානයක් ඇති විට, ආඥාපනතේ 22, 23, 24, 25 හෝ 27 යන වගන්ති යටතේ එම පඩි පාලක සභාව විසින් තීරණයකට එළඹෙනු ලැබීමට බලය ලැබී ඇත්තේ යම් කරුණු ගැනද එකී යම් කරුණක් ගැන තීරණයකට එළඹීමට ප්‍රථමයෙන් එවැනි වෘත්තීය සමිති සංගම්වල හෝ සංවිධානවල අදහස් විමසිය යුතු ය.

10. (1) ආඥාපනත යටතේ සහ මේ නියෝග යටතේ යම් පඩි පාලක සභාවක් සතු යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කිරීම සඳහා යම් පඩි පාලක සභාවක් හෝ යම් දිස්ත්‍රික්ක පඩි පාලක කාරක සභාවක සෑම සාමාජිකයකුටම, පහත සඳහන් කාර්යය සඳහා බලය ඇති බවට ඒ පඩි පාලක සභාව හෝ කාරක



Labour Department of Sri Lanka

සභාව විසින් යෝජනාවක් සම්මත කර ගත් විට, ඒ සභාව හෝ කාරක සභාව විසින් තීරණය කර ගත් දිනයක සහ වේලාවක -

(අ) යම් තැනැත්තකු විසින් යම් කර්මාන්තයක් පවත්වාගෙන යන ස්ථානයකට, රාත්‍රී කාලයේ හෝ දවල් කාලයේ ඇතුළු වී පරීක්ෂා කිරීමට;

(ආ) යම් කර්මාන්තයක ජීවන තත්ත්වය සහ වැඩවලට අදාළ කොන්දේසි හා සම්බන්ධව යම් තැනැත්තකු දන්නා යම් තොරතුරක් සපයන ලෙස, ඒ තැනැත්තාගෙන් ඉල්ලා සිටීමට; සහ

(ඇ) එවැනි තොරතුරක් නිවැරදිතාව දැන ගැනීමේ අරමුණින්, ඒ ස්ථානයක සිට හමු වූ යම් තැනැත්තකුගෙන් විභාග කිරීමට හෝ ප්‍රශ්න කිරීමට

බලය ඇති අතර, එවැනි සාමාජිකයකුට ඒ ස්ථානයකට ඇතුළු වී එය පරීක්ෂා කිරීමට ඉඩ දීමද එවැනි සාමාජිකයකුට අවශ්‍ය විය හැකි යම් සහාය ලබාදීම සහ පහසුකම් සැපයීම ද (අ) ඡේදයේ සඳහන් යම් ස්ථානයක් තත්කාලයෙහි භාරව සිටින සෑම තැනැත්තකුගේ ම යුතුකම වන්නේ ය; තවද ඒ සාමාජිකයකු විසින් ඉල්ලා සිටින තොරතුර සැපයීම (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් සෑම තැනැත්තකුගේ ම යුතුකම වන්නේය.

(2) මේ නියෝගය යටතේ තම කාර්යය හෝ කර්තව්‍යය කිරීමේදී හෝ ඉටු කිරීමේදී යම් නිෂ්පාදනයක් පිළිබඳ රහසක් හෝ වාණිජමය රහසක් පිළිබඳ දැනුමක් හෝ තොරතුරක් දැනගන්නට ලැබෙන හෝ ලබා ගන්නා පඩි පාලක කාරක සභාවක හෝ දිස්ත්‍රික්ක පඩි පාලක සභාවක කිසි සාමාජිකයකු විසින්, ඒ සභාවේ හෝ කාරක සභාවේ ඔහුගේ සාමාජිකත්වය පවත්නා අතරතුර හෝ ඔහු ඒ සභාවේ හෝ කාරක සභාවේ සාමාජිකත්වය දැරීම නතර වූ පසුව හෝ, ඒ රහස එය අදාළ වනුයේ යම් කර්මාන්තයකට ද ඒ කර්මාන්තය කර ගෙන යන තැනැත්තාගේ ලිඛිත කැමැත්ත ලබා නොගෙන, වෙනත් යම් තැනැත්තෙකුට හෙළදරව් කිරීම හෝ දැන්වීම හෝ නොකළ යුතු ය.

11. යම් කර්මාන්තයක් සඳහා පිහිටුවන ලද පඩි පාලක සභාවක් එම කර්මාන්තය සඳහා ලංකාවේ යම් දිස්ත්‍රික්කයක හෝ ප්‍රදේශයක දිස්ත්‍රික්ක පඩිපාලක කාරක සභාවක් පිහිටුවීමට අදහස් කරතහොත් එම පඩි පාලක සභාව -

(අ) එම ප්‍රදේශය හෝ දිස්ත්‍රික්කය;

(ආ) දිස්ත්‍රික්ක පඩි පාලක කාරක සභාවේ දී ඒ පඩි පාලක සභාව නියෝජනය කරන ඒ පඩිපාලක සභාවේ සාමාජික සංඛ්‍යාව; සහ

(ඇ) එවැනි ප්‍රදේශයක හෝ දිස්ත්‍රික්කයක පිළිවෙලින් සේවායෝජකයන් හා කම්කරුවන් නියෝජනය කරන දිස්ත්‍රික්ක පඩි පාලක කාරක සභාවේ සාමාජික සංඛ්‍යාව;

පිළිබඳ ලිඛිත තොරතුරු අමාත්‍යවරයාට සැපයිය යුතු ය.

Labour Department of Sri Lanka

12. දිස්ත්‍රික්ක පඩි පාලක කාරක සභාවේ අවස්ථාවෝචිත පරිදි සේවායෝජකයන් හෝ කම්කරුවන් නියෝජනය කරනු ලබන සාමාජිකයන් අමාත්‍යවරයා විසින් පත් කළ යුතු ය.

13. දිස්ත්‍රික්ක පඩි පාලක කාරක සභාවක් පිහිටුවා ඇත්තේ යම් ප්‍රදේශයක් හෝ දිස්ත්රික්කයක් වෙනුවෙන් ද ඒ දිස්ත්‍රික්කයේ හෝ ප්‍රදේශයේ සේවයෝජකයන් හෝ කම්කරුවන් නියෝජනය කිරීම පිණිස, පඩි පාලක සභාවක් විසින්, ඒ පඩි පාලක සභාව පිහිටුවනු ලැබ ඇත්තේ යම් කර්මාන්තයක් වෙනුවෙන් ද ඒ කර්මාන්තයේ සේවායෝජකයකු හෝ කම්කරුවකු නොවූව ද යම් තැනැත්තකු දිස්ත්‍රික්ක පඩි පාලක කාරක සභාවට පත් කරනු ලැබිය හැකි ය.

එසේ වුව ද ඒ තැනැත්තාගෙන් නියෝජනය වන යම් වෘත්තීය සමිතියක්, සංගමයක් හෝ වෙනත් සංවිධානයක් වෙතොත්, අවස්ථාවෝචිත පරිදි ඒ වෘත්තීය සමිතිය, සංගමය හෝ සංවිධානය විසින් ඒ සෑම තැනැත්තකුම අනුමත කරනු ලැබිය යුතු ය.

14. ආඥාපනතේ, 18(2) වගන්තියේ (අ) හෝ (ආ) ඡේදය යටතේ දිස්ත්‍රික්ක පඩි පාලක කාරක සභාවට පත් කරන සෑම සාමාජිකයෙකු ම පත් කළ දින සිට දෙවර්ෂයක කාලසීමාවක් එම ධූරය දරන්නේ ය.

එසේ වුව ද, එබඳු සාමාජිකයකු විසින් -

(අ) එවැනි කාරක සභාවක සාමාජිකත්වයෙන් ඕනෑම වේලාවක ඉල්ලා අස්විය හැකිය. නැතහොත් අමාත්‍යවරයා විසින් එම සාමාජිකත්වයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(ආ) කිසියම් සාමාජිකයකුගේ මරණය, ඉල්ලා අස්වීම හෝ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම නිසා ඇති වූ පුරප්පාඩුවක් පිරවීමට තමා පත්කරනු ලැබ ඇත්නම් එසේ මියගිය, ඉල්ලා අස් වූ හෝ සාමාජිකත්වයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයාගේ ඉතිරිව ඇති ධූර කාලයකට සමාන කාල සීමාවක් තුළ තම ධූරය දැරිය යුතු ය.

(ඇ) නිල කාලය අවසන් වූ පසු, අනුප්‍රාප්තිකයකු පත් කැරෙන තුරු, තම ධූරය තවදුරටත් දැරිය යුතු ය.

15. ආඥාපනතේ 18(2) වන වගන්තියේ (අ) හෝ (ආ) ඡේද යටතේ පඩි පාලක කාරක සභාවකට පත් කරනු ලැබූ සෑම සාමාජිකයෙකු ම, යුක්ති සහගත හේතුවක් නොමැතිව ඒ කාරක සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණියහොත්, ඔහු ඒ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වූ සේ සැලකිය යුතු අතර, එසේ එවැනි සාමාජිකයෙකුගේ ඉල්ලා අස්වීම, ඒ රැස්වීම්වලින් අවසාන රැස්වීමේ දින සිට බලාත්මක වන ලෙස සැලකිය යුතු ය.

16. දිස්ත්‍රික්ක පඩි පාලක කාරක සභාවක සාමාජිකත්වය අවසන් වූ යම් තැනැත්තකුට එයට කලින් පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

17. කිසියම් සාමාජිකයෙකුගේ මරණයෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් දිස්ත්‍රික්ක පඩි පාලක කාරක සභාවක සාමාජිකත්වයෙහි ඇති වන සෑම පුරප්පාඩුවක් ම, එම සාමාජිකයා පත් කළ ආකාරයෙන් ම පිරවිය යුතු ය.

Labour Department of Sri Lanka

18. දිස්ත්‍රික්ක පඩි පාලක කාරක සභාවක කුමන රැස්වීමක හෝ ගණපූරණය එවැනි කාරක සභාවක සම්පූර්ණ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නො අඩු සංඛ්‍යාවක් විය යුතු ය.

එසේ වුව ද, දිස්ත්‍රික්ක පඩි පාලක කාරක සභාවේ කිසියම් රැස්වීමක් ගණපූරණයක් නොමැතිවීමේ හේතුවෙන් කිසියම් දිනකට කල් තැබූ විට, එසේ කල් තබන ලද්දේ යම් දිනකට ද එදින ද පැමිණ සිටියේ ගණපූරණයට අඩු සාමාජික සංඛ්‍යාවක් නම්, එසේ පැමිණි සාමාජික සංඛ්‍යාවෙන් සමන්විත වූ රැස්වීම ඒ කාරක සභාවෙහි වලංගු රැස්වීමක් විය යුතු ය.

19. දිස්ත්‍රික්ක පඩි පාලක කාරක සභාවක සෑම රැස්වීමක ම සභාපතිවරයාට එම රැස්වීම ඉදිරියේ තබන ලද කුමන ප්‍රශ්නයක් සම්බන්ධයෙන් හෝ ඡන්දය දීමට බලයක් නොමැති විය යුතු ය.

20. (1) දිස්ත්‍රික් පඩි පාලක කාරක සභාවක යම්කිසි රැස්වීමක් පැවැත්වීම සඳහා පැමිණ සිටින සාමාජික සංඛ්‍යාවෙන් සේවායෝජකයන් වෙනුවෙන් පෙනී සිටින සාමාජික සංඛ්‍යාව, කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටින සාමජික සංඛ්‍යාවට වඩා වැඩි නම් නැතහොත් අඩු නම්, ඒ රැස්වීමේ දී ඡන්දය දීමට හිමිකම් ඇති සේවායෝජක නියෝජිත සාමාජික සංඛ්‍යාව සහ කම්කරු නියෝජිත සාමාජික සංඛ්‍යාව එක සමාන වනු පිණිස, එකී රැස්වීමෙහි වැඩි සාමාජික සංඛ්‍යාවක් සිටින්නේ සේවායෝජකයන් නියෝජනය කිරීමට නම් නැතහොත් කම්කරුවන් නියෝජනය කිරීමට නම්, එසේ බහුතරයක් ම සිටින සාමාජිකයන් විසින්, රැස්වීම ආරම්භ වීමට ප්‍රථම තමන් අතුරෙන් ඡන්දය දීමෙන් වැළකී සිටින සාමාජිකයා හෝ සාමාජිකයන් හෝ තෝරා ගත යුතු ය.

එසේ වුව ද බහුතර නියෝජිත සාමාජිකයන්ට ඔවුනතුරෙන් ඡන්දය දීමෙන් වැළකිය යුත්තේ කවර සාමාජිකයා ද යන්න ගැන එකඟවීමට නුපුළුවන් වූ අවස්ථාවක සභාපතිවරයා ඉදිරිපිට, ඔහුගේ විධානය පරිදි කුසපත් ඇද, එකී රැස්වීමෙහි දී ඡන්දය දීමෙන් වැළකී සිටිය යුතු සාමාජිකයා හෝ සාමාජිකයන් තෝරා ගත යුතු ය.

(2) දිස්ත්‍රික් පඩි පාලක කාරක සභාවක යම්කිසි රැස්වීමක දී ඡන්දය දීමෙන් වැළකී සිටීමට (1) වන උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර තෝරා ගනු ලැබූ දිස්ත්‍රික් පඩි පාලක කාරක සභාවක නියෝජිත සාමාජිකයෙකුට ඒ රැස්වීමේ දී ඡන්දය දීමට හිමිකම නොමැති නමුත් එකී රැස්වීමෙහි සිටීමට සහ එකී සාකච්ඡාවලට සහභාගී වීමට හිමිකම ඇත්තේය.

එසේ වුව ද, එකී රැස්වීම පවත්වාගෙන යන අතර යම්කිසි අවස්ථාවක දී සාමාජිකයන් වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් සේවායෝජකයන් වෙනුවෙන් පෙනී සිටින සාමාජික සංඛ්‍යාව කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටින සාමාජික සංඛ්‍යාවට සමාන වී නම්, ඉහත කී නියෝජිත සාමාජිකයාට ඡන්දය දීමට හිමිකම ඇත්තේ ය.

(3) මේ ආඥාපනත යටතේ දිස්ත්‍රික් පඩි පාලක කාරක සභාවක් විසින් කරනු ලැබීමට බලය ඇති හෝ නියමිත සෑම තීරණයක් ම, එකී සභාවක රැස්වීමක දී පැමිණ සිටින හා ඡන්දය දීමට හිමිකම් ඇති සාමාජිකයන්ගේ බහුතර කැමැත්ත පරිදි විය යුතු ය. හුදෙක් ක්‍රියා විධිවල විධි විරෝධතාවක් නිසා හෝ එහි වරදක්

නිසා හෝ තීරණයක් කිරීමට පළමුව කළ යුතු යයි මේ ආඥාපනතින් නියමිත යම් කිසිවක් නොකිරීම නිසා හෝ පමණක් දිස්ත්‍රික් පඩි පාලක කාරක සභාවක කිසිම තීරණයක් බල රහිත නොවන්නේ ය.

21. පඩි පාලක සභාවක් විසින් පඩි පාලක කාරක සභාවක් වෙත යොමු කරනු ලැබූ කිසියම් කරුණක් ගැන එම කාරක සභාව විසින් සපයන වාර්තාව එම කරුණ සලකා බැලූ කාරක සභා රැස්වීමේ සභාපතිවරයා විසින් අත්සන් කර, ඒ පඩි පාලක සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

22. පඩි පාලක සභාවක හෝ පඩි පාලක කාරක සභාවක හෝ සාමාජිකයකු වන කිසියම් කම්කරුවකුගේ සේවායෝජකයකු විසින් එම පඩි පාලක සභාවේ හෝ පඩි පාලක කාරක සභාවේ යම් රැස්වීමකට එම කම්කරුවා සහභාගී විය යුතු සෑම දිනයකම සහ එවැනි පඩි පාලක සභාවක හෝ කාරක සභාවක සාමාජිකයකු වශයෙන් කිසියම් කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කිරීම අවශ්‍යව ඇති සෑම දිනයකම එම කම්කරුවාට නිවාඩු දිය යුතු ය.

23. (1) ආඥාපනතේ 39(1) වන වගන්තිය යටතේ දෙනු ලැබූ සෑම අවසර පත්‍රයක් ම පහත සඳහන් කොන්දේසිවලට යටත්විය යුතු ය :-

(අ) එම අවසර පත්‍රය දෙනුයේ යම් කම්කරුවකුට ද, එම කම්කරුවාට, අවසර පත්‍රයේ නියමිත ප්‍රමාණයට වඩා අඩු වාසි සහිත නොවිය යුතු ගෙවීම් ප්‍රමාණයක් අනුව, සේවායෝජක විසින් පඩි ගෙවිය යුතු ය.

(ආ) අවසර පත්‍රය, ආඥාපනතේ 39(3) වන වගන්තිය යටතේ අවලංගු නොකළහොත්, ඒ අවසර පත්‍රයේ නියමිත කාලසීමාව තුළ වලංගු විය යුතු ය.

(2) ආඥාපනතේ 39(3) වන වගන්තිය යටතේ සේවායෝජකයාට යවන සෑම දැන්වීමක් ම, මෙහි උපලේඛනයෙහි දැක්වෙන 1 වන ආකෘති පත්‍රයෙහි විය යුතු ය. තවද, එම දැන්වීම් ලියාපදිංචි කළ තැපෑලෙන් සේවායෝජකයා වෙත යැවිය යුතු ය.

24. (1) සෑම සේවායෝජකයෙක් ම, ආඥාපනතේ 41 වන වගන්තිය යටතේ තැබිය යුතු ලේඛනයේ හෝ ලේඛනවල ඒ වගන්තියේ නියමිත විස්තර වලට අමතරව තමා සේවයෙහි යොදවන එක් එක් කම්කරුවාට ගෙවූ පඩි අනු ප්‍රමාණය ද එම කම්කරුවා ඉපයූ දළ පඩිය ද ඒ දළ පඩියෙන් අඩුකළ මුදල් ද දැක්විය යුතු ය.

(2) 5 වන නියෝගයෙහි සඳහන් එක් එක් නිලධරයා, ආඥාපනතේ 41(2) වගන්තියේ කාර්යයන් සඳහා නියමිත නිලධාරියකු විය යුතුය.

25. පඩි පාලක සභාව පිහිටුවා ඇත්තේ යම් කර්මාන්තයක් වෙනුවෙන් ද එවැනි කර්මාන්තයක සේවයේ යොදවනු ලබන යම් කම්කරුවකුගේ සේවායෝජකයකු විසින් ආඥාපනතේ 42 වන වගන්තිය යටතේ ප්‍රදර්ශනය කළ යුතු දැන්වීම -

Labour Department of Sri Lanka

(අ) මෙහි උපලේඛනයෙහි දැක්වෙන ii වන ආකෘති පත්‍රයට සාරානුකූල විය යුතු ය;

(ආ) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් විය යුතු ය;

(ඇ) එම කර්මාන්තය සම්බන්ධයෙන් බලාත්මකව පවත්නා ඒ පඩි පාලක සභාවේ තීරණවලට අතිරේකව, ඒ කර්මාන්තයෙහි ඒ සේවායෝජකයා විසින් සේවයේ නියුක්ත කර ඇති එක් එක් කම්කරුවාගේ පඩියෙන් මුදල් අඩු කර ගැනීමට අවසර දී ඇත්තේ කවර කාරණා සඳහා ද යන වග ද මේ නියෝගවල 2 වන නියෝගය යටතේ ආහාර ද්‍රව්‍යයක් සඳහා පඩියෙන් මුදල් අඩුකර ගන්නේ නම් ඒ යම් ආහාර ද්‍රව්‍යයක මිළ ද එහි දැක්විය යුතු ය ;

(ඈ) එම කර්මාන්තය පවත්වාගෙන යන්නේ යම් ස්ථානයක ද, එහි කිසියම් ප්‍රකට තැනක, ප්‍රදර්ශනය කරවිය යුතු ය.

26. ආඥාපනතේ 46(i) වන වගන්තිය යටතේ වන සෑම දැන්වීමක්ම, මෙහි උපලේඛනයෙහි iii වන ආකෘති පත්‍රයෙහි විය යුතු ය.

27. කොමසාරිස්වරයා ද 5 වන නියෝගයෙහි සඳහන් එක් එක් නිලධරයා ද, මෙම ආඥාපනතේ 55(1) වන වගන්තියේ කාර්යයන් සඳහා නියමිත නිලධරයකු විය යුතුය.

28. (1) මෙම ආඥාපනතේ හෝ මෙම නියෝගවල අන්‍යාකාරව නිශ්චිත විධිවිධාන සලසා ඇති අවස්ථාවන්හි හැර, සේවායෝජකයකු හෝ වෙනත් තැනැත්තකු වෙත, ආඥාපනත යටතේ නිකුත් කරන කිසියම් දැන්වීමක්, විධානයක් හෝ අභියාචනයක් භාරදීම එය අතින් ගෙන ගොස් භාරදීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ එසේ නැතහොත්, දැන්වීම, විධානය හෝ අභියාචනය ඔහුගේ වාසස්ථානය ලෙස අවසන් වශයෙන් දන්නා ස්ථානයට පිවිසෙන දොරටුවෙහි, ඇලවීමෙන් සිදු කළ යුතුය.

(2) එවැනි දැන්වීමක්, විධානයක් හෝ අභියාචනයක් ලියාපදිංචි කළ තැපෑලෙන් භාරදෙන විටකදී, වර්ෂ 1934 මෙරට තැපැල් ව්‍යවස්ථාවල 67 වන ව්‍යවස්ථාව යටතේ නිකුත් කළ භාරදීමේ නිවේදනය, එවැනි දැන්වීමක්, විධානයක් හෝ අභියාචනයක් භාර දුන් බවට ප්‍රමාණවත් සාක්ෂි විය යුතු ය.

29. මෙම ආඥාපනතේ හෝ මෙම නියෝගවල හෝ අන්‍යාකාරව නිශ්චිත විධිවිධාන සලසා ඇති අවස්ථාවක හැර යම් කර්මාන්තයක කම්කරුවන් සේවයේ යොදවන හෝ යෙදවූ සේවායෝජකයකු වෙත හෝ වෙනත් තැනැත්තකු වෙත ආඥාපනත යටතේ නිකුත් කරන සෑම දැන්වීමක්, විධානයක් හෝ අභියාචනයක් ම පහත සඳහන් පරිදි භාරදිය හැකි ය :-

(අ) සේවායෝජකයෙකුට හෝ වෙනත් තැනැත්තෙකුට අතින් ම ගෙන ගොස්, භාරදීමෙන්; හෝ

(ආ) සේවායෝජකයා හෝ වෙනත් තැනැත්තා සංස්ථාවක් වන විටකදී, එහි ලේකම්වරයාට හෝ, එවැනි නිලධරයකු හෝ අධ්‍යක්ෂවරයකු

Labour Department of Sri Lanka

වෙත හෝ එම සංස්ථාවේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය භාරව සිටින තැනැත්තා වෙත භාරදීමෙන්; සහ

(ඇ) සේවායෝජකයා හෝ වෙනත් තැනැත්තා සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් වන විටදී එවැනි මණ්ඩලයක සභාපති, ලේකම් හෝ එවැනි නිලධරයකු වෙත භාරදීමෙන්.

30. සෑම පඩි පාලක සභාවක සහ සෑම පඩිපාලක කාරක සභාවක සියළුම සාමාජිකයන්ගේ නම්, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි ද, එක් සිංහල ප්‍රවෘත්ති පත්‍රයක, එක් දෙමළ ප්‍රවෘත්ති පත්‍රයක සහ එක් ඉංග්‍රීසි ප්‍රවෘත්ති පත්‍රයක ද පළ කළ යුතු ය.

31. (අ) පඩි පාලක සභාවක සෑම නියෝජිත සාමාජිකයෙකුටම, එවැනි සාමාජිකයෙකු එවැනි පඩි පාලක සභා රැස්වීමකට සහභාගී වන සෑම දිනයක් වෙනුවෙන් රුපියල් හැත්තෑවක යැපීම් දීමනාවක්, පාර්ලිමේන්තුවේ දී සම්මත කරන අරමුදල් වලින් කොමසාරිස්වරයා විසින් ගෙවිය යුතු ය; 1989.02.01 දින අංක 543/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය.

(ආ) රාජ්‍ය නිලධරයකු නොවන පඩි පාලක සභාවේ සෑම පත්කළ සාමාජිකයෙකුට ම, එවැනි සාමාජිකයෙකු එවැනි පඩිපාලක සභාවක රැස්වීමකට සහභාගි වන සෑම දිනයක් වෙනුවෙන් රුපියල් දෙසීයක යැපීම් දීමනාවක්, පාර්ලිමේන්තුවේ දී සම්මත කරන අරමුදල් වලින් කොමසාරිස්වරයා විසින් ගෙවිය යුතු ය; 1989.02.01 දින අංක 543/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය.

(ඇ) රාජ්‍ය නිලධරයකු නොවන පඩි පාලක සභාවක සෑම නියෝජිත සාමාජිකයෙකුට ම හෝ පත් කළ සාමාජිකයෙකුටම ඔහු තම රාජකාරිය ඉටු කිරීමේ දී කරන ගමන් බිමන් වලට, ඒ සඳහා පාර්ලිමේන්තුවෙන් සම්මත කළ අරමුදල් වලින් ගමන් වියදම් දීමනාවක් කොමසාරිස්වරයා විසින් ගෙවිය යුතු ය. එම ගමන් වියදම් දීමනාව පහත සඳහන් විධිවිධාන අනුව ගණන් බැලිය යුතුය:-

(i) යුක්ති සහගත ලෙස දුම්රියෙන් ගිය හැකි කිසියම් ගමනක් හෝ ගමනක කිසියම් කොටසක් වෙනුවෙන්, පළමුවෙනි පන්තියේ දුම්රිය ගාස්තුවට වැඩි නොවන ගමන් වියදම් දීමනාවක්;

(ii) පෞද්ගලික හෝ කුලියට ගත් වාහනයකින් ගිය කිසියම් ගමනක් හෝ ගමනක කොටසක් වෙනුවෙන්, එවැනි ගමනක් යුක්ති සහගත ලෙස දුම්රියෙන් ගිය නොහැකි නම්, රාජ්‍ය නිලධාරීන්ට ගෙවනු ලබන ගමන් වියදම් දීමනාවට සමාන ගමන් වියදම් දීමනාවක්;

(iii) බස් රථයකින් හෝ වෙනත් ප්‍රසිද්ධ වාහනයකින් යන කිසියම් ගමනක් වෙනුවෙන් ගාස්තු වශයෙන් ඇත්ත

Labour Department of Sri Lanka

වශයෙන් ගෙවූ මුදල් ප්‍රමාණයට සමාන ගමන් වියදම් දීමනාවක්;

එසේ වුවද, පඩි පාලක සභාවේ නියෝජිත සාමාජිකයෙකු හෝ පත්කළ සාමාජිකයෙකු අනුක්‍රම දිනවල එක් පඩි පාලක සභා රැස්වීමකට හෝ ඊට වැඩි සභා වාර ගණනකට සහභාගි වූ විට, එම සාමාජිකයා සභාවට එන ප්‍රථම ගමන ද, සභාවෙන් ඉවත්ව යන අවසාන ගමන ද සඳහා පමණක් ඉහත විධිවිධාන අනුව ගමන් වියදම් දීමනාවක් දිය යුතුය;

එසේ වුවද, එසේ පඩි පාලක සභා රැස්වීම පැවැත්වෙන ස්ථානයේ සිට සැතපුම් පහළොවකට නොවැඩි දුර ප්‍රමාණයක් ඇතුළත ස්ථානයක සිට පැමිණෙන කිසියම් සාමාජිකයෙකුට ඉහත දැක් වූ විශේෂ දීමනාව අදාළ නොවිය යුතු ය.

(ඇ) රාජ්‍ය නිලධරයකු වන පත් කළ සාමාජිකයකුට තම රාජකාරිය ඉටුකිරීම සම්බන්ධයෙන් ඔහුට අදාළ කරවිය හැකි මුදල් රෙගුලාසිවල විධිවිධාන අනුව ගමන් වියදම් දීමනාවක් ද, යැපීම් වියදම් දීමනාවක් ද හිමි විය යුතු ය.

32. කිසියම් කර්මාන්තයකට අදාළ ජීවන තත්ත්වය සහ වැඩ කොන්දේසි විමර්ශනය කිරීමේ කාර්යය සඳහා කොමසාරිස්වරයා හෝ 5 වන නියෝගයේ සඳහන් යම් නිලධරයකු විසින් -

(අ) ඒ කර්මාන්තය කිසියම් තැනැත්තකු විසින් පවත්වාගෙන යන යම් ස්ථානයකට ඇතුළු වී පරීක්ෂා කිරීම ද,

(ආ) ඒ තත්ත්වයන්ට හා කොන්දේසිවලට අදාළ තොරතුරු ඇතුළත් වන්නා වූ ද එම තැනැත්තා විසින් තබන ලද්දා වූද යම් ලේඛනයක්, වාර්තාවක් හෝ ඉන් යම් කොටසක් පරීක්ෂා කිරීම සහ ඒ සම්පූර්ණ ලේඛනයක හෝ වාර්තාවක හෝ ඉන් යම් කොටසක හෝ පිටපත් ගැනීම ද,

(ඇ) ඒ තැනැත්තා දන්නා එවැනි යම් තොරතුරු වෙතොත් ඒවා සපයන ලෙස ඒ තැනැත්තාගෙන් ඉල්ලා සිටීම ද කළ හැකිය. තවද ඒ තැනැත්තා විසින් කොමසාරිස්වරයාට හෝ එකී නිලධරයාට හෝ එම ස්ථානයට ඇතුළු වී එය පරීක්ෂා කිරීමට හා එවැනි යම් ලේඛනයක් හෝ වාර්තාවක් හෝ ඉන් යම් කොටසක් හෝ පරීක්ෂා කිරීමට සහ සම්පූර්ණ ලේඛනයක, වාර්තාවක හෝ ඉන් යම් කොටසක පිටපත් ගැනීමට ඉඩ දිය යුතු අතර එකී තොරතුරු ද සැපයිය යුතුය.

Labour Department of Sri Lanka

33. අංක 9,209 හා 1943.12.03 වැනි දින දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, වරින්වර සංශෝධනය කරනු ලැබුවා වූ වර්ෂ 1943 පඩි පාලක සභා නියෝග ද, අංක 9,162 සහ 1943 අගෝස්තු මස 27 වැනි දින දරණ ගැසට් පත්‍රයේ පළකරනු ලැබුවා වූ නියෝගය ද මෙයින් අවලංගු කරනු ලැබේ.

34. (1) මෙම නියෝගවල -

"කොමසාරිස්වරයා" සහ "නියෝජිත සාමාජිකයා" යන යෙදුම්වල ආඥාපනතෙහි ඒවාට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වෙයි.

"ආඥාපනත" යන්නෙන් (136 වන අධිකාරය වන) පඩි පාලක සභා ආඥාපනත අදහස් වේ.

(2) මෙම නියෝගවල කාර්ය සඳහා පඩි පාලක සභාවක් සම්බන්ධයෙන් "ලේකම්" යන්නට පඩි පාලක සභාවේ එක් එක් සම ලේකම්වරයා ද, සහකාර ලේකම්වරයා ද ඇතුළත් විය යුතු ය.

Labour Department of Sri Lanka

# උපලේඛනය

## "අ" දරන ලැයිස්තුව

කරණවැමියකුගේ,
ඇඳුම් පිරිසිදු කරන්නකුගේ සේවය.

## "ආ" දරන ලැයිස්තුව

මාසික පඩි ලබන්නන් වූ විට, යුක්ති සහගත හේතුවක් නොමැතිව, වැඩට නොපැමිණීම,

යුක්ති සහගත හේතුවක් නොමැතිව පමාවී වැඩට පැමිණීම.

සේවායෝජකයාට අයත් භාණ්ඩ හෝ ද්‍රව්‍යවලට හානි සිදු කිරීම, හෝ ඒවා නැති කිරීම, ඒ හානිය හෝ නැති කිරීම කම්කරුවාගේ නොසැලකිල්ලට, හිතුවක්කාරකමට හෝ වැඩ පැහැර හැරීමට එක එල්ලේ ම ආරෝපණය කළ හැකි අවස්ථාවක,

වැඩ කිරීමේදී නොසැලකිල්ල හෝ අනුදොහ්ගයෙන් වැඩ කිරීම, රාජකාර්ය වේලාවේ නිදා ගැනීම.

කම්කරුවාට ඔහුගේ වැඩ සම්බන්ධයෙන් දෙනු ලැබූ කිසියම් නීත්‍යානුකූල නියෝගයක් ඕනෑකමින්ම පිළිනොපැදීම.

සේවා යෝජකයාට අයත් භාණ්ඩ හා ද්‍රව්‍ය සොරකම් කිරීම.

සේවා යෝජකයාගේ ව්‍යාපාරය හා සම්බන්ධයෙන් වංචා කිරීම හෝ වංක කම.

වැඩ කරන කාලය තුළ බීමත්කම.

ඕනෑකමින්ම අණට අකීකරුවීම හා ඕනෑකමින්ම විනය කඩ කිරීම.

ව්‍යාපාරික කටයුතු සඳහා සේවායෝජකයාගේ ව්‍යාපාරික ස්ථානයට එන මහජනයාට අවිනීත වීම හෝ අපහසුකම් ඇති කිරීම.

සාවද්‍ය හෝ නොමග යවන සුළු ප්‍රකාශ කිරීම.

බොරු ලෙඩ ගැනීම.

සේවායෝජකයාගේ ව්‍යාපාරික ස්ථානයේ සවිකර තිබෙන ආරක්ෂෝපක්‍රමවලට අවහිර කිරීම.

සේවායෝජකයාගේ ව්‍යාපාරික ස්ථානය භාරව සිටින තැනැත්තාගේ පූර්ව අවසරය නොලැබ එම ස්ථානය තුළ පත්‍රිකා හෝ දැන්වීම්, ප්‍රදර්ශනය කිරීම හෝ බෙදා හැරීම.

සේවායෝජකයාගේ ව්‍යාපාරික ස්ථානය පිරිසිඳුව තබා ගැනීම සම්බන්ධයෙන් දෙන ලද උපදෙස්වලට පටහැනිව ක්‍රියා කිරීම.

තහනම් ප්‍රදේශයක දුම්බීම.

Labour Department of Sri Lanka

## I වන ආකෘති පත්‍රය

**( 23 (2) වන නියෝගය)**

**(136 වැනි අධිකාරය වන) පඩි පාලක සභා ආඥාපනතේ 39(3) වන වගන්තිය යටතේ නිවේදනය**

ඔබ විසින් සේවයෙහි යොදවනු ලැබූ කම්කරුවකු වන ........................... ........................................................................... හට (136 වැනි අධිකාරය වන) පඩි පාලක සභා ආඥාපනතේ 39(1) වන වගන්තිය යටතේ දෙනු ලැබූ අවසර පත්‍රය ......................................................... වන මං විසින් එම ආඥාපනතේ 39(3) වන වගන්තිය අනුව ................... ................... දින සිට බල පැවැත්වෙන සේ අවලංගු කරන බැව්............................................................ ...................................................................... වන ඔබට මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන ...............................................

දිනය .........................

..........................................................

අවලංගු කිරීම සිදුකරන නිලධාරියාගේ තනතුර

## II වන ආකෘති පත්‍රය

**(25 වන රෙගුලාසිය)**

**(136 වැනි අධිකාරය වන) පඩි පාලක සභා ආඥාපනතේ 42 වන වගන්තිය යටතේ නිවේදනය**

| එවැනි පඩි පාලක සභාවක් විසින් එළඹෙනු ලැබ ක්‍රියාත්මක වන තීරණ | අඩුකිරීම් | සේවායෝජකයා විසින් කම්කරුවන්ට විකුණනු ලැබූ ආහාර ද්‍රව්‍යවල මිල |
|---|---|---|
| | | |

Labour Department of Sri Lanka

**III වන ආකෘති පත්‍රය**

**(26 වන නියෝගය)**

**(136 වැනි අධිකාරය වන) පඩි පාලක සභා ආඥාපනතේ 46(1) වන වගන්තිය යටතේ නිවේදනය**

.......................................................................... (නම සහ තනතුර ) වන මම (136 වැනි අධිකාරය වන) පඩි පාලක සභා ආඥාපනතේ 4(1)/44(1)/44(2) යන වගන්තිය යටතේ ඔබට විරුද්ධව ................................................................ ............................................................ අධිකරණයේ පවරා ඇති නඩු විභාගයේ දී මෙහි උපලේඛනයෙහි 1 වන තීරුවෙන් දැක්වෙන්නා වූ ද, එම උපලේඛනයෙහි 11 වන තීරුවෙහි ඊට අනුරූප සටහන් පරිදි, නියමිත වශයෙන් දැක්වෙන කාලසීමාව වෙනුවෙන් ඔබ විසින් සේවයෙහි යොදවනු ලද්දා වූ ද, කම්කරුවන්ට එම ආඥාපනතේ ............................ වන වගන්තියේ විධිවිධාන අනුව පඩි ගෙවීම ඔබ විසින් පැහැර හැරීම ගැන සාක්ෂි ඉදිරිපත් කිරීමට අදහස් කරන බැව්, පඩි පාලක සභා ආඥාපනතේ 46(1) වන වගන්තිය ප්‍රකාර ........................................... ............................................ වන ඔබට මෙයින් දැනුම් දෙමි.

....................................

අත්සන හා තනතුර

Labour Department of Sri Lanka

**උපලේඛනය**

| **1 වන තීරුව** | **11 වන තීරුව** |
|---|---|
| කම්කරුවාගේ නම | පඩි නොගෙවූයේ කුමන කාලසීමාවක් වෙනුවෙන් ද යන වග |

අදාළ නොවන දෑ කපා හරින්න.